

# ජාතික යොවුන් වැඩසටහන මානවක බාලදක්ෂ අංශය 2023



ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය

**SRI LANKA SCOUT ASSOCIATION**
**NATIONAL YOUTH PROGRAMME**
**ROVER SCOUT SECTION**

**Advisors:**
Mr. Janaprith Fernando, *Chief Commissioner*
Major General Milinda Pieris, *Former Chief Commissioner*
Mr. Sarath Mataraarachchi, *National Programme Commissioner*

**National Rover Programme Publication Committee:**
*M/s:*
***Chairman:*** Srilath de Silva, *Assistant Chief Commissioner (Rovers)*
***Secretary:*** Dr. Asanka Eriyawa, *Headquarters Commissioner*
***Co-Secretary:*** Saliya Dahanayake, *Assistant District Commissioner*

Dr. Manjula Sahabandu, *Assistant Chief Commissioner*
E.K. Dilum Duminda, *Special Commissioner*
Samantha Abeythunga, *Headquarters Commissioner*
Mrs. Priyadarshani Jayakody, *Headquarters Commissioner*
D. Prashanth, *Assistant Headquarters Commissioner*
S. Amalraj, *Assistant Headquarters Commissioner*
Sashika Munasighe, *Assistant Headquarters Commissioner*
Supun Jayalath, *Assistant District Commissioner*
N. Thisenthira, *IT Volunteer*

**Published by**
**Sri Lanka Scout Association**
*65/9, Sir Chittampalam Gardiner Mawatha,*
*Colombo-2, Sri Lanka*
*Telephone/Fax: +94 11 2 433 131*
*Web: **www.scout.lk***

© ***Copy Rights Reserved***
***2023***

**පෙරවදන....**

ලොව පුරා මානවක කටයුතු ආරම්භ වී 105 වසරක් සපිරෙන මෙම වසරේදී, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් මානවක බාලදක්ෂයින් සඳහා වූ 'ජාතික යොවුන් වැඩ සැලැස්ම' නව මුහුණුවරකින් ප්‍රකාශයට පත් කිරීමට පියවර ගෙන ඇත.

1918 දි මහා බ්‍රිතාන්‍යයේ දී යෞවන-යෞවනියන් සඳහා ආරම්භ වූ මානවක කටයුතු, වැඩි කල් නොගොස් ලෝකයේ අතිකුත් රටවල බාලදක්ෂ සංවිධාන වෙත ව්‍යාප්ත විය. බාලදක්ෂ ව්‍යාපාරයේ පිතෘක නිර්මාතෘ බේඩින් පවල් සාමි තුමා මානවක කටයුතු හඳුන්වා දෙමින් එය '*එලිමහන් ජීවිතයේ හා සේවයේ සහෝදරත්වය*' ලෙසත්, මානවකයින් යනු '*අනාගතය සඳහා සුදානමක් හා මනා පුහුණුවක් ලබන්නන්*' ලෙසත්, අර්ථ නිරූපණය කරන ලදි.

1907 දී ආරම්භ වූ ලෝක බාලදක්ෂ සංවිධානයේ නිත්‍ය සාමාජිකත්වය 1912 දී ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය ට හිමි වූ අතර නිත්‍ය සාමාජිකත්වය ලත් මුල්ම සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකාව ගෞරවාදරයට පාත්‍ර විය. 1957 දී, එය ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පණතකින් සම්මත වූ ජාතික ස්වෙච්ඡා සංවිධානයක් බවට පත් විය. ශ්‍රී ලංකාවේ මානවක කටයුතු 1920දී ආරම්භ වූ අතර මේ වන විට එය යෞවන යෞවනියන් අතර ව්‍යාප්ත වී ඇත. මානවක කටයුතු වල වර්ධනය සඳහා මෙම නව මානවක වැඩ සැලැස්ම මහෝපකාරී වනු නො අනුමානය.

මෙම නව වැඩ සටහන තුළින් මානවකයින්ගේ පුද්ගල සංවර්ධනය, නායකත්වය, පෞරුෂත්වය, ආකල්ප, තාක්ෂණ දැනුම වැනි ගුණාංග වර්ධනය මෙන්ම ප්‍රායෝගික ක්‍රියාකාරකම් රැසක්ද ක්‍රියාත්මක කෙරේ. එමෙන්ම ඔවුන් ජාත්‍යන්තර තලයට ප්‍රවිෂ්ඨ වීම සඳහා ජාත්‍යාන්තර පදක්කම් රැසක්ද හඳුනවා දී ඇත.

ශ්‍රී ලංකාවේ මානවක සමාජ බොහෝමයක් දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වේ. ඊට අමතරව ප්‍රජා මූලික (විවෘත) මානවක සමාජ මෙන්ම පාසල් හා විවිධ ආයතන තුළ මානවක සමාජ ක්‍රියාත්මක වේ. ජාතික විශ්ව විද්‍යාල තුළද මේ වනවිට මානවක කටයුතු ප්‍රචලිත වෙමින්, පවතී.

මානවක කටයුතු හා ක්‍රියාකාරකම්, වයස අවු 18-26 දක්වා වූ යෞවන යෞවනියන් සඳහා ක්‍රියාත්මක වේ. මීට පෙර බාලදක්ෂ කටයුතු කළ-නොකළ සැමට මානවක කටයුතු විවෘතව ඇත. මානවක සාමජයක මානවකයින්ට ස්වාධිනව වැඩ කටයුතු කිරීමට අවස්ථාව සලසා ඇති අතර මානවක බාලදක්ෂ නායකයෙකුගේ අධීක්ෂණය යටතේ එය ක්‍රියාත්මක වේ.

අවසාන වශයෙන්, නව මානවක වැඩ සැලැස්ම මෙසේ එළි දැක්වීමට සහාය දුන් සැමට අපගේ හෘදයාංගම ස්තුතිය පිරි නැමේ.

***ප්‍රකාශන කමිටුව, ජාතික මානවක වැඩ සැලැස්ම***

# පටුන

**බාලදක්ෂ ව්‍යාපාරය**


1. අභිප්‍රාය ප්‍රකාශය
2. බාලදක්ෂ ව්‍යාපාරයේ මෙහෙවර ප්‍රකාශය
3. බාලදක්ෂ ව්‍යාපාරයේ අධ්‍යාපනික අරමුණු
4. බාලදක්ෂ පොරොන්දුව
5. බාලදක්ෂ නීතිය
6. අංශ හා වයස් කාණ්ඩ
7. මානවක බාලදක්ෂ කටයුතුවල උපත
8. මානවක බාලදක්ෂ කටයුතු - නිර්මාතෘවරයාණන්ගේ වදනින්...
9. මානවක කටයුතු - හැඳින්වීම
10. මානවක බාලදක්ෂ අංශය
11. මානවක බාලදක්ෂ සමාජය
12. මානවක බාලදක්ෂ නායක
13. මානවක පර්ෂද හා පර්ෂද නායකයින්
14. මානවක පර්ෂදයක විධිමත්භාවය
15. මානවක සමාජ රැස්වීම්
16. මානවක සමාජ රැස්වීමක ආදර්ශ වැඩ සටහනක්
17. විශේෂිත මානවක සමාජ රැස්වීම් (ක්ෂේත්‍ර වැඩසටහන්)
18. නව මානවක බාලදක්ෂ සමාජයක් ස්ථාපිත කිරීම
19. මානවක සමාජයක පොත් පත් හා ලිපිගොණු
20. මානවක සමාජ වර්ගීකරණය
21. අනුග්‍රාහක මානවක සමාජ
22. විවෘත මානවක සමාජ (ප්‍රජා-මූලික)
23. දිස්ත්‍රික් මානවක සමාජ
24. මානවකයින්ගේ පදක්කම් හා ප්‍රදානයන් ලේඛන ගත කිරීම
25. මානවක සමාජ මණ්ඩලය
26. මානවක සමාජ මණ්ඩල රැස්වීමක න්‍යාය පත්‍රය
27. මානවක මූලික
28. මානවක නායකත්ව මණ්ඩලය
29. දිස්ත්‍රික් මානවක මණ්ඩලය
30. කාලීන සටහන් පොත (ලොග් පොත)
31. මානවක අවධින්
32. මානවක ආධුනික අවධිය

**33.** මානවක අනුගාමික අවධිය
**34.** මානවක බාලදක්ෂ අවධිය
**35.** මානවක උපදේශක අවධිය
**36.** මානවකයින් සඳහා ප්‍රගති පදක්කම් හා ප්‍රදානයන්
**37.** මානවක සමාජයට ඇතුලත් වීමේ ක්‍රමවේදය
**38.** මානවක සාමාජික පදක්කම  (ඇතුළත් වීමේ පරීක්ෂණය)
**39.** මානවක පරමාදර්ශී පදක්කම
**40.** මානවක බාලදක්ෂ දිවුරුම් දීම
**41.** මානවක අනුග්‍රාහකයා
**42.** දිවුරුම් දුන් මානවක බාලදක්ෂයෙකු සඳහා වූ ප්‍රගතිය
**43.** මානවක ප්‍රවීණතා තරු
**44.** ව්‍යාපෘති තරුව (RPS-01)
**45.** ගවේෂක තරුව (RPS-02)
**46.** බාලදක්ෂ ශිල්පීය තරුව (RPS-03)]
**47.** නායකත්ව තරුව (RPS-04)
**48.** ප්‍රථමාධාර සේවා පදක්කම
**49.** යහපත් පුරවැසි පළඳනාව
**50.** බේඩන් පවල් ප්‍රදානය (බී,පී.ප්‍රදානය)
**51.** බේඩන් පවල් ප්‍රදානය ඇගයීම
**52.** බී.පී. ප්‍රදානය අනුමත කිරීම
**53.** මානවක උපදේශකයන්

**'හානියෙන් සුරක්ෂාව' (මට්ටම 12-15)**

**54.** 'හානියෙන් සුරක්ෂාව' - *මට්ටම 12*
**55.** 'හානියෙන් සුරක්ෂාව' - *මට්ටම 13*
**56.** 'හානියෙන් සුරක්ෂාව' - *මට්ටම 14*
**57.** 'හානියෙන් සුරක්ෂාව' - *මට්ටම 15*

**'වඩා යහපත් ලොවක අභිලාශ රාමුව'**

**58.** 'වඩා යහපත් ලොවක අභිලාශ රාමුව' (ජාත්‍යන්තර පදක්කම්)
**59.** සාමයේ පණිවුඩකරුවෝ - මුදු පදක්කම *(BWF-01)*
**60.** 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය *(BWF-02)*
**61.** පැට්‍රිමොනිටො *(ලෝක උරුම)* බාලදක්ෂ පදක්කම *(BWF-03)*
**62.** සොබාදහම් ශූරතා අභියෝගය *(BWF-04)*
**63.** ටයිඩ් ටර්නර් ප්ලාස්ටික් අභියෝගය *(BWF-05)*
**64.** සූර්ය බලශක්ති බාලදක්ෂ අභියෝගය *(මට්ටම-3) (BWF-06)*

**65.** සාමය සඳහා සවාදය *(BWF-07)*

**නිල ඇඳුම් (මානවකයින් සඳහා)**

**66.** නිල ඇඳුම - මානවක බාලදක්ෂ
**67.** නිල ඇඳුම - ගුවන් මානවක බාලදක්ෂ
**68.** නිල ඇඳුම - මුහුදු මානවක බාලදක්ෂ
**69.** මානවක බාලදක්ෂ නිල ඇඳුම - සම්මත
**70.** මානවක බාලදක්ෂ නිල ඇඳුම - පදක්කම්
**71.** මානවක නිල ඇඳුමේ පැළඳිය හැකි ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ ප්‍රදානයන්
**72.** මානවක බාලදක්ෂ නායක නිල ඇඳුම්

**මානවක කටයුතුවල නියැලෙන බාලිකාවන් / තරුණියන්**

**73.** මානවක බාලිකාවන් / තරුණියන් සඳහා මාර්ගෝපදේශකත්වය

**උත්සව (මානවක බාලදක්ෂ අංශය)**

**74.** නවකයින්, මානවක ආධුනිකයොන් ලෙස පිළි ගැනීම
**75.** මානවක ආධුනිකයින්, මානවක අනුගාමිකයින් ලෙස උසස් කිරීමේ උත්සවය
**76.** මානවක බාලදක්ෂ දිවුරුම් දීමේ උත්සවය

**මානවක අංශයේ අයැදුම්පත්**

**77.** මානවක සමාජයකට ඇතුළුවීමේ අයැදුම් පත *(පිටු 1)*
**78.** මානවක සාමාජිකත්ව පදක්කම සඳහා අයැදුම් පත *(පිටු 1)*
**79.** මානවක පරමාදර්ශී පදක්කම සඳහා අයැදුම් පත *(පිටු 1)*
**80.** මානවක දිවුරුම් දීම සඳහා අයැදුම් පත *(පිටු 1)*
**81.** ව්‍යාපෘති තරුව සඳහා අයැදුම් පත *(පිටු 1)*
**82.** ගවේෂක තරුව සඳහා අයැදුම් පත *(පිටු 1)*
**83.** බාලදක්ෂ ශිල්පීය තරුව සඳහා අයැදුම් පත *(පිටු 1)*
**84.** නායකත්ව තරුව සඳහා අයැදුම් පත *(පිටු 1)*
**85.** යහපත් පුරවැසි පළඳනාව සඳහා අයැදුම් පත *(පිටු 1)*
**86.** බී.පී. ප්‍රදානය සඳහා අයැදුම් පත *(පිටු4)*
**87.** මානවක ප්‍රගති වාර්තාව *(පිටු 3)*
**88.** මානවක පදක්කම් ලියාපදිංචි කිරීමේ අයැදුම් පත *(පිටු 1)*
**89.** නව මානවක සමාජයක් ලියාපදිංචි කිරීමේ අයැදුම් පත *(පිටු 2)*

**මානවක පරිභාෂිත වචන මාලාව**

# බාලදක්ෂ ව්‍යාපාරය
# The Scout Movement

බාලදක්ෂ ව්‍යාපාරය යනු එහි නිර්මාතෘවරයාණන් විසින් හඳුනාගත් අරමුණු, සිද්ධාන්තයන් හා ක්‍රම වේදයන්ගෙන් සමන්විත කිසිදු භේදයකින් තොරව, ළමා හා තරුණයන්ගේ අධ්‍යාපනය සඳහා සැකසුනු, සැමට විවෘත වූ, හා දේශපාලනයෙන් තොරවූ ස්වේච්ඡා සංවිධානයකි.

බාලදක්ෂ ව්‍යාපාරයේ මූලික අරමුණ වන්නේ ළමා හා තරුණ පරපුර, ජාතික හා ජාත්‍යන්තර ප්‍රජාවට වැඩදායි වූ, වගකිව හැකි යහපත් පුරවැසියෙකු බිහි කිරීමයි.

## 1. අභිප්‍රාය ප්‍රකාශය
## The Purpose

වඩාත් යහපත් ලොවක් ගොඩ නැගීම සඳහා ධනාත්මක ලෙස දායක වන්නාවූ ස්වකීය ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාව තුළ වගකිව යුතු පුරවැසියන් ලෙස සහ කණ්ඩායමක් වශයෙන් ක්‍රියා කිරීමට හැකි පුද්ගලයන් ලෙස ළමා හා තරුණ ප්‍රජාවෙහි සම්පූර්ණ කායික, බුද්ධිමය, චිත්තවේගීය, සමාජීය, අධ්‍යාත්මික සහ සංස්කෘතික හැකියාවන් සංවර්ධනය කිරීමට දායක වීම ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ අභිප්‍රාය වේ.

## 2. බාලදක්ෂ ව්‍යාපාරයේ මෙහෙවර ප්‍රකාශය
## Mission of Scouting

ස්වයං පරිසමාප්ත පුද්ගලයින් වශයෙන් සමාජයට ඵලදායි කාර්යභාරයක් ඉටු කරමින්, වඩාත් යහපත් ලොවක් ගොඩ නැගීම සඳහා සහය වීමට බාලදක්ෂ පොරොන්දුව හා නීතිය මත පදනම් වූ, පිළිගත් හර පද්ධතියක් මගින්, ළමා හා යොවුන් අධ්‍යාපනයට දායක වීම බාලදක්ෂ ව්‍යාපාරයේ මෙහෙවරයි.

## 3. බාලදක්ෂ ව්‍යාපාරයේ අධ්‍යාපනික අරමුණු
## Educational Objectives of the Scout Movement

- **කායික සංර්ධනය**
  ශරීරයේ වර්ධනය හා ක්‍රියාකාරීත්වය සඳහා වගකිව යුතු වීමේ හැකියාව බාලදක්ෂයා තුළ සංවර්ධනය කිරීම.

- **බුද්ධිමය සංවර්ධනය**
  නව වාතාවරණයට ගැලපෙන පරිදි සිතීමේ, නිමැවීමේ හා නවතාවයෙන් යුතුව තොරතුරු උපයෝගී කර ගැනීමට ඇති හැකියාව බාලදක්ෂයා තුළ සංවර්ධනය කිරීම.

- **චිත්තවේගී සංවර්ධනය**
  සිය හැඟීම් හඳුනා ගැනීමට හා ඇතුළාන්ත නිදහසත්, සමබරතාවත්, චිත්තවේගී පරිණත භාවයත් අත් කර ගැනීම හා පවත්වාගෙන යාමේ අරමුණින් එම හැඟීම් පිළිවෙළින් ප්‍රකාශ කිරීමට බාලදක්ෂයා තුළ ඇති හැකියාව සංවර්ධනය කිරීම.

- **සමාජීය සංවර්ධනය**
  අන්‍යෝන්‍ය වශයෙන් බැඳීම පිළිබඳ සංකල්පය ඇතිකර ගනිමින් සහයෝගයෙන් ක්‍රියා කිරීමට සහ නායකත්වය සඳහා හැකියාවන් සංවර්ධනය කර ගැනීමට ඇති හැකියාව බාලදක්ෂයා තුළ සංවර්ධනය කිරීම.

- **ආධ්‍යාත්මික සංවර්ධනය**
  අන්‍යයන්ගේ ආධ්‍යාත්මික තෝරා ගැනීම්වලට ගරු කරන අතර ම, සිය ප්‍රජාවෙහි ආධ්‍යාත්මික උරුමය පිළිබඳ තේරුම් ගෙන දෙන ගැඹුරු දැනුමක් ලබා ගැනීම, ජීවිතයට අරුතක් ගෙන දෙන ආත්මික සහනය සොයා ගැනීම හා නොයෙකුත් දෛනික ජීවිතයේ නිගමනයන්ට එළඹීම පිළිබඳ දැනුම බාලදක්ෂයා තුළ සංවර්ධනය කිරීම.

- **සංස්කෘතික සංවර්ධනය**
  සමාජ හැඩ ගැස්මට දායක වන උරුමයන් මනාව වටහාගෙන, ඒවාට ගරු කරමින්, පිළිපදිමින්, ඉදිරි පරපුරට දායක කර දීම සඳහා හැඩ ගැසීමට බාලදක්ෂයා තුළ ඇති හැකියාවන් සංවර්ධනය කිරීම.

## 4. බාලදක්ෂ පොරොන්දුව
## Scout Promise



> මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමටද,
> සෑම කල්හිම අනුන්ට උපකාර කිරීමටද,
> බාලදක්ෂ නීතියට කීකරු වීමටද,
> මාගේ අවංක විශ්වාසය උඩ සම්පූර්ණ උත්සාහය යෙදීමට
> ගෞරව බහුමානයෙන් පොරොන්දු වෙමි.

## 5. බාලදක්ෂ නීතිය
## The Scout Law

1) බාලදක්ෂයා විශ්වාස කටයුතු අයෙකි.
2) බාලදක්ෂයා පක්ෂපාතී අයෙකි.
3) බාලදක්ෂයා හිතෛෂිය කාරුණික අයෙකි.
4) බාලදක්ෂයා සෑම බාලදක්ෂයෙකුගේම සහෝදරයෙකි.
5) බාලදක්ෂයා ධෛර්ය සම්පන්න අයෙකි.
6) බාලදක්ෂයා සත්ත්ව කරුණාව ඇති අයෙකි.
7) බාලදක්ෂයා සහයෝගයෙන් ක්‍රියා කරන්නෙකි.
8) බාලදක්ෂයා සොම්නස් සහගත අයෙකි.
9) බාලදක්ෂයා සැකසුරුවම් අයෙකි.
10) බාලදක්ෂයා සිත, කය හා වචනයෙන් පිරිසිදු අයෙකි.

## 6. අංශ හා වයස් කාණ්ඩ
## Sections & Age Groups

| | අංශය | වයස් කාණ්ඩය |
|---|---|---|
| 1 | සිඟිති බාලදක්ෂ | අවුරුදු 5 -7 |
| 2 | පෝතක බාලදක්ෂ | අවුරුදු 7 -11 |
| 3 | කනිෂ්ඨ බාලදක්ෂ | අවුරුදු 10 ½ - 14 ½ |
| 4 | ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ | අවුරුදු 14 ½ - 18 |
| 5 | මානවක බාලදක්ෂ | අවුරුදු 17 ½- 26 |

## 7. මානවක බාලදක්ෂ කටයුතුවල උපත
## Birth of Rover Scouting

වසර 1918 ජුනි මාසයේ පැවති එංගලන්ත කවුන්සිලයේ විශේෂ රැස්වීමකදී, එහි විධායක සභාව විසින් ළමුන්ට පමණක් නොව තරුණයින් සඳහාද ව්‍යාපාරයේ අවස්ථාව හිමි විය යුතු බව අවධාරණය කරන ලදී.

බාලදක්ෂයින් යහපත් පුරවැසියන් බවට පමුණුවාලීමේ පුහුණුව තවදුරටත් සම්පූර්ණ කිරීමටත්, ඔවුන් ප්‍රීතිමත්, සෞඛ්‍ය සම්පන්න හා ප්‍රයෝජනවත් පුරවැසියන් ලෙස සංවර්ධනය කිරීමටත්, ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින් මෙම ව්‍යාපාරය තුළ රඳවා ගැනීම අත්‍යාවශ්‍ය බව මෙහිදී අවධාරණය කරන ලදී. මෙම තරුණයින් තවදුරටත් 'ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින්' ලෙස හැඳින්වීම පිළිබඳව සෑහීමට පත් නොවූ බේඩන් පවල සාමි තුමා, මොවුන් සඳහා යෝග්‍ය නම් එකතුවක් සකස් කිරීම, කර්නල් ඩී බර්ග් වෙත පැවරීය.

මෙලෙස ලැබූ නාම යෝජනා අනුව, 1918 අගෝස්තු මසදී බී.පී. තුමා විසින් මොවුන් හැඳින්වීම සඳහා 'මානවක බාලදක්ෂ' යන නාමය ප්‍රකාශයට පත් කරන ලදී.

ඉන් අනතුරුව, 'මානවක බාලදක්ෂයින් සඳහා රීති මාලාවක්' (Rules for Rover Scouts) තාවකාලිකව ඉදිරිපත් කළ නමුත් වසර කිහිපයක් ගෙවී යන්තම් ඒ සඳහා තිරසාර දැක්මක අවශ්‍යතාවය මතුවිය.

පෝතකයින් සඳහා 'කහ' වර්ණයත්, බාලදක්ෂයින් සඳහා 'කොළ' වර්ණයත් යොදාගෙන තිබූ නිසා, මානවකයින් සඳහා 'රතු' වර්ණය තෝරා ගත් අතර, උරපටි සඳහාද 'රතු' වර්ණය යොදා ගන්නා ලදී.

1919 ජනවාරි මාසයේ ජාත්‍යන්තර මූලස්ථානයේදී පැවති මානවක සභායකයින්ගේ සම්මන්ත්‍රණයකදී මානවක උරපටිවල වර්ණය 'කොළ' පැහැය ලෙස වෙනස් වූ අතර, උරපටිවල 'මානවක' යන නම සඳහන් කිරීමට එකග විය.

## 8. මානවක බාලදක්ෂ කටයුතු - නිර්මාතෘවරයාණන්ගේ වදනින්...
## Rover Scouting - from the Founder

***මානවකයින් සඳහා ලියූ "මානවක කටයුතු තුළින් සාර්ථකත්වය" ("Rovering to Success") නම් පොතේ මෙසේ අර්ථ දක්වා ඇත:***

"මානවකයින් යනු එළිමහන් ජීවිතයේ සහෝදරත්වයත්, සේවයත් අගය කරන්නෝ වෙති. මොවුහු විවෘත මාර්ගයන්හි දුෂ්කර ගමන් කරුවෝද, වන ලැහැබ් තුල කඳවුරු බඳින්නෝද වෙති. මොවුහු ස්ව-කැමැත්තෙන්ම යහපත් පුරවැසියන් ලෙස සමාජයට අවතීර්ණ වීම සඳහාත්, අන්‍යයන්ට සේවය සඳහාත්, හැකියාවක් හා සූදානමක් ඇත්තවුන් වෙති"

***"බාලදක්ෂ නායකත්වයට අත්වැලක්"* (Guide to Scout Masters) *නම් පොතේ මානවකයින් පිළිබඳව මෙසේ පවසයි.***

"තම ආගම දහම වෙනුවෙන් යුතුකම් ඉටුකිරීම හැරුනු විට මානවකයෙකුගේ ප්‍රධාන වගකීම වනුයේ තමන් විසින් තමන් වෙත ඇති වගකීම් ඉටුකිරීමයි. එසේ කිරීමෙන් තමා අධ්‍යාපනයෙන් හා පුහුණුවෙන් මුහුකුරා ගොස්, තම දෙපයින් නැගී සිටීමට හැකිවනවා පමණක් නොව එනයින් තම වාරය පැමිණි කල අන්‍ය සේවය සැලසීමටද මහගු හැකියාවක් අත්වේ."

## 9. මානවක කටයුතු - හැඳින්වීම<br>Rovering - Introduction

1) මානවක කටයුතු යනු, බාලදක්ෂ ක්‍රියාකාරකම් තවදුරටත් තරුණයින් සඳහා, ඔවුන්ට උචිත පරිදි පවත්වාගෙන යාමේ වැඩ පිළිවෙලකි.

2) පෞරුෂත්ව වර්ධනය හා චරිත වර්ධනය සඳහා මානවක කටයුතු ප්‍රමුඛ අත්වැලකි.

3) මානවක කටයුතු, යෞවන යෞවනියන්ට "අවට ලෝකය සමග යහපත් සබඳතා ගොඩ නංවා ගැනීමට" ලැබෙන මහ-ු අවස්ථාවක් වන අතර, නායකත්ව ගුණාංග වර්ධනය කර ගනිමින් රටේ යහපත් පුරවැසියන් ලෙස සමාජ ගත වීම සඳහාත්, යහපත් පවුල් දිවියක් සහිත දිවිපෙවෙතක් සඳහාත් අත්වැලක් වනු නො අනුමානය.

4) තවද ස්වයංවිනයකින් (Self-discipline) හා ස්වයං-විශ්වාසයකින් (Self-Reliance) හෙබි තරුණ- තරුණියන් මානවක කටයුතු තුළින් නිර්මාණය කෙරෙන අතර, තම එදිනෙදා කටයුතුවලදී අවංක බව, දේශ මාමකත්වය හා දැහැමිබව වැනි උතුම් ගතිලක්ෂණ වලින් සපිරි පූර්ණ මිනිසෙකු බවට තරුණයා පත් කරයි.

5) මානවක කටයුතු, බාලදක්ෂ පොරොන්දුව, නීතිය හා ආදර්ශ පාඨයක් අනුව ක්‍රියාත්මක වන අතර, බාලදක්ෂ ශිල්පීමය දැනුම් සම්භාරයකින්ද, බාලදක්ෂ ජීවයෙන්ද සපිරි යහපත් පුරවැසියෙකු වීම දක්වා තරුණයා සංවර්ධනය කරයි.

## 10. මානවක බාලදක්ෂ අංශය
## Rover Scout Section

1) මෙම අංශයේ සාමාජිකයින් සාමාන්‍ය ව්‍යවහාරයේදී 'මානවකයින්' ලෙස හඳුන්වනු ලැබේ.

2) මොවුන් බාලදක්ෂ ව්‍යාපාරයේ 'යොවුන් වැඩිහිටි පුහුණුවන්නන්' ලෙස හඳුන්වනු ලබන අතර, අවුරුදු 17 මාස 6 සිට අවුරුදු 26 දක්වා වූ වයස් සීමාවේ පසුවන මෙම මානවකයින් සඳහා විවිධ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කෙරේ.

3) මානවක කටයුතු සඳහා ඉදිරිපත්වන තරුණ තරුණියන් පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැක.
    1) ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින් හෝ බාලදක්ෂ නායකයින් හෝ ආදි බාලදක්ෂයින්
    2) මීට පෙර බාලදක්ෂ සාමාජිකත්වයක් ලබා නැති අය (නවකයින්)

4) මානවකයින් සාමාන්‍යයෙන් සති 2කට වරක්, පැය 1 ½ - 2 පමණ කාලයක් රැස්වෙයි.

5) **ආදර්ශ පාඨය:** මානවකයින් යනු ප්‍රජා සේවා හා සංවර්ධන කටයුතු සඳහා ඇප කැප වූ පිරිසක් වන අතර, "අපි සේවය කරමු" නම් වූ උතුම් ආදර්ශ පාඨයක් යටතේ සේවා කටයුතු සඳහා තම දායකත්වය ලබා දෙයි.

## 11. මානවක බාලදක්ෂ සමාජය
## Rover Scout Crew

1) මානවක බාලදක්ෂ සමාජයක් යනු විධිමත් හා සුවිශේෂී බාලදක්ෂ පුහුණුවක් තවදුරටත් ලබා ගැනීම සඳහා මානවකයින්ට, එනම් 'යොවුන් වැඩිහිටියන්' හට අවස්ථාව සලසා දෙනු ලබන ඒකකයකි.

2) මානවක සමාජයක්, මානවකයින්ගෙන් සමන්විත වන අතර, ඔවුන් පාසලේ හෝ වෙනත් ප්‍රජා මධ්‍යස්ථාන, විශ්ව විද්‍යාල, වෘත්තීමය පුහුණුආයතන වැනි ඒකක වලට අයත් වූවන් හෝ අවට ප්‍රදේශයේ අයවලුන් විය හැකිය.

3) මානවක සමාජ, ස්වයං-පාලනයක් සහිත ඒකක වන අතර, තම වැඩ සටහන් හා ක්‍රියාකාරකම් තමන් විසින්ම සැලසුම් කර තම මානවකයින් සමග ඒවා ක්‍රියාත්මක කරනු ලබයි.

4) මානවක නායකයින් ඔවුන් සමග සිටිමින්, ඔවුන්ට නිදහසේ කටයුතු සංවිධානය කර ගැනීමට අවකාශ සලසන නමුත් අවශ්‍ය අවස්ථාවන්හිදී ඔවුන්ට උපදෙස් හා මාර්ගෝපදේශයන් සලසා දෙයි.

5) ජනාධිපති ප්‍රදානය සඳහා වූ අවශ්‍යතා සම්පූර්ණ කරමින් සිටින ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින් එම ප්‍රදානයේ අවශ්‍යතා සම්පූර්ණ කිරීමෙන් පසු මානවක සමාජයට සම්බන්ධ වීම වඩාත් සුදුසුය.

6) මානවක සමාජයකට වැඩිහිටි නායකයන් පත්වී තිබීම අතිශයින් වැදගත් වන අතර, අවම වශයෙන් එක් මානවක බාලදක්ෂ නායකයෙක් (RSL) හා එක් සහාය මානවක බාලදක්ෂ නායකයෙක් (ARSL) සම්බන්ධ වී සිටිය යුතුය.

## 12. මානවක බාලදක්ෂ නායක
**Rover Scout Leader (RSL)**

1) බාලදක්ෂ අරමුණු හා පුහුණු ක්‍රම උපයෝගි කර ගනිමින් නිසි පරිදි මානවක බාලදක්ෂ සමාජයක් පවත්වාගෙන යෑම, මානවක බාලදක්ෂ නායකයා සතු කාර්ය භාරයක් වනු ඇත.

2) මානවක බාලදක්ෂ නායකයා අවුරුදු 26 සම්පූර්ණ කර ඇති අයෙකු විය යුතු අතර ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය මගින් සංවිධානය කරනු ලබන අදියර-I වැඩිහිටි නායක (මානවක) පුහුණුවක් ලැබූ අධිකාරී පත්‍රයක් ලත් අයෙකු විය යුතුය.

3) මානවක බාලදක්ෂ නායකයා තම සේවය ඉතා ප්‍රීතියෙන් හා බලවත් ප්‍රමෝදයකින් යුතුව ලබා දිය හැකි, තරුණයින්ගේ සිත් දිනා ගනිමින් ඔවුන්ගේ අදහස් උදහස් වලදී එකඟතාවයක් ගොඩ නගා ගැනීමට සමත් උපක්‍රමශීලී පුද්ගලයෙකු විය යුතුය.

4) මානවක බාලදක්ෂ නායකයා සෑම විටම ක්‍රමවත්ව හා නිවැරැදිව තම නිල ඇඳුමෙන් සැරසීමට වග බලා ගත යුතුය.

5) ඔහු මානවක බාලදක්ෂ නායක ලෙස පුහුණුව නොලැබූ අයෙක් නම්, ජාතික පුහුණු කිරීමේ මණ්ඩලය මගින් පවත්වනු ලබන අදියර-I

මානවක නායක පුහුණු පාඨමාලාවකට නොපමාව සහභාගි විය යුතුය.

6) වයස අවුරුදු 26 ඉකුත් වීමට පෙර මානවකයෙකු ලෙස දිවුරුම් දී නොමැති අයකු මානවක නායකයෙකු ලෙස කටයුතු කිරීමට ඉදිරිපත් වන්නේ නම්, ඔහුට/ඇයට අදියර-I මානවක නායක පුහුණු පාඨමාලාවකට සහභාගි වනතුරු මානවකයෙකු ලෙස දිවුරුම් දීමට දිය නොහැක. කෙසේ වුවද, අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම් එම පාඨමාලාවකදී වුවද දිවුරුම් දිය හැක.

7) අවුරුදු 26 ඉක්මවූවකු දිවුරුම් දීම සඳහා මානවක අනුගාමිකයෙකු අනුගමනය කරන සාමාන්‍ය වැඩ පිළිවෙල අනුගමනය කළ යුතු නමුදු, සියළු ඇගයීම් කටයුතු තම මානවක අනුග්‍රාහකයා (Rover Sponsor) යටතේ පෞද්ගලික ලෙස පවත්වාගෙන යා හැකිය.

8) සාමාන්‍යයෙන් මානවක බාලදක්ෂ නායකයෙකුගේ හෝ උපදේශ කයෙකුගේ දිවුරුම් දීමේ උත්සවයක් වෙනත් මානවකයින් සමග ඒකාබද්ධ ලෙස සංවිධානය කරනු නොලබන අතර, තමන් සඳහා උත්සවයක් වෙන්ව පැවැත්වීම වඩාත් යෝග්‍යය.

## 13. මානවක පර්ෂද හා පර්ෂද නායකයින්
**Rover Clusters & Cluster Leaders (CL)**

1) මානවක සමාජයක් සමාන ලැදිකම් ඇති සාමාජිකයින් 8 දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත පර්ෂදවලට (Clusters) වෙන් කළ හැකිය.

2) ඒ එක් එක් පර්ෂදයේ සාමාජිකයින් විසින් තම පර්ෂදය සඳහා නායකයෙකු හා උප නායකයෙකු තෝරා ගනියි. මෙම නායකයා 'පර්ෂද නායක' (Cluster Leader) ලෙසද, උප නායකයා 'පර්ෂද උප නායක' (Asst. Cluster Leader) ලෙසද හැඳින් වේ.

3) මානවක බාලදක්ෂ සමාජයේ රැස්වීම්, මානවක බාලදක්ෂ නායකයාගේ අධීක්ෂණය යටතේ පැවැත්විය යුතු වුවද, රැස්වීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම, ඒ ඒ පර්ෂද නායකයින් මගින් සිදුවීම වඩාත් සුදුසුය.

## 14. මානවක පර්ෂදයක විධිමත්භාවය
## Formlities of a Rover Cluster

1) **පර්ෂද නාම**:

මානවක පර්ෂදවල අනන්‍යතාවය රැක ගැනීම සඳහා 'පර්ෂද නාම' (Cluster Names) භාවිතා කෙරේ. මානවක පර්ෂද නම් කිරීමේදී ලෝක සාමය, අභිනව නිපැයුම්, සමාජීය හා ආගමික පුනරුදය වෙනුවෙන් ඉමහත් සේවයක් කළ සමාජ ක්‍රියාකාරීන් හෝ සාර්ථක හා අදර්ශමත් ජීවිත ගත කළ ජාත්‍යාන්තරව කීර්තියට පත් ලෝක පූජිත නායකයින්, වැනි පුද්ගලයින්ගේ නම් යොදා ගනු ලැබේ.

*උදාහරණ:*

- මාර්කෝ පෝලෝ (1254-1324)
- ක්‍රිස්ටෝෆර් කොලොම්බස් (1415-1506)
- සර්.අයිසැක් නිව්ටන් (1642-1727)
- ඒබ්‍රහම් ලින්කන් (1809-1865)
- රබීන්ද්‍රනාත් තාගෝර් (1861-1941)
- මහත්මා ගාන්ධි (1869-1948)
- වින්ස්ටන් චර්චිල් (1874-1963)
- ඇල්බට් අයින්ස්ටයින් (1879-1955)
- ආතර් සී. ක්ලාර්ක් (ශ්‍රී ලාංකික) (1917-2008)

**කීර්තිමත් කාන්තාවෝ:**

- ෆ්ලෝරන්ස් නයිටිංගේල් (1820-1916)
- මාරි කියුරි (1867-1934)
- තෙරේසා මව්තුමිය (1910-1997)

2) **පර්ෂද කොඩිය, සංකේතය, හා ආදර්ශ පාඨය**

එක් එක් පර්ෂදයක් සඳහා කොඩියක් (ද්වි-වර්ණ), සංකේතයක්, හා ආදර්ශ පාඨයක් යොදා ගැනීම, පර්ෂදයක් ලෙස එකමුතුව කටයුතු කිරීමට ඉවහල් වනු ඇත.



*(දිග සෙ.මී. 30 x උස සෙ.මී.  20)*

3) **පර්ෂද අණ්ඩ**:

පර්ෂදයකට අයත් සාමාජිකයින් හඳුනාගැනීම සඳහා පර්ෂද අණ්ඩ (Cluster Patches), එම කාණ්ඩයේ වර්ණයන් ඇතුලත් කොට, නිල ඇඳුමේ පැළඳීම සඳහා සකස් කර ගත හැකිය.



*(සෙ.මී. 3x3)*

**4) පර්ෂද නායක/උප නායක අණ්ඩ:**

පර්ෂද නායකයින් හඳුනා ගැනීමට **CL** *සෙ.මී.1.5xසෙ.මී.1.5* ප්‍රමාණයේ අණ්ඩයක්ද, (CL Patch),

පර්ෂද උප නායකයින් හඳුනා ගැනීමට **ACL** *සෙ.මී.1.5xසෙ.මී.1.5* ප්‍රමාණයේ අණ්ඩයක්ද, (ACL Patch),

තම නිල ඇඳුමේ, වම් පස කමිස සාක්කු පියනේ ඉහළ පළඳිනු ලැබේ.

4) **පර්ෂද රැස්වීම්**:

පර්ෂදයකට තම වැඩ කටයුතු සාකච්ඡා කිරීමටත්, සංවිධානය කර ගැනීමටත් අවශ්‍ය වූ විට පර්ෂද නායකගේ මූලිකත්වයෙන් පර්ෂද රැස්වීමක් පැවැත්විය හැකිය.

## 15. මානවක සමාජ රැස්වීම්
**Rover Crew Meetings**

1) මානවක බාලදක්ෂ සමාජයේ රැස්වීම්, අවම වශයෙන් දෙසතියකට වරක්වත්, පැය 1½ - 2 අතර කාලයක් තුළ මානවක බාලදක්ෂ නායකයාගේ අධීක්ෂණය යටතේ පැවැත්විය යුතුය.

2) මෙලෙස පවත්වනු ලබන එක් රැස්වීමක් 'විශේෂිත ක්ෂේත්‍ර ක්‍රියාකාරකමක් ලෙස (මාස 2කට වරක්වත්), තම ආයතනයෙන් පිටස්තර වූ ස්ථානයක පැවැත්වීම සුදුසුය.

3) රැළිය, ධජය විහිදුවීම, ආගමික වතාවත්, ක්‍රීඩා, බාලදක්ෂ ක්‍රියාකාරකම්, කථා, වාද-විවාද, ශාරීරික ක්‍රියාකාරකම්, පුරෝගාමී වැඩ, කාර්මික උපකරණ අළුත්වැඩියා කිරීම, වැදගත් ස්ථාන නැරඹීමේ චාරිකා, ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්, සංගීතමය වැඩ සටහන්, සංදර්ශනයකට හෝ කඳවුරු ගිණි මැළයකට සූදානම් වීම, ආදිය මානවක රැස්වීමක වැඩ සටහනට අඩංගු විය හැකිය.

4) වැඩ සටහනට අදාල කටයුතු කලින් රැස්වීමේදී පවරා සූදානම් කර ගත යුතු අතර, එය ක්‍රියාත්මක කිරීමට පර්ෂද නායකයින්ගේ උපරිම දායකත්වය ලබා ගත යුතුය.

## 16. මානවක සමාජ රැස්වීමක ආදර්ශ වැඩ සටහනක්
**Model Program for a Rover Crew Meeting**

1) **ආරම්භය - කොඩිගස අභියස චාරිත්‍ර (විනාඩි 15)**
   (1) කැඳවීම - අශ්ව ලාඩමක හැඩයට සිටීම
   (2) කොඩිය විහිදුවීම (ජාතික කොඩිය නම් එසවිය යුතුය)
   (3) බාලදක්ෂ ආචාරය
   (4) ජාතික ගීය
   (5) ආගම සිහි කිරීම
   (6) දවසේ සිතුවිල්ල
   (7) නිවේදන
   (8) විසිර යාම (දිනයේ ඉදිරි පුහුණු හෝ ක්‍රියාකාරකම් සඳහා)

2) **මානවක පුහුණු කටයුතු (විනාඩි 60 - 90)**
   (1) ක්‍රීඩාවක්
   (2) බාලදක්ෂ ශිල්පීය පුහුණුව

(3) බාලදක්ෂ ශිල්පීය පුහුණුවේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්
(4) පෙරදින රැස්වීමේ පුණරීක්ෂණ කටයුතු
(5) මානවක ශිල්පීය දැනුම - අභියෝග/බාධක
*('මානවක කටයුතු තුළින් සාර්ථකත්වය' පොත/පුවත්පත්/සගරා ඇසුරෙන්)*

3) **නිමාව - කොඩිගස අභියස චාරිත්‍ර (විනාඩි 15)**
(1) කොඩිගස අභියස රැස්වීම
(2) කොඩිය බෑම
(3) සේවා කටයුතු බාරදීම
(4) විශේෂ නිවේදන/පණිවුඩය (අවශ්‍ය වේ නම්)
(5) විසිර යාම

## 17. විශේෂිත මානවක සමාජ රැස්වීම් (ක්ෂේත්‍ර වැඩසටහන්) Special Rover Crew Meetings (Field Programs)

1) ඉහත 16. 1) හා 3) පරිදි, සාමාන්‍ය මානවක සමාජ රැස්වීමකදී කෙරෙන ආකාරයෙන්ම කොඩිගස අභියස චාරිත්‍ර, අදාල ක්‍රියාකාරකම පැවැත්වෙන ස්ථානයේදී පැවැත්වීම වඩාත් යෝග්‍යය.

2) ඉහත 16. 2) කොටස වෙනුවට, පහත සඳහන් ක්‍රියාකාරකමක් (හෝ වෙනත් සුදුසු ක්‍රියාකාරකමක්) යොදා ගැනීමට කටයුතු කළ යුතුය.

3) මේ සඳහා ගතවන කාලය පැය 2ක් හෝ 3ක් අතර විය හැකි අතර සමහර ක්‍රියාකාරකම් නිසි පරිදි සූදානම් වී, සංවිධානය කර, දිනය පුරා වුවද පැවැත්වීමට පුළුවන.

4) ගවේශණයක්, නිරීක්ෂණ චාරිකාවක් හෝ විශේෂිත පුහුණුවක්:
උදා:
(1) ස්වයං-රැකියා ස්ථානයක් නැරඹීම හා එහි කටයුතු විශ්ලේශනය කිරීම
(2) විශේෂ අධ්‍යාපන, සංස්කෘතික හෝ කලා වැඩ සටහනකට සහභාගි වීම.
(3) පරිසර වැඩ සටහනක් (දැනුවත් වීමට, දැනුවත් කිරීමට හා සමීක්ෂණ ආදිය)
(4) බලශක්ති සංරක්ෂණය පිළිබඳ උපදේශන
(5) සෞඛ්‍ය වැඩ සටහනක් මෙහෙයවීම (ඩෙංගු මර්දන, ජලභීතිකා එන්නත්, වැනි)
(6) ප්‍රජා සේවා හෝ ප්‍රජා සංවර්ධන කටයුතු

(7) රජයේ හෝ වෙනත් මහජන සේවා ආයතනයක දැනුවත් වීමේ චාරිකාවක් (නිසි අවසර සහිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය සභාව, වැනි)
(8) පිහිනීමේ හෝ ඔරු පැදීමේ පුහුණුවක් (වැඩිහිටි අවසර සහිතව, ආරක්ෂක විධි විධාන යටතේ)
(9) විශේෂ ආගමික වැඩ සටහනක්
(10)විනෝද ගමනක්, පාපැදි චාරිකාවක් හෝ එළිමහන් දිනයක්

5) විශේෂ ක්ෂේත්‍ර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පෙර, මානවක සමාජ මණ්ඩලයේ, මානවක බාලදක්ෂ නායකගේ, හා විදුහල්පති තුමාගේ හෝ ආයතන ප්‍රධානියාගේ අනුමැතියත්, එමෙන්ම අදාළ වැඩසටහන පැවැත්වෙන ස්ථානයේ බලධාරීන්ගේ අවසරයත් ලබා ගත යුතු වේ.

6) අවශ්‍ය අවස්ථාවන්හිදී විශේෂඥ දැනුම ඇති සම්පත්ධාරීන්ගේ සහාය ලබා ගත යුතුය.

7) ක්‍රියාත්මක කරනු ලබන සියළුම වැඩ සටහන් බාලදක්ෂ ප්‍රතිපත්ති හා මූලධර්මවලට අනුකූල විය යුතුය.

## 18. නව මානවක බාලදක්ෂ සමාජයක් ස්ථාපිත කිරීම
## Formation of a New Rover Scout Crew

1) මානවක බාලදක්ෂ සමාජයක් අවම වශයෙන් සාමාජිකයින් 6 කින් සහ උපරිම වශයෙන් 36 කින් සමන්විත වේ.

2) මානවක සමාජයක සාමාජික සංඛ්‍යාව 36 ඉක්මවූ විට හැකි ඉක්මනින් එම ඒකකය අනුබද්ධිත උප ඒකක (Affiliated Sub Units) 2 කට වෙන් කර, මානවක බාලදක්ෂ නායකයින් එම උප ඒකක වලට බෙදී යා යුතුය.

3) එසේ කිරීමට ප්‍රමාණවත් නායකයින් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී, නායකයින් සංඛ්‍යාවක් පුහුණු කර ගන්නා තුරු, එම නායකයින් යටතේම උප ඒකක ලෙස රැස්වීම් වෙන් වෙන්ව පැවැත්වීම වඩාත් යෝග්‍යය.

4) එක් මානවක සමාජ ඒකකයක් තුළ සිටිය හැකි සාමාජික සංඛ්‍යාවේ උපරිමය 36 වන නමුදු, උප ඒකක සංඛ්‍යාව වැඩිකර ගනිමින් එහි සමාජික සංඛ්‍යාවද වැඩිකර ගත හැකිය.

5) මානවක සමාජයක උප ඒකක සියල්ල එකම ලියාපදිංචි අංකයක් යටතේ ක්‍රියාත්මක වේ.

6) මානවක සමාජයක් නිත්‍යානුකූලව ස්ථාපිත කිරීමට සඳහා එම මානවක සමාජය, බලපත්‍ර ලත් මානවක බාලදක්ෂ නායකයෙකු යටතේ, ජාතික බාලදක්ෂ මූලස්ථානයේ පවතින ක්‍රමවේදය අනුව ලියාපදිංචි කළ යුතුය.

7) පාසලක හෝ ආයතනයක් යටතේ පවත්වාගෙන යනු ලබන බාලදක්ෂ සමූහයක මානවක සමාජයක් ස්ථාපිත කිරීමේදී එම බාලදක්ෂ සමූහයේ ලිපාපදිංචි අංකය හා නම භාවිතා කෙරේ.

## 19. මානවක සමාජයක පොත් පත් හා ලිපිගොණු
## Books & Records of a Rover Crew

මානවක සමාජය තුළ ආරම්භයේ සිටම පහත සඳහන් පොත් පත් හා ලිපිගොණු නිසියාකාරව පවත්වාගෙන යාම අතිශයින් වැදගත්ය.

(1) මානවකයින්ගේ හා නායකයින්ගේ විස්තර ඇතුළත් **සමාජිකත්ව ලේඛනය**
(2) මානවක සමාජ රැස්වීම් හා සමාජ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වන්නන්ගේ අත්සන් සහිත **පැමිණීමේ ලේඛනය**
(3) අය-වැය ලේඛනය
(4) බංකු ගිණුම්
(5) මානවක සමාජ රැස්වීම් සඳහා **වැඩ සටහන් පොත**
(6) මානවකයින්ගේ ප්‍රගති වාර්තා, පදක්කම් හා ජයග්‍රහණ
(7) සමාජ කාලීන සටහන් පොත (ලොග් පොත)
(8) බඩු වට්ටෝරු පොත
(9) ක්‍රීඩා පොත (මානවකයින්ට උචිත පරිදි)
(10) ගීත පොත (මානවකයින්ට උචිත පරිදි)

## 20. මානවක සමාජ වර්ගීකරණය
## Classification of Rover Crews

මානවක සමාජයක් පහත ක්‍රමවේද 3 අතුරෙන් එක් ක්‍රමවේදයක් යටතේ ස්ථාපිත කර පවත්වාගෙන යා හැකිය.

(1) අනුග්‍රාහක මානවක සමාජ
(2) විවෘත හෙවත් ප්‍රජා-මූලික මානවක සමාජ
(3) දිස්ත්‍රික් මානවක සමාජ

## 21. අනුග්‍රාහක මානවක සමාජ
## Sponsored Rover Crews

1) පාසලක, විශ්ව විද්‍යාලයක, උසස් අධ්‍යාපන ආයතනයක, වෘත්තීමය පුහුණු ආයතනයක, රාජ්‍ය සේවා ආයතනයක හෝ එවැනි වෙනත්

සංවිධානයක පරිපාලනය යටතේ අනුග්‍රාහක මානවක සමාජයක් ස්ථාපිත කළ හැකිය.

2) අනුග්‍රාහක මානවක සමාජයක පරිපාලනය, එම පාසලේ විදුහල්පති හෝ ආයතන ප්‍රධානියා සතු වන අතර ඔහු/ඇය 'සමූහ බාලදක්ෂ නායක' (Group Scout Leader) ලෙස තම මනාපය පරිදි නිල බලයෙන් පත්වේ.

3) අනුග්‍රාහක මානවක සමාජයක්' ස්ථාපිත කරනා විට එහි විදුහල්පති හෝ ආයතන ප්‍රධානියාගේ අනුමැතියට යටත්ව, මානවක සමාජය ලියාපදිංචි කිරීමේ අයැදුම් පතක් *(89-පරිච්ඡේදය) සම්පූර්ණ කර,* දිසා කොමසාරිස් තුමාගේ නිර්දේශය සහිතව ජාතික මූලස්ථානය වෙත යොමු කළ යුතුය.

4) බාලදක්ෂ සමූහයකට අනුයුක්තව මානවක සමාජයක් පිහිටුවා ගන්නා විට එම මානවක සමාජය, එම සමූහය ලියාපදිංචි කල සහතිකය හා අංකය යටතේම පවත්වාගෙන යා හැකි නමුත් එවැනි අවස්ථාවකදී මානවක සමාජය ලියාපදිංචි කිරීමේ අයැදුම් පතක් *(89-පරිච්ඡේදය) මානවක සමාජය හා අදාල විස්තර* ඇතුළත් කර, ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත යොමු කළ යුතුය.

5) මානවක සමාජයක සියළුම සාමාජිකයින්, එහි නායකයින්ද ඇතුළුව, මානවක සමාජයට ඇතුළත්වීමේ අයැදුම් පතක් *(77 පරිච්ඡේදය)* සම්පූර්ණ කර විදුහල්පතිගේ හෝ ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිතව මානවක බාලදක්ෂ නායක වෙත යොමු කළ යුතුය.

6) අනුග්‍රාහක මානවක සමාජයක සාමාජිකත්වයක් ලබාගත හැක්කේ එම පාසල් හෝ ආයතනයේ සිසුන්ටත්, ඔවුන්ට අමතරව විදුහල්පතිගේ හෝ ආයතන ප්‍රධානියාගේ ලිඛිත අවසරය සහිතව එහි ආදි සිසුන්ටත් පමණි.

7) ක්‍රියාකාරී අනුග්‍රාහක මානවක සමාජයක් පවත්වාගෙන යනු ලබන පාසලක හෝ ආයතනයක සිසු-සිසුවියන්ට, වෙනත් මානවක සමාජයක සාමාජිකත්වය දැරීමට අවසර නොමැත. කෙසේ වුවද කිසියම් හේතුවක් මත එසේ සාමාජිකත්වය ලබා ගත යුතු නම් වි දුහල්පති හෝ ආයතන ප්‍රධානියාගේ ලිඛිත අවසරය ලබා ගත යුතුය.

8) කිසියම් පාසලක හෝ ආයතනයක ක්‍රියාකාරී මානවක සමාජයක් <u>නොමැතිනම්</u> එහි සිසු-සිසුවියන්ට, වෙනත් විවෘත හෝ දිස්ත්‍රික් මානවක සමාජයක සාමාජිකත්වය ලබා ගැනීමට අවසර ඇත.

9) ජාතික විශ්ව විද්‍යාලයක හෝ, ජාතික හෝ රාජ්‍ය ආයතනයක අනුග්‍රාහක මානවක සමාජයක් පිහිටුවා ගන්නා විට, එහි ලියාපදිංචි

අංකයට අමතරව අදාල ජාතික හෝ රාජ්‍ය ආයතනයේ නාමයද ඇතුළත් විය හැකි අතර, එහි පරිපාලනමය කටයුතු අදාල දිස්ත්‍රික්කය සතු වන්නේය.

## 22. විවෘත මානවක සමාජ (ප්‍රජා-මූලික)
## Open Rover Crews (Community-based)

1) ස්වෙච්ඡා සංවිධානයක, ආගමික සිද්ධස්ථානයක, ප්‍රජා මධ්‍යස්ථානයක හෝ වෙනත් එවැනි පරිශ්‍රයන් තුළ විවෘත මානවක සමාජ (හෙවත් ප්‍රජා මූලික මානවක සමාජ) ස්ථාපිත කළ හැකිය.

2) විවෘත මානවක සමාජයක ප්‍රධාන පරිපාලකයා හා සම්පත් දායකයා, එය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ ප්‍රධානියා හෝ පරිපාලකයා වන අතර, ඔහු/ඇය 'සමූහ බාලදක්ෂ නායක' ලෙස තම මනාපය පරිදි පත්වේ.

3) විවෘත මානවක සමාජයක්, සාමාන්‍ය බාලදක්ෂ කණ්ඩායමක් ලියාපදිංචි කරන ආකාරයටම ජාතික බාලදක්ෂ මූලස්ථානයේ ලියාපදිංචි කළ හැක. මේ සඳහා මානවක සමාජය ලිපාපදිංචි කිරීමේ අයැදුම් පතක් *(89-පරිච්ඡේදය)* ජාතික බාලදක්ෂ මූලස්ථානයෙන් ලබා ගත හැක.

4) විවෘත මානවක සමාජයක්, සමූහ බාලදක්ෂ නායක ලෙස පත් වූ එම ස්ථානයේ ප්‍රධානියාගේ හෝ පරිපාලකයාගේ ලිඛිත අවසරය සහිතව, *මානවක සමාජය ලිපාපදිංචි කිරීමේ* අයැදුම් පතක් *(89-පරිච්ඡේදය) සම්පූර්ණ කර,* දිසා කොමසාරිස් තුමා මගින් ජාතික මූලස්ථානය වෙත යොමු කළ යුතුය.

5) අනුග්‍රාහක හෝ දිස්ත්‍රික් මානවක සමාජයක සාමාජිකයින් <u>නොවන</u> ඕනෑම අයෙකුට විවෘත මානවක සමාජයක සාමාජිකත්වක ලබා ගත හැක.

6) කිසියම් පාසලක අනුබද්ධිත මානවක සමාජයක් <u>නොමැති නම්</u> විදුහල්පති තුමාගේ අවසරය මත එහි සිසු-සිසුවියන්ට විවෘත මානවක සමාජයක සාමාජිකත්වය ලබා ගත හැක.

7) විවෘත මානවක සමාජයක සියළුම සාමාජිකයින්, එහි නායකයින්ද ඇතුළුව, මානවක සමාජයට ඇතුළත්වීමේ අයැදුම් පතක් *(77-පරිච්ඡේදය)* සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිතව මානවක බාලදක්ෂ නායක වෙත බාර දිය යුතුය.

## 23. දිස්ත්‍රික් මානවක සමාජ
## District Rover Crews

1) දිස්ත්‍රික් ශාඛා සංගමයේ අනුග්‍රාහකත්වයෙන් ස්ථාපිත කරනු ලබන දිස්ත්‍රික් මානවක සමාජයක වගකීම් දිසා කොමසාරිස් තුමා සතුවන අතර එතුමා විසින් සහාය දිසා කොමසාරිස් (මානවක) හෝ දිසා මානවක බාලදක්ෂ නායක හෝ, පුහුණුව ලත් වෙනත් මානවක බාලදක්ෂ නායකයෙකු, එහි මානවක බාලදක්ෂ නායක ලෙස පත් කරනු ලැබේ.

2) දිස්ත්‍රික් මානවක සමාජයක් පවත්වාගෙන යාම සඳහා එය ජාතික බාලදක්ෂ මූලස්ථානයේ ලියාපදිංචි කළ යුතු අතර, සාමාන්‍යයෙන් බාලදක්ෂ කණ්ඩායමක් ලියාපදිංචි කරන ක්‍රමවේදය අනුව එය කළ හැකිය. මේ සඳහා මානවක සමාජය ලියාපදිංචි කිරීමේ අයදුම් පතක් *(89-පරිච්ඡේදය)* සම්පූර්ණ කර යොමු කළ යුතුය.

3) අනුග්‍රාහක හෝ විවෘත මානවක සාමාජයක සාමාජිකත්වයක් <u>නොදරන</u> ඕනෑම අයෙකුට දිස්ත්‍රික් මානවක සමාජයක සාමාජිකත්වය ලබා ගත හැක.

4) අනුග්‍රාහක මානවක සාමාජයක සිසු-සිසුවියන්ට තම පාසලේ හෝ ආයතනයේ අනුබද්ධිත මානවක සමාජයක් <u>නොමැතිනම්,</u> දිසා මානවක සමාජයක සාමාජිකත්වය ලබා ගත හැක.

5) තම පාසලේ හෝ ආයතනයේ අනුබද්ධිත මානවක සමාජයක් <u>නොමැති නම්,</u> අනුග්‍රාහක මානවක සාමාජයක, වයස අවුරුදු 18 සහ 26 අතර වයසේ පසුවන නායක--නායිකාවන්ට, තම සමූහයේ අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින්, දිසා මානවක සමාජයේද සමාජිකත්වය ලබා ගත හැක. (ද්විත්ව සාමාජිකත්වය)

6) ඉහත 5) පරිදි, බාලදක්ෂ කණ්ඩායමක් මෙන්ම දිස්ත්‍රික් මානවක සමාජයක්ද නියෝජනය කරන මානවකයින් විසින් දිසා මානවක සමාජයේ රැස්වීම්, ක්‍රියාකාරකම් හා සේවාවන් සඳහා තම දායකත්වය ලබා දෙමින් ක්‍රියාකාරී සාමාජිකත්වයක් පවත්වාගෙන යා යුතු අතර බාලදක්ෂ කණ්ඩායමේ හා දිස්ත්‍රික් මානවක සමාජයේ ක්‍රියාකාරකම් සමබර ලෙස පවත්වාගෙන යා යුතුය.

7) දිස්ත්‍රික් මානවක සමාජයක සියළුම සාමාජිකයින්, එහි නායකයින්ද ඇතුළුව, මානවක සමාජයට ඇතුළත්වීමේ අයදුම් පතක් *(77-පරිච්ඡේදය)* සම්පූර්ණ කර මානවක බාලදක්ෂ නායක වෙත බාර දිය යුතුය.

## 24. මානවකයින්ගේ පදක්කම් හා ප්‍රදානයන් ලේඛන ගත කිරීම
## Registration of Rovers' Badges & Awards

1) මානවකයින්ගේ වැදගත් කඩයිම් හා ඔවුන් විසින් දිනා ගන්නා සියළුම පදක්කම් හා ප්‍රදානයන්, දින වකවානු සමග, දිස්ත්‍රික් පදක්කම් ලේකම් යටතේ ලියා පදිංචි කළ යුතුය.

2) දිස්ත්‍රික් පදක්කම් ලේකම් විසින් සෑම මානවකයෙකු සඳහාම මානවක ප්‍රගති වාර්තාවක් *(87-පරිච්ඡේදය)* යාවත්කාලිනව පවත්වාගෙන යා යුතු අතර, පදක්කමේ නම හා සමත් දිනය පැහැදිළි ලෙස එහි සටහන් වී තිබිය යුතුය.

## 25. මානවක සමාජ මණ්ඩලය
## Rover Crew-in Council

1) මානවක සමාජ මණ්ඩලය යනු මානවක සමාජයේ මානවකයින් විසින්ම පවත්වාගෙන යනු ලබන උත්තරීතර සභාව වන්නේය.

2) මානවක සමාජ මණ්ඩලයේ උපරිම සාමාජික සංඛ්‍යාව 36කි.

3) මානවක සමාජ මණ්ඩලයකට පත්වන සියළුම නිලධාරීන්, දිවුරුම් දුන් මානවකයින් විය යුතුය. දිවුරුම් දුන් මානවකයින් නොමැති අවස්ථාවලදී අවශ්‍යතාවය පරිදි පර්ෂද නායකයින්/උප නායකයින් ඒ සඳහා පත් කර ගත යුතුය.

4) සමාජ මණ්ඩල රැසවීමක හා මහ සභා රැසවීමක මූලිකත්වය ගනු ලබන්නේ සභාපති ලෙස පත්වන මානවක බාලදක්ෂයෙකු විසිනි. මානවක බාලදක්ෂ නායක එහි ප්‍රධාන සභාරක්ෂක වන්නේය.

5) මානවක සමාජ මණ්ඩලය, මානවක සමාජයේ සියළුම වැඩ සටහන්, ක්‍රියාකාරකම්, පදක්කම් හා ප්‍රදානයන්, අනුග්‍රාහකයින්ගේ සාක්ෂ්‍ය දැරීම් වැනි කරුණු පිළිබඳ සිය අවධානය යොමුකර, තීන්දු තීරණවලට එළැඹෙනු ලබයි.

6) දිවුරුම් දුන් සියළුම මානවක බාලදක්ෂයින්ද, මානවක බාලදක්ෂ නායකයින්, සහාය නායකයින් හා මානවක උපදේශකයින්ද, මෙම මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයින් වන අතර, ඔවුන් 'සභාරක්ෂකයින්' ලෙස මෙම රැස්වීම්වලට සහභාගි වේ.

7) මානවක සමාජ මණ්ඩලයේ සාමාජික 36 කට වැඩි පිරිසක් මෙම මණ්ඩලයේ සාමාජිකත්වය දරන අවස්ථාවකදී, දිවුරුම් දුන් පර්ෂද නායකයින්ට හා උප නායකයින්ටත්, ඊට අමතරව විශේෂ හැකියාවන් සහිත හෝ සම්පත්ධාරීන් ලෙස සැලකිය හැකි මානවක බාලදක්ෂයින්

පිරිසකටත්, මානවක බාලදක්ෂ නායකගේ අනුමැතිය මත සහභාගි විය හැකිය.

8) සංඛ්‍යාවෙන් අඩු හෝ අළුත පටන් ගත් මානවක සමාජයක දිවුරුම් දුන් මානවකයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවලදී, එහි අවශ්‍යතාවය අනුව, තෝරා ගත් මානවක පර්ෂද නායකයින් හා/හෝ පර්ෂද උප නායකයින් කිහිප දෙනෙකුට (දිවුරුම් දී නොමැති වුවද) මානවක සමාජ මණ්ඩලයට නිල වශයෙන් සහභාගි වීමට අවස්ථාව සලසා දිය හැකිය.

9) මානවක සමාජ මණ්ඩල රැස්වීමකදී ගනු ලබන සියළු තීරණ හා ඒවා ක්‍රියාත්මක කිරීම, සහාරක්ෂක ලෙස සහභාගි වන මානවක බාලදක්ෂ නායකගේ පූර්ණ අනුමැතිය මත සිදුවිය යුතුය.

10) මණ්ඩලය තුළ ගැටළුකාරී තත්වයක් මතුවන අවස්ථාවලදී සභාපති, ලේකම් හා භාණ්ඩාගරික යන ප්‍රධාන නිලධාරීන් විසින් මානවක බාලදක්ෂ නායක සමග සාකච්ඡා කොට, එය නිරාකරණය කර ගත යුතුය.

11) මානවක සමාජ මණ්ඩලයේ සියලුම නිලධාරීන් වාර්ෂිකව පවත්වනු ලබන මහා සභා රැස්වීමකදී ඡන්දයෙන් තෝරා පත්කර ගත යුතුය.

12) මානවක සමාජ මණ්ඩලයට පත්වූ නිලධාරීන් පිළිබඳ ලිඛිත වාර්තාවක්, ගරු. ලේකම්, ගරු සභාපති හා මානවක බාලදක්ෂ නායක විසින් අනුමත කර, දිසා කොමසාරිස් තුමා හා මානවක කටයුතු බාර සහය දිසා කොමසාරිස් තුමා වෙත, මහා සභා රැස්වීම පවත්වා දින 7 ක් තුළදී බාරදීමට ගරු. ලේකම් තුමා කටයුතු කළ යුතුය.

13) මහා සභා රැස්වීමට දිසා කොමසාරිස් තුමා හා/හෝ එතුමාගේ අනුදැනුම මත දිසා නිලධාරියෙකු සහභාගි වී තිබීම අත්‍යාවශ්‍ය සාධකයකි. ජාතික මූලස්ථානයේ නිලධාරියෙකු සහභාගි වන්නේ නම් ඒ සඳහා දිසා කොමසාරිස් තුමාගේ අනුමැතිය ලබා ගත යුතුය.

14) මානවක සමාජ මණ්ඩලය දෙමසකට වරක්වත් රැස්වී, පසුගිය රැස්වීමේ සිට මේ දක්වා ක්‍රියාත්මක කළ වැඩ සටහන් පිළිබඳ කෙටි සමාලෝචනයක් කළ යුතු අතර, ඉදිරි මාස කිහිපය සඳහා වැඩ සටහන් හා ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතුය.

15) මානවක සමාජ මණ්ඩලයේ අමතර වගකීම් වනුයේ:
   (1) සාමාජිකයින්ගේ විනය ආරක්ෂා කර ගැනීම
   (2) මානවකයින් සඳහා සුදුසු කැපකරුවන්/අනුග්‍රාහකයින් පත් කිරීම

(3) අවශ්‍ය පරිදි මානවක අනුග්‍රාහකයින්ගේ සාක්ෂි කැඳවීම, විමර්ශණය කිරීම හා ඒ අනුව, අවශ්‍ය වෙතොත්, මානවක අනුගාමිකයින් දැනුවත් කොට කරුණු පහදා දීම.
(4) මානවක අනුගාමිකයින්ගේ දිවුරුම් දීමේ උත්සව සංවිධානය කිරීම.
(5) පදක්කම්, ප්‍රදාන හා තරග සඳහා විෂය නිර්දේශ අනුමත කිරීම, ඒවායේ ප්‍රගතිය පරීක්ෂා කිරීම හා සමත් කිරීම.

16) මානවක සමාජ මණ්ඩලය විසින් මානවකයින්ගේ 'බේඩන් පවල් ප්‍රදානය' දිනා ගැනීම දක්වා වූ ප්‍රගති පදක්කම් මාර්ගය අධීක්ෂණය කිරීම අතිශයින් වැදගත් වේ.

17) ගරු ලේකම් විසින් රැස්වීම් සඳහා මානවකයින්ගේ සහභාගීත්වය දැක්වෙන, වේලාව හා අත්සන සහිත ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

18) අවශ්‍යතාවයක් වෙතොත්, ගරු ලේකම් තුමා විසින් එම ලේඛනය හෝ එහි පිටපතක්, බී.පී.ප්‍රදානයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට වගකීමෙන් බැඳී සිටී.

19) ගරු ලේකම් විසින් මණ්ඩලයේ රැස්වීම් වාර්තා සකස් කිරීමටත්, පසුගිය වාර්තා ඉදිරිපත් කිරීමටත් කටයුතු කළ යුතුය.

20) විනිවිද භාවයෙන් යුතුව ගිණුම් වාර්තා පවත්වාගෙන යාම, ලදු පත් ගොණු කර තිබීම, මණ්ඩලයේ රැස්වීම් සඳහා සංක්ෂිප්ත අය-වැය සටහනක් ඉදිරිපත් කිරීම හා විගණනය කළ වාර්ෂික ගිණුම් වාර්තාව මහ සභා රැස්වීමට ඉදිරිපත් කිරීම, ගරු භාණ්ඩාගාරික තුමාගේ වගකීම වනු ඇත.

## 26. මානවක සමාජ මණ්ඩල රැස්වීමක න්‍යාය පත්‍රය
## Agenda for Rover Crew-in Council Meeting

1) ආගම සිහිකිරීම
2) බාලදක්ෂ පොරොන්දුව ගැනීම
3) රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ ප්‍රතිඥාව
4) දැන්වීම් හා ලිපි කියවීම
5) පසුගිය රැස්වීමේ වාර්තාව ඉදිරිපත් කිරීම, සංශෝධන හා වාර්තාව සහා සම්මත කිරීම
6) පසුගිය වාර්තාවෙන් පැන නගින කරුණු
7) අය-වැය වාර්තාව ඉදිරිපත් කිරීම, සංශෝධන හා අය-වැය වාර්තාව සහා සම්මත කිරීම

8) පසුගිය රැස්වීමෙන් පසු මේ දක්වා කරන ලද කර්තව්‍යයන්
9) ඉදිරි මාස 2 තුළදී අපේක්ෂිත වැඩ කටයුතු
10) පදක්කම් හා ප්‍රදාන
11) මානවක අනුග්‍රාහකයින්ගේ සාක්ෂි දැරීම්
(මෙම අවස්ථාවට දිවුරුම් දුන් මානවකයින් හා මානවක නායකයින් පමණක් සහභාගි විය යුතුය.)
12) මානවක බාලදක්ෂ නායකගේ කතාව /උපදෙස්
13) විසිර යාම

## 27. මානවක මූලික
## Rover Mate (RM)

1) මානවක සමාජ මණ්ඩලයේ සභාපති ලෙස පත්වන මානවකයා 'මානවක මූලික' (Rover Mate) ලෙසද නිල බලයෙන් පත්වේ.

2) මානවක බාලදක්ෂ නායක හෝ සහාය මානවක නායකයින් සහභාගි විය නොහැකි හදිසි අවස්ථාවලදී මානවක මූලික විසින් තාවකාලිකව මානවකයින්ගේ මූලිකත්වය ගත යුතුය.

3) තම මානවක සමාජය නියෝජනය විය යුතු වැදගත් රැස්වීම්වලදී හෝ ක්‍රියාකාරකම්වලදී ඒ සඳහා සහභාගි වීමට, මානවක බාලදක්ෂ නායකගේ අවසරය මත, මානවක මූලිකට අවස්ථාව සලසා දීම වඩාත් සුදුසුය.

4) මානවක සමාජ මණ්ඩලයේ ගරු ලේකම්, භාණ්ඩාගාරික වැනි නිලධාරීන්, අවශ්‍ය අවථාවලදී සහාය මානවක මූලිකයින් (Assistant Rover Mates) ලෙස මානවක මූලිකට සහාය වීමට පත් කර ගත හැකිය.

5) අධිකාරී පත්‍රයක් සහිත මානවක බාලදක්ෂ නායකයෙකු හෝ සහාය මානවක නායකයෙකු නොමැති අවස්ථාවලදී, සහාය දිසා කොමසාරිස් (මානවක) හෝ දිසා මානවක බාලදක්ෂ නායක යන අයෙකුගේ අනුමැතිය හා අධීක්ෂණය යටතේ මානවක ක්‍රියාකාරකම් ඉදිරියට පවත්වාගෙන යාමට මානවක මූලිකට හා සහාය මානවක මූලිකයින්ට අවසර ඇත.

6) ඉහත 5) පරිදි, මානවක මූලික ඇතුළු මානවක සමාජ මණ්ඩලයේ නිර්දේශය මත, සහාය දිසා කොමසාරිස් (මානවක) හෝ දිසා මානවක බාලදක්ෂ නායක යන අයට, අත්‍යාවශ්‍ය ලිපි ලේඛන හා පදක්කම් පත්‍රිකා පරීක්ෂා කර බලා, තම අත්සන යොදා අනුමත කළ හැක.

## 28. මානවක නායකත්ව මණ්ඩලය
## Rover Scouters' Council (RSC)

1) මානවක සමාජ මණ්ඩලය යනු මානවක සමාජයේ ප්‍රධාන පරිපාලනමය රැස්වීම වන්නේය.

2) මානවක බාලදක්ෂ නායක, සහාය මානවක නායකයින් හා මානවක උපදේශකයයින් ඒකාබද්ධව මානවක නායකත්ව කවුන්සිලය පවත්වාගෙන යනු ලැබේ.

3) අවශ්‍යතාවය මත, සමූහ බාලදක්ෂ නායකට සහ අනිකුත් අංශවල බාලදක්ෂ නායකයින්ට කවුන්සිල රැස්වීම සඳහා සහභාගි විය හැක.

4) මෙම රැස්වීමේ මූලිකත්වය දරනු ලබන්නේ මානවක බාලදක්ෂ නායක විසිනි.

5) මානවක කටයුතු කෙරෙහි බලපාන සියළු කරුණු කාරණා පිළිබඳව, විශේෂයෙන් නායකත්ව පුහුණුව, විශේෂිත පදක්කම් හා ප්‍රදානයන් පිළිබඳවත්, මානවක ක්‍රියාකරකම් සඳහා සහයෝගය ලබා දීම පිළිබඳවත්, මෙම කවුන්සිලය අවධානය යොමු කළ යුතුය.

6) තවද මානවකයින්ගේ විනය පිළිබඳව මෙහි පූර්ණ අවධානය යොමු විය යුතු අතර, විනය කඩකිරීම්වලදී ගත යුතු පියවර මෙහිදී සාකච්ඡා කර තීරණය කළ හැක.

7) සාකච්ඡා වන සියළු කරුණු හා ගනු ලබන තීරණ වාර්තාගත විය යුතු අතර පැමිණි සාමාජිකයින්ගේ නම් වාර්තාවට ඇතුළත් විය යුතුය.

8) අවම වශයෙන් දෙමසකට වරක් රැස්වීම් කැඳවනු ලැබේ.

## 29. දිස්ත්‍රික් මානවක මණ්ඩලය
## District Rover Council (DRC)

1) දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති සෑම මානවක සමාජයකම, මානවක සමාජ මණ්ඩලයේ සභාපති (මානවක මූලික), ලේකම් හා භාණ්ඩාගාරික යන තිදෙනා හා මානවක බාලදක්ෂ නායක හා සහාය මානවක බාලදක්ෂ නායකයින් (බලපත්‍ර ලත්) යන අය, දිස්ත්‍රික් මානවක මණ්ඩලයේ නිත්‍ය සාමාජිකයින් වන්නේය.

2) ඊට අමතරව, සහාය දිසා කොමසාරිස් (මානවක), සහාය දිසා කොමසාරිස් (බාලදක්ෂ බාලිකා කටයුතු) හා දිස්ත්‍රික් මානවක බාලදක්ෂ නායකයින් නිල බලයෙන් මෙහි සාමාජිකත්වය දරති.

3) දිස්ත්‍රික් මානවක මණ්ඩල රැස්වීම් පිළිබඳව දිසා කොමසාරිස් තුමා දැනුවත් කළ යුතු අතර, දිසා කොමසාරිස් තුමාටත්, අනිකුත් සහාය දිසා කොමසාරිස් වරුන්ටත් අවශ්‍යතාවය මත මණ්ඩල රැස්වීම සඳහා සහභාගි විය හැක.

4) දිසා මානවක මණ්ඩලයේ සභාපති ලෙස සහාය දිසා කොමසාරිස් (මානවක) තම නිල බලයෙන් පත්වන අතර ඔහු/ඇය විසින් සභාවේ මුලසුන හොබවනු ලැබේ.

5) ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරික නිලතල සඳහා සභාවේ වැඩි මනාපයෙන්, කොමසාරිස්වරුන් සහ/හෝ දිසා නායකයින් අතුරෙන් (මානවකයින් හැර) සුදුස්සන් පත් කර ගනු ලැබේ.

6) මෙහි ප්‍රධාන වගකීම් වනුයේ, දිසා කොමසාරිස්තුමගේ අනුමැතියට යටත්ව:
   (1) දිසා මට්ටමෙන් මානවක ක්‍රියාකාරකම් හා වැඩ සටහන් සංවිධානය කිරීම.
   (2) ජාතික මට්ටමේ වැඩ සටහන් සඳහා දායකත්වය ලබා දීම.
   (3) දිස්ත්‍රික්/ජාතික මට්ටමේ තරගාවලියන් හා සහභාගිත්වයන් සඳහා මානවකයින් නිර්දේශ කිරීම
   (4) විදේශ චාරිකා සඳහා සුදුස්සන් තේරීම හා නිර්දේශ කිරීම
   (5) විශේෂිත පදක්කම් හා ප්‍රදාන සඳහා නිර්දේශ කිරීම

7) ගරු සභාපති, එනම් සහාය දිසා කොමසාරිස් (මානවක) උපදෙස් මත, ගරු ලේකම් විසින් අවම වශයෙන් තුන් මසකට වරක් රැස්වීම් කැඳවනු ලැබේ.

8) මෙහිදී පසුගිය රැස්වීමේ සිට මේ දක්වා සිදු කරන ලද මානවක කටයුතු හා වැඩ සටහන් පිළිබඳ සමාලෝචනයක් කිරීමත්, ඉදිරි මානවක වැඩ සටහන් සැලසුම් කිරීමත් සිදු වේ.

9) ගරු ලේකම් විසින් රැස්වීම් වාර්තා හා පැමිණීම් ලේඛනය පවත්වා ගෙන යා යුතු අතර, අයවැය වාර්තා ක්‍රමවත්ව පවත්වාගෙන යාම ගරු භාණ්ඩාගාරික ගේ වගකීමකි.

## 30. කාලීන සටහන් පොත (ලොග් පොත)
## Log Book

1) සියළුම මානවකයින් විසින්, තමන් මානවක සමාජයට ඇතුළත් වූ දින සිට කාලීන සටහන් පොතක් පවත්වාගෙන යා යුතු අතර, මානවක රැස්වීම්, මානවක සමාජ මණ්ඩල රැස්වීම්, ක්‍රියාකාරකම් හා වැඩසටහන්, සහභාගිවන්නන් කිහිප දෙනෙකුගේ අත්සන් සහිතව, තම කාලින සටහන් පොතේ වාර්තා කර තිබිය යුතුය.

2) සෑම ලොග් සටහනකම, පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතුය:
   (1) ආරම්භ කළ හා අවසාන කළ දිනය / දින
   (2) ආරම්භ කළ හා අවසාන කළ වේලාවන්
   (3) පවත්වන ලද ස්ථානය
   (4) සහභාගී වූවන්ගේ නම්
   (5) ක්‍රියාකාරකම හෝ වැඩ සටහන පිළිබඳ සංක්ෂිප්ත විස්තරය
   (6) සහභාගි වූවන් හෝ නිළධාරීන් කිහිප දෙනෙකු කෙටි සටහන් / අත්සන්

## 31. මානවක අවධින්
**Rover Stages**

මානවක බාලදක්ෂ යොවුන් වැඩ සටහන තුළ මානවකයින් සඳහා අවධි 4ක් අන්තර්ගත වේ.

| | |
|---|---|
| 1) මානවක ආධුනික අවධිය | (වයස අවු. 17 ½ - 26) |
| 2) මානවක අනුගාමික අවධිය | (වයස අවු. 18 - 26) |
| 3) මානවක බාලදක්ෂ අවධිය | (වයස අවු. 18 - 26) |
| 4) මානවක උපදේශක අවධිය | (වයස අවු.26 ට වැඩි හෝ අවු.20½ට වැඩි බී.පී.ප්‍රදාන ලාභීන්) |

## 32. මානවක ආධුනික අවධිය
**Rover Recruit Stage**

මානවක සමාජයට අනුයුක්ත වූ දින සිට මානවක සාමාජිකත්ව පදක්කම දිනා ගනිමින් එය ප්‍රථම වරට තම නිල ඇඳුමේ පළඳින දිනය දක්වා වූ කාල පරාසයයි.

**ආධුනිකයෙකු ලෙස මානවක සමාජයට අනුයුක්ත වීම** *17 1/2 - 26*

↓

**මානවක සාමාජික පදක්කම** *17 1/2 - 26*

↓

**මානවක අනුගාමිකයෙකු ලෙස උසස් වීම** *17 1/2 - 26*

## 33. මානවක අනුගාමික අවධිය
## Rover Squire Stage

මානවක සාමාජික පදක්කම ප්‍රදානය කළ දින සිට මානවක දිවුරුම දුන් දිනය (අභිෂේක දිනය) දක්වා වූ කාල පරාසයයි.

**මානවක අනුග්‍රාහකයෙකුගේ අධීක්ෂණයට ලක් වීම** *17 1/2 - 26*

↓

**මානවක පරමාදර්ශී පදක්කම** *17 1/2 - 26*

↓

**මානවක දිවුරුම් දීම** *18 - 26*

## 34. මානවක බාලදක්ෂ අවධිය
## Rover Scout Stage

මානවක බාලදක්ෂයෙකු ලෙස දිවුරුම් දුන් දින සිට බී.පී.ප්‍රදානය දිනා ගන්නා තෙක් ඇති කාල පරාසයයි.

**මානවක ප්‍රවීණතා තරු (4)** *18 - 26*

↓

**වඩා යහපත් ලොවක් සඳහා වූ අභිලාෂ රාමුව (7)** *17 1/2 - 26*

↓

**ප්‍රථමාධාර සේවා පදක්කම** *17 1/2 - 26*

↓

**යහපත් පුරවැසි පළඳනාව** *19 1/2 - 26*

↓

**බේඩින් පවල් ප්‍රදානය (විශිෂ්ඨතම සම්මානය)** *20 1/2 - 26*

## 35. මානවක උපදේශක අවධිය
## Rover Instructor Stage

බී.පී. ප්‍රදානය දිනා ගැනීමෙන් පසුව, හෝ බී.පී. ප්‍රදානය දිනා නොගත් ආදි-මානවකයින්ට හෝ ආදි-බාලදක්ෂයින්ට, මානවක බාලදක්ෂ නායක අනුමැතියට යටත්ව, මානවක උපදේශකයකු විය හැකිය.

# 36. මානවකයින් සඳහා ප්‍රගති පදක්කම් හා ප්‍රදානයන්
## Progressive Badges & Awards for Rovers

| පදක්කම | අවශ්‍යතාවන් හා<br>කාල පරාසය (අවම) |
|---|---|
| **මානවක සාමාජිකත්ව පදක්කම්**<br>**Rover Membership Badges** *(RMB)*<br>*(වයස අවු. 17½ - 26)*<br> <br> | **මානවක ආධුනිකයෙකු ලෙස:**<br>• මාස 1ක සේවාව<br>• මානවක සමාජ රැස්වීම් 2කට සහභාගි වී තිබීම<br>*(38 පරිච්ඡේදය)* |
| **මානවක පරමාදර්ශී පදක්කම**<br>**Rover Ideals Badge** *(RIB)*<br>*(වයස අවු. 17½ - 26)*<br> | **මානවක අනුගාමිකයෙකු ලෙස:**<br>• මාස 1ක සේවාව<br>• මානවක සමාජ රැස්වීම් 2කට සහභාගි වී තිබීම<br>• මානවක අනුග්‍රාහකයෙකු යටතට පත්ව සිටීම.<br>*(39 පරිච්ඡේදය)* |
| **මානවක බාලදක්ෂ දිවුරුම් දීම**<br>**Rover Scout Investiture** *(RSI)*<br>*(වයස අවු. 18 - 26)*<br> | **මානවක අනුගාමිකයෙකු ලෙස:**<br>• මාස 6ක සේවාව<br>• මානවක සමාජ රැස්වීම් 9කට සහභාගි වී තිබීම.<br>• මානවක අනුග්‍රාහකයෙකු යටතේ මාස 6ක අධීක්ෂණය<br>**ජනාධිපති හෝ අග්‍රාමාත්‍ය බාලදක්ෂයින් සඳහා:**<br>**මානවක අනුගාමිකයෙකු ලෙස:**<br>• මාස 4ක සේවාව<br>• මානවක සමාජ රැස්වීම් 6කට සහභාගි වී තිබීම.<br>• මානවක අනුග්‍රාහකයෙකු යටතේ මාස 4ක අධීක්ෂණය<br>*(40 පරිච්ඡේදය)* |

**මානවක ප්‍රවීණතා තරු**

**Rover Proficiency Stars** *(RPS)*

*(වයස අවු. 18 - 26)*

**(1)** *RPS-01-* **ව්‍යාපෘති තරුව**
**Project Star**



**(2)** *RPS-02 -* **ගවේෂක තරුව**
**Rambler Star**



*(මානවකයින් සඳහා)*
*RPS-02R*



*(ගුවන් මානවකයින් සඳහා)*
*RPS-02A*



*(මුහුදු මානවකයින් සඳහා)*
*RPS-02S*

**(3)** *RPS-03 -* **බාලදක්ෂ ශිල්පීය තරුව**
**Scoutcraft Star**



**(4)** *RPS-04 -* **නායකත්ව තරුව**
**Leadership Star** -



*1)* මානවක බාලදක්ෂයෙකු ලෙස (දිවුරුම් දීමෙන් පසු) දිනා ගත හැකිය.
*2)* විවිධ අවධිවලදී, මෙම තරු 4 දිනා ගැනීම අනිවාර්යය වේ.
*3)* එක් එක් තරුව සඳහා අවම කාලය මාස 6කි.
*4)* එක් තරුවක් ආරම්භ වී මාස 4කට පසු, ඊට සමගාමීව, තවත් තරුවක කටයුතු ආරම්භ කළ හැකිය.
*5)* ඉහත (4) ක්‍රමවේදය අනුව, තරු 2ක කටයුතු (පමණක්) එකිනෙකට සමගාමීව පවත්වාගෙන යාහැකිය

*(43-47 පරිච්ඡේද)*

<table>
<tr>
<td>

**ප්‍රථමාධාර සේවා පදක්කම**<br>
**First Aid Service Badge** *(FSB)*<br>
*(වයස අවු. 17 ½ - 26)*




</td>
<td>

1) **මානවක අනුගාමිකයෙකු ලෙස** මෙම පදක්කම දිනා ගැනීම ආරම්භ කළ හැකිය.
2) මෙම පදක්කම අනිවාර්යය පදක්කමකි.

*(48 පරිච්ඡේදය)*

</td>
</tr>
<tr>
<td>

**වඩා යහපත් ලොවක අභිලාෂ රාමුව - ජාත්‍යාන්තර පදක්කම්**<br>
**Better World Framework Initiatives - International Badges** *(BWF-01-07)*<br>
*(වයස අවු. 17 ½ - 26)*

(1) *BWF-01-* **සාමයේ පණිවුඩකරුවෝ - මුදු පදක්කම -** ***Ring Badge Messenger of Peace (MOP)***




(2) *BWF-02 –* **විශ්ව බාලදක්ෂයෝ ප්‍රදානය** ***Scouts of the World Award (SWA)***




</td>
<td>

1) **මානවක අනුගාමිකයෙකු ලෙස** මෙම පදක්කම් දිනා ගැනීම ආරම්භ කළ හැකිය.
2) මෙම තරු 7 දිනා ගැනීම අනිවාර්යය නොවේ.
3) එක් එක් පදක්කම සඳහා අවම කාලය විෂය නිර්දේශයේ සඳහන් කර ඇත.
4) එක් තරුවක් ආරම්භ වී මාස 4කට පසු, ඊට සමගාමීව, තවත් තරුවක කටයුතු ආරම්භ කළ හැකිය.
5) පදක්කම් 2ක කටයුතු (පමණක්) එකිනෙකට සමගාමීව පවත්වාගෙන යා හැකිය

*(58-65 පරිච්ඡේදය)*

</td>
</tr>
</table>

(3) *BWF-03* - **පැට්‍රිමොනිටො (ලෝක උරුම ගවේෂක) බාලදක්ෂ පදක්කම**
***PATRIMONITO Scout Badge (PSB)***



(4) *BWF-04* – **සොබාදහමේ ශූරතා අභියෝගය**
***Champions for Nature Challenge (CNC)***



(5) *BWF-05* - **ටයිඩ් ටර්නර් ප්ලාස්ටික් අභියෝගය (පරිසර සංරක්ෂණ)**
***Tide Turner Plastic (TTP)***




(6) ***BWF-06* - සූර්ය බලශක්ති බාලදක්ෂ අභියෝගය *(මට්ටම-03)***
***Scouts Go Solar Challenge (SSC)***




(7) *BWF-07*- **සාමය සඳහා සංවාදය**
***Dialogue for Peace (DOP)***




1) **මානවක අනුගාමිකයෙකු ලෙස** මෙම පදක්කම් දිනා ගැනීම ආරම්භ කළ හැකිය.
2) මෙම තරු 7 දිනා ගැනීම <u>අනිවාර්යය නොවේ</u>.
3) එක් එක් පදක්කම සඳහා අවම කාලය විෂය නිර්දේශයේ සඳහන් කර ඇත.
4) එක් තරුවක් ආරම්භ වී මාස 4කට පසු, ඊට සමගාමීව, තවත් තරුවක කටයුතු ආරම්භ කළ හැකිය.
5) පදක්කම් 2ක කටයුතු (පමණක්) එකිනෙකට සමගාමීව පවත්වාගෙන යා හැකිය

*(58-65 පරිච්ඡේදය)*

| | |
|---|---|
| **යහපත් පුරවැසි පළඳනාව**<br>**Good Citizen's Decoration** *(GCD)*<br>*(වයස අවු. 19½ - 26)*<br> | **මානවක බාලදක්ෂයෙකු ලෙස (දිවුරුම් දීමෙන් පසු):**<br>*1)* මානවක සමාජ රැස්වීම 18.<br>*2)* මානවක සමාජ මණ්ඩල රැස්වීම් 9.<br>*3)* මාස 18ක සේවාව.<br>*(49 පරිච්ඡේදය)* |
| **බේඩ්න් පවල් ප්‍රදානය**<br>Baden Powell Award *(BPA)*<br>*(වයස අවු. 20½ - 26)*<br><br><br><br> | **මානවක බාලදක්ෂයෙකු ලෙස (දිවුරුම් දීමෙන් පසු):**<br>*1)* මානවක සමාජ රැස්වීම 30.<br>*2)* මානවක සමාජ මණ්ඩල රැස්වීම් 15.<br>*3)* මාස 30ක සේවාව.<br>*(50-52 පරිච්ඡේද)* |
| **මානවක උපදේශක පදක්කම**<br>**Rover Instructor Badge** *(RIB)*<br><br> | • *වයස 20 ½* ට ඉක්ම වූ, බී.පී.ප්‍රදාන ධාරීන්<br>• *වයස 26* ට ඉක්ම වූ, ආදි-මානවකයින් හෝ ආදි-බාලදක්ෂයින්.<br>• මා.බා.නා. අනුමැතිය තිබිය යුතුයි.<br>• නායකයෙකු ලෙස බලපත්‍ර ලබා ගත් පසු මෙම පදක්කම පැළඳිය නොහැක.<br>*(53 පරිච්ඡේදය)* |

| | |
|---|---|
| **මානවක නිල ඇඳුමේ පැළඳිය හැකි ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ ප්‍රදානයන්**<br>**Senior Scouts Achievements in Rover Uniform** | • ජනාධිපති ප්‍රදානය හෝ අග්‍රාමාත්‍ය ප්‍රදානය දිනා ඇත්නම්, එම පදක්කම් දෙකෙන් ඉහල පදක්කම පමණක් පැළඳිය හැක.<br>• බේඩන් පවල් ප්‍රදානය හා සමගාමීව පැළඳිය හැකිය.<br>• වයස අවුරුදු 26 සම්පූර්ණ වන තෙක් පැළඳිය හැක.<br>*(71 පරිච්ඡේදය)* |

## 37. මානවක සමාජයට ඇතුලත් වීමේ ක්‍රමවේදය
## Method for Admission to a Rover Crew

1) මානවක සමාජයක සාමාජිකත්වය, බාලදක්ෂයෙකු ලෙස කටයුතු කළ තරුණ-තරුණියන්ට පමණක් නොව කිසිදු බාලදක්ෂ අත්දැකීමක් නොමැති තරුණ-තරුණියන්ටද විවෘතය.

2) ඇතුළුවීම සඳහා තෝරාගත් මානවක සමාජයේ මානවක බාලදක්ෂ නායක මහතා/මහත්මිය හමුවී 'මානවක සමාජයකට ඇතුලුවීමේ අයැදුම් පතක්' *(77 පරිච්ඡේදය)* සම්පූර්ණ කර ඔහු/ඇය වෙත බාරදිය යුතුය.

SRI LANKA SOUT ASSOCIATION
ROVER SCOUT SECTION
APPLICATION FOR ADMISSION TO THE ROVER CREW

3) ඉන් අනතුරුව, මානවක සමාජයේ මානවක රැස්වීම් සඳහාත්, ක්‍රියාකාරකම් සඳහාත් ඔවුන්ට සහභාගි විය හැක.

4) මානවක බාලදක්ෂ නායක විසින් එම අයැදුම්පතේ පිටපතක්, සහාය දිසා කොමසාරිස් (මානවක) වෙත දින 14ක් ඇතුළත බාර දිය යුතු වේ.

5) එලෙසම, මානවක බාලදක්ෂ නායක විසින්, 'මානවක බාලදක්ෂ ප්‍රගති වාර්තාවේ' *(87 පරිච්ඡේදය)* පිටපතක්, දිස්ත්‍රික්කයේ පදක්කම් ලේකම් වෙත යොමුකර, ලියාපදිංචි කිරීමට පියවර ගත යුතුය.

6) මේ අනුව දිස්ත්‍රික් හෝ ජාතික බාලදක්ෂ මූලස්ථානය මගින් මානවකයින් පිළිබඳ සංගණන වාර්තා ඉල්ලා සිටින අවස්ථාවලදී එය ලබා දීමට හැකියාව ලැබෙන්නේය.

## 38. මානවක සාමාජික පදක්කම (ඇතුළත් වීමේ පරීක්ෂණය)
**Rover Membership Badge (Admission Test) -** *RMB*

*(වයස 17 ½ - 26)*




මානවක ආධුනිකයෙකු ලෙස (මානවක සමාජයට ඇතුළුවීමෙන් පසු) පහත අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය:

1) බාලදක්ෂ නීතිය හා පොරොන්දුව
2) බාලදක්ෂ ආචාරය හා සලකුණ
3) බාලදක්ෂ ව්‍යාපාරයේ නිර්මාතෘවරයා
4) ලෝක බාලදක්ෂ සංවිධානය
5) ශ්‍රී ලංකාවේ බාලදක්ෂ ඉතිහාසය
6) ජාතික කොඩිය හා ජාතික ගීය
7) විධානයන්, පෙළ සෑදීම්, හස්ත හා නලා සංඥා
8) 'හානියෙන් සුරක්ෂාව' ප්‍රකාශනයේ 12-මට්ටම යටතේ (1) සිට (3) අන්තර්ගතය අවබෝධ කර ගැනීම. *(54 පරිච්ඡේදය)*
9) මාස 1ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හා අවම වශයෙන් මානවක සමාජ රැස්වීම් 2කට සහභාගි වී තිබීම.

## 39. මානවක පරමාදර්ශී පදක්කම
Rover Ideal Badge - *RIB*

*(වයස 17 ½ - 26)*




මානවක අනුගාමිකයෙකු ලෙස (මානවක සාමාජික පදක්කම් ලැබීමෙන් පසු) පහත අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

1) බාලදක්ෂ පොරොන්දුව හා නීතිය මත ගැඹුරින් පිහිටා මානවක පරමාදර්ශ ප්‍රගුණ කරමින් ජීවත් වීම,

(1) **ගෞරවය (Honour)**
සියළු දෙනාගේම විශ්වාසය දිනා ගනිමින්, ආත්ම ගරුත්වය සුරකිමින්, ආදර්ශමත් ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීම

(2) **දැහැමි බව (Spirituality)**
තම ධර්මානුකූලව, ප්‍රේමය හා දයා කරුණාව සැමට හුවා දක්වමින්, දහම කෙරෙහි යුතුකම් නොපිරිහෙලා ඉටු කරමින් දැහැමි ජීවිතයක් ගත කිරීම හා සියළු ආගමිකයන් සමග සංහිඳියාවෙන් කටයුතු කිරීම.

(3) **දේශ ප්‍රේමීත්වය (Patriotism)**
ප්‍රයෝජනවත් පුරවැසියෙකු ලෙස තම මාතෘ භූමිය වෙනුවෙන් වගකීම් බාර ගැනීම, යහපත් පුරවැසියෙකු වශයෙන් තමාගේ යුතුකම් දැන සිටීම හා ජාතික උරුමයන්, සංස්කෘතික හර පද්ධතීන් ආරක්ෂා කිරීමට කැප වීම.

(4) **සේවය (Service)**
අන්‍යයන්ට සේවය කිරීම සඳහා සැමවිටම සූදානමින් සිටීම හා අන්‍යයන්ට මෙන්ම තමාටත්, තම පවුලේ සාමාජිකයින්ටත්, අසල්වැසි සැමටත් හැකි පමණින් සේවය සැලසීම.

(5) **නීති ගරුක බව (Law-abiding)**
බාලදක්ෂ නීතියටත්, තම රටේ නීතියට හා සොබා දහමටත් ගරු කිරීම හා අවනත වීම.

2) බේඩන් පවල් සාමි තුමා විසින් රචිත 'බාලදක්ෂ විද්‍යාව' පොත කියවා තේරුම් ගැනීම.

3) 'හානියෙන් සුරක්ෂාව' ප්‍රකාශනයේ 12-මට්ටම යටතේ 4 සිට 7 අන්තර්ගතය අවබෝධ කර ගැනීම. *(54 පරිච්ඡේදය)*

4) **මානවක අනුග්‍රාහකයෙකුගේ අධීක්ෂණයට පත් කිරීම:**
යහපත් හා ආදර්ශමත් දිවි පෙවෙතක් ගත කරන, දිවුරුම් දී ඇති මානවක බාලදක්ෂයෙකු හෝ ආදි මානවක බාලදක්ෂයෙකු, මාස 6ක කාලයක් සඳහා, තම රුචිකත්වය මත තමන් සඳහා පත්ව සිටීම. (ජනාධිපති බාලදක්ෂයින් හෝ අග්‍රාමාත්‍ය බාලදක්ෂයින් සඳහා මාස 4)

5) මාස 1ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හා අවම වශයෙන් මානවක සමාජ රැස්වීම් 2කට සහභාගි වී තිබීම.

## 40. මානවක බාලදක්ෂ දිවුරුම් දීම

**Rover Scout Investiture** *(RSI)*

*(වයස 18 - 26)*



මානවක අනුගාමිකයෙකු ලෙස පහත අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

1) මානවක පරමාදර්ශී පදක්කම සමත් වී තිබීම.
2) බාලදක්ෂ අංශයේ 'බාලදක්ෂ ප්‍රදානය' දක්වා වූ බාලදක්ෂ ශිල්පීය දැනුම ලබා ගැනීම.
3) බී.පී.තුමා විසින් රචිත 'මානවක කටයුතු තුළින සාර්ථකත්වයට 'අත් පොතෙහි අන්තර්ගත මූලික කරුණු අවබෝධ කර ගැනීම.
4) 'හානියෙන් සුරක්ෂාව' ප්‍රකාශනයේ 13-මට්ටම අන්තර්ගතය අවබෝධ කර ගැනීම. *(55 පරිච්ඡේදය)*
5) මානවක සමාජයට ඇතුළත් වූ දින සිට නිසිපරිදි කාලීන සටහන් පොතක් (ලොග් පොතක්) පවත්වාගෙන යාම.
6) අවම වශයෙන් මාස 6ක කාලයක් මානවක අනුග්‍රාහකයෙකුගේ අධීක්ෂණය යටතේ කටයුතු කර තිබීම. (ජනාධිපති බාලදක්ෂයින් හෝ අග්‍රාමාත්‍ය බාලදක්ෂයින් සඳහා මාස 4ක කාලයක් ප්‍රමාණවත්ය)
7) මාස 6ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම හා අවම වශයෙන් මානවක සමාජ රැස්වීම් 9කට සහභාගි වී තිබීම. (ජනාධිපති බාලදක්ෂයින් හෝ අග්‍රාමාත්‍ය බාලදක්ෂයින් සඳහා මාස 4ක කාලයක් හා මානවක සමාජ රැස්වීම් 6ක් ප්‍රමාණවත් වේ.)

## 41. මානවක අනුග්‍රාහකයා

**Rover Sponsor**

1) මානවක සමාජ මණ්ඩලය මගින්, සෑම මානවක අනුගාමිකයෙකු සඳහාම (මානවක සමාජික පදක්කම ලැබූ) ඔවුන්ගේ අභිමතය පරිදි, මානවක අනුග්‍රාහකයෙකු, පත් කළ යුතුය.

2) මානවක අනුග්‍රාහකයා, තම මානවක සමාජයේ හෝ වෙනත් මානවක සමාජයක, දිවුරුම් දුන් මානවක බාලදක්ෂයෙකු හෝ දිවුරුම් දුන් ආදි මානවක බාලදක්ෂයෙකු විය යුතුය.

3) මානවක අනුග්‍රාහකයා, ආදර්ශමත්, සාමකාමී හා යහපත් සාරධර්ම සහිත පුද්ගලයෙකු විය යුතු අතර තම මානවක අනුගාමිකයාට නිවැරදි මාර්ගෝපදේශයක් සැලසිය හැකි අයෙකු විය යුතුය.

4) බාලිකා/කාන්තා මානවකයින් සඳහා පත්වන මානවක අනුග්‍රාහකයින්, බාලිකාවන්/කාන්තාවන් විය යුතුය.

5) මානවක අනුග්‍රාහකයා විසින් තම අනුගාමිකායා සමග ඉතා සුහද හා විනීත සම්බන්ධතාවයක් ගොඩනගා ගනිමින්, ඔහුගේ/ඇයගේ දුර්වලතා හා ආකල්ප නිවැරදි කරගැනීමට මග පෙන්විය හැකි අයෙකු විය යුතුය.

6) මානවක අනුග්‍රාහකයා විසින් තම අනුගාමිකයා වඩා යහපත් අයෙකු යැයි සෑහීමට පත්වන තුරු, මාස 6කට නො අඩු කාලයක් කැපකරමින් ඔහු/ඇයව අධීක්ෂණය කළ යුතුය. (ජනාධිපති බාලදක්ෂයින් හෝ අග්‍රාමාත්‍ය බාලදක්ෂයින් සඳහා මාස 4කට නො අඩු කාලයක් ප්‍රමාණවත් වේ.)

7) තම කාර්යභාරය අවසන් වූ පසු මානවක අනුග්‍රාහක විසින් මානවක සමාජ මණ්ඩල රැස්වීමකට සහභාගි වී, තම අනුගාමිකයා වෙනුවෙන් සාක්ෂ්‍ය ලබා දිය යුතුය. (එම සාක්ෂ්‍ය මත පදනම් ව දිවුරුම් දීමේ උත්සවය සංවිධානය කළ හැක.)

8) මානවක අනුග්‍රාහක විසින් පහත සඳහන් සාධක මත පිහිටා තම වගකීම් ඉටු කළ යුතුය.
   (1) පවුලේ පසුබිම
   (2) අධ්‍යාපනික හෝ වෘත්තිමය පුහුණුව
   (3) ආකල්ප හා හැසිරීම
   (4) සූදුව, සුරාව, මත්ද්‍රව්‍ය භාවිතය හා දුම් පානයෙන් මිදීම
   (5) පෞද්ගලික සම්බන්ධතා හා විවාහය පිළිබඳ දරණ මතය
   (6) අවංක භාවය හා පක්ෂපාතීත්වය
   (7) අධ්‍යාත්මිකත්වය
   (8) දේශ ප්‍රේමීත්වය
   (9) පිරිසිඳු කම හා ක්‍රමවත් බව
   (10) කණ්ඩායමක් ලෙස එකමුතුව කටයුතු කිරීම.

## **42.** දිවුරුම් දුන් මානවක බාලදක්ෂයෙකු සඳහා වූ ප්‍රගතිය
## Achievements for an Invested Rover Scout

1) දිවුරුම් දුන් මානවක බාලදක්ෂයෙකු විසින් **මානවක ප්‍රවීණතා තරු 4ක්** හා 'වඩා යහපත් ලොවක අභිලාෂ රාමුව' යටතේ වූ **ජාත්‍යන්තර පදක්කම් 7ක්** අතුරෙන් තෝරාගත් පදක්කම් කිහිපයක් දිනා ගනිමින්, ක්‍රමයෙන් 'යහපත් පුරවැසි පළඳනාව' හා 'බේඩන් පවල් ප්‍රදානය' සඳහා වූ අවශ්‍යතා සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.

2) මානවක බාලදක්ෂයෙකු සඳහා වූ ප්‍රගතිය




## **43.** මානවක **ප්‍රවීණතා** තරු
## Rover Proficiency Stars

මානවක ප්‍රවීණතා තරු සඳහා මානවකයින් පරික්ෂා කිරීමේදී, මානවක සමාජ මණ්ඩලය විසින් තම මානවකයින්ගේ දැනුම සලකා බලා ඒ අනුව ඔවුන් විසින් කරගෙන යා යුතු විෂය නිර්දේශයේ මට්ටම නිර්ණය කළ යුතුය.

**ව්‍යාපෘති තරුව**



**ගවේෂක තරුව**



**බාලදක්ෂ ශිල්පීය තරුව**



**නායකත්ව තරුව**



## **44. ව්‍යාපෘති තරුව (RPS-01)**
**Project Star**

*(කාලය: මාස 6)*

1) **නිපුණතා අංගය**

පහත මාතෘකා වලින් 1ක් සම්බන්ධයෙන් කුසලතා වැඩි දියුණු කර ගැනීම.

(1) ඩිජිටල් තාක්ෂණය (Digital Technology) හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාවය (ICT literacy)

(2) තම මව් භාෂාව හැර වෙනත් භාෂාවක් කතා කිරීම, කියවීම, ලිවීම හා තේරුම් ගැනීම.

(3) දෘෂ්‍යාබාධිතයින් සඳහා වූ බ්‍රේල් සංකේත (Brail Coding), **හෝ** ශ්‍රවණාබාධිතයින් සඳහා වූ සංකේත භාෂාව (Sign Language) භාවිතා කළ හැකි වීම.

2) **ගෘහාශ්‍රිත ව්‍යාපෘතිය**

මානවක බාලදක්ෂයා විසින් තම පවුලේ සාමාජිකයින්ට ප්‍රතිලාභ ලැබෙන පරිදි, නිවස පදනම් කරගත් ව්‍යාපෘතියක් දියත් කළ යුතුය. *උදා:* බාල සහෝදර/සහෝදරියන්ට (සහෝදරියන් නොමැති නම් ඥාතීන්ට) ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු වලට සහය වීම, ගෙවතු වගාව

3) **ප්‍රධාන ව්‍යාපෘතිය**

(1) තිරසාර සංවර්ධන අරමුණු (SDGs) හා සම්බන්ධ කරගත් ව්‍යාපෘතියක් කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

(2) මානවක බාලදක්ෂයා විසින් පහත ක්‍රමවේද 2න් එක් ක්‍රමවේදයක් යටතේ, එක් ව්‍යාපෘතියක් තෝරාගත යුතුය:

<u>**ක්‍රමවේදය-1:**</u>

<u>**අධ්‍යාපනික/වෘත්තීමය නැඹුරුවක් සහිත ව්‍යාපෘති:**</u>

මෙම ව්‍යාපෘතිය මානවක බාලදක්ෂයාගේ අනාගත අපේක්ෂාවන් සඳහා ප්‍රයෝජනවත් සහ අදාළ අධ්‍යාපනික හෝ වෘත්තීමය නැඹුරුවක් සහිත ව්‍යාපෘතියක් විය යුතුය.

(එය **NVQ** III හෝ අ.පො.ස. උසස් පෙළ මට්ටමට සරිලන ව්‍යාපෘතියක් විය යුතුය.)

උදා:

a) විදුලි රැහැන් එළීම
b) විදුලි හෝ ඉලෙක්ට්‍රොනික උපකරණ අළුත්වැඩියාව
c) සංගීත භාණ්ඩ අළුත්වැඩියාව
d) වායු සමීකරණය
e) පරිගණක මෘදුකාංග හෝ දෘඩාංග නඩත්තුව
f) CCTV හා ආරක්ෂණ තාක්ෂණය
g) විද්‍යාත්මකව ඇඳුම් මැසීම
h) කේක් සැරසිලි
i) සූප ශාස්ත්‍ර කලාව

හෝ

**ක්‍රමවේදය-2:**
**සමාජ සත්කාරක ව්‍යාපෘති:**
මානවක බාලදක්ෂයා හට හොඳ අධ්‍යාපනික හෝ වෘත්තීමය පසුබිමක් තිබේ නම් ව්‍යාපෘතිය සඳහා පහත මාතෘකාවලින් එකක් තෝරාගත හැක.

උදා-

a) දිළිඳු පවුලකට නිවසක් තනා දීම
b) අනාථ නිවාසයක, විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා වූ පාසලක, වැඩිහිටි නිවාසක ප්‍රජා සංවධර්න කටයුතු
c) ඩෙංගු හෝ ජලභීතිකා රෝගය පැතිරීම වැළැක්වීම

(3) තෝරාගත් ව්‍යාපෘතිය, සැලසුම් කිරීම, සංවිධානය කිරීම සහ මාස 6කට නො අඩු කාලයක් කාලයක් පුරා ක්‍රියාත්මක කිරීම.

(4) **ව්‍යාපෘති යෝජනාව** තුල ව්‍යාපෘති අරමුණු, අවසර ලිපි, අවශ්‍ය මෙවලම් ලැයිස්තුව, සම්පත් සහ ඒවා ලබා ගන්නේ කෙසේද යන්න, අයවැය ඇස්තමේන්තුව, අරමුදල් රැස් කිරීමේ යෝජනා (අවශ්‍ය නම්), වැඩ බෙදා හැරීම (Gantt chart) ආදිය ඇතුළත් විය යුතුය.

(5) **ව්‍යාපෘති** වාර්තාව - අනුමත කළ ව්‍යාපෘති යෝජනාව, ක්‍රියාත්මක කළ දින-වකවානු, මුහුණ දුන් ආකාරය, ගැටලු ජයගත් ආකාරය, ඡායාරූප, ප්‍රස්තාර, අයවැය වාර්තාව, අධීක්ෂණය කළ අයගේ සටහන් හා නිර්දේශ, ආදිය දැක්වෙන ලිඛිත වාර්තාවකි.

## **45.** ගවේෂක තරුව (RPS-02)
**Rambler Star**

*(කාලය: මාස 6)*





i) **නිපුණතා අංගය**

පහත මාතෘකා වලින් 1ක් සම්බන්ධයෙන් කුසලතා වැඩි දියුණු කර ගැනීම.

(1) ජීවිතාරක්ෂක (Life Saving) හා පිහිනුම් (Swimming) නිපුණතා. *(උපදේශකයෙකුගේ අධීක්ෂණය යටතේ)*

(2) සුරක්ෂිත පැවැත්මෙහි නිපුණතා (Survival skills), සිතියම් කියවීම (Mappimg) හා ගෝලීය ස්ථානගත පද්ධතිය (GPS) පිළිබඳ දැනුම.

(3) මහ මාර්ග නීති (Highway Code) හා මාර්ග ආරක්ෂාව (Road Safety) පිළිබඳව දැන සිටීම හා වාහනයක් (හෝ යතුරු පැදියක්) පැදවීමේ හැකියාව. *(උපදේශකයෙකුගේ අධීක්ෂණය යටතේ)*

2) **කඳවුරු අත්දැකීම්**

නුවරඑළිය (පීඩෲ) හෝ මීරිගම (ලී දසනායක) ජාතික බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානවලින් එකක, හෝ බාලදක්ෂ ජම්බෝරියක හෝ දිස්ත්‍රික් රැලියක, අවම වශයෙන් තවත් **මානවක බාලදක්ෂයන්** සහ/හෝ බාලදක්ෂ නායකයින් 3 දෙනෙකුට නොඅඩු පිරිසක් සමග (වයස 18-26 අතර) අවම වශයෙන් රාත්‍රි 2ක් කඳවුරු බැඳ අත්දැකීම් ලබා තිබීම.

**හෝ**

මානවක පර්ෂදයක් සඳහා හෝ ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ කාණ්ඩයක් සඳහා (අවම වශයෙන් සාමාජිකයින් 6 දෙනෙකුට නොඅඩු පිරිසක් සමග) කඳවුරු රාත්‍රි 2ක් සහිත කඳවුරක් සංවිධානය කිරීම, හා අදාළ බාලදක්ෂයින්ට බාලදක්ෂ ශිල්පය හා පුරෝගාමී ක්‍රියාකාරකම් පිළිබඳ පුහුණුවක් ලබා දීම.

3) **ගවේෂණ පා ගමන** (Rambler Hike)

(1) මානවකයින් 4 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක සාමාජිකයෙකු ලෙස, අඛණ්ඩ දින 4ක් ඇතුළත (කඳවුර රාත්‍රි 3ක් සහිතව) කිලෝමීටර් 50ක් ආවරණය වන පරිදි <u>ගවේෂණ පා ගමනක්</u> හෝ, කිලෝමීටර 100ක් ආවරණය වන පරිදි <u>ගවේෂණ පාපැදි ගමනක්</u> සැලසුම් කර, සංවිධානය කර, එයට සහභාගි වීම.

(2) මෙම ගවේෂණ පා ගමන, ගුවන් හා මුහුදු මානවකයින්ද ඇතුළත්ව සියළුම මානවකයින්ට අදාළ වේ.

(3) මානවක බාලිකාවන්/කාන්තාවන් පා ගවේෂණයේ යෙදෙන අවස්ථාවලදී, කාන්තා නායිකාවන් සහ/හෝ දෙමාපියන් විසින් ඔවුන්ගේ ගමන අධික්ෂණය කළ යුතු අතර, ඔවුන්ට කඳවුරු බැඳීමට හා නවාතැන් ගැනීමට ආරක්ෂිත ස්ථාන කලින් පරීක්ෂා කර සූදානම් කර දීමට මොවුන් වග බලා ගත යුතුය.

(4) ගමනට පෙර, ගවේෂණ යෝජනාව, මානවක බාලදක්ෂ නායක හරහා මානවක සමාජ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

(5) ගවේෂණය කළ කරුණු-කාරණා, මුණ දුන් අභියෝග, කඳවුරු අත්දැකීම්, ගමන් මග පිළිබඳ කෙරෙන සවිස්තර පා ගවේෂණ වාර්තාවක්, පරිමාණයට ඇඳි සම්මත ගමන් සිතියමක්ද සමග, ගමන අවසාන වී දින 14ක් ඇතුළත, සහභාගි වූ එක් එක් මානවකයා විසින් වෙන් වෙන්ව, මානවක සමාජ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය.

4) **ගුවන් මානවකයින් සඳහා අතිරේක අවශ්‍යතා**
(පා ගවේෂණයට අමතරව):

(1) ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන්ගේ සහාය ඇතිව, ගුවන් කඳවුරක දී ප්‍රදශර්නය කරනු ලබන ගුවන් යානා පිළිබඳව, පැය 2කට නොඅඩු කාලයක් පුරා, ප්‍රායෝගික අත් දැකීම් හා දැනුම ලබා ගැනීම.

(2) ගුවන් හමුදා නිලධාරියෙකුට හෝ එවැනි නිලධාරියෙකු විසින් පත් කළ පරීක්ෂකයෙකුට, පහත සඳහන් කරුණු තේරුම් ගෙන පැහැදිලි කිරීම

a) Fuselage b) Tail
c) Main plane d) Port and Starboard

(3) "භූමියේ වේගය" (Ground Speed) සහ "ගුවනේ වේගය" (Air Speed) අතර වෙනස සහ ගුවන්ගත කිරීමේදී සහ ගොඩබෑමේ දී සුළඟ භාවිතා කරන ආකාරය පැහැදිලි කිරීම

(4) 'Phonetic Alphabet' තේරුම් ගෙන එය ආදශර්නය කිරීම.

5) **මුහුදු මානවකයින් සඳහා අතිරේක අවශ්‍යතා**
(පා ගවේෂණයට අමතරව):

(1) ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන්ගේ සහාය ඇතිව, පැය 2කට නොඅඩු කාලයක් පුරා ගඟක හෝ වැවක ඔරු පැදීම හෝ බෝට්ටු පැදීම පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම.

(2) නැවක පහත කොටස් පැහැදිලි කිරීමට හැකිවීම
a) AFT b) Fore Castle,
c) Port side d) Starboard Side

(3) නාවිකයන් විසින් "Phonetic Alphabet" භාවිතා කරන්නේ මන්දැයි පැහැදිලි කිරීමට හැකිවීම.

(4) පහත සඳහන් දෑ ආදශර්නය කර ඒවායේ භාවිතය දැන සිටීම.
a) Running Bowline b) Black-wall Hitch
c) Marlin spike Hitch

## 46. බාලදක්ෂ ශිල්පීය තරුව (RPS-03)
**Scout Craft Star**

*(කාලය: මාස 6)*



1) **නිපුණතා අංගය**

පහත මාතෘකා වලින් 1ක් සම්බන්ධයෙන් කුසලතා වැඩි දියුණු කර ගැනීම.

(1) ජෛව විවිධත්ව **සංරක්ෂණය** (Biodiversity) **හා ගෝලීය උෂ්ණත්ව පාලනය** (Global-Warming) සඳහා වූ ජාතික හා ජාත්‍යාන්තර සම්මුති පිළිබඳ අධ්‍යනය හා ඒ සඳහා දායකත්වය

(2) **ප්‍රසිද්ධ කථිකත්වය** හා **තොරතුරු** ඉදිරිපත් කිරීමේ හැකියාව
(Public Speaking & Information Presentation Skills)
දී ඇති මාතෘකාවක් යටතේ විනාඩි 10 ක කතාවක් හා විනාඩි 20ක power point ඉදිරිපත් කිරීමක් සාර්ථකව පැවැත්වීම

(3) **ක්‍රියාකාරී ඉගෙනුම් උපාය** මාර්ග (Active Learning Strategies) - සිසුන් සම්බන්ධ කර ගනිමින්, ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳව නිපුණත්වයක් ලබා ගැනීම, හා එම සිසුන්ගේ ඉගෙනීමේ අරමුණු සාක්ෂාත් කර ගැන්මට සහාය ලබා දීම.

2)

(1) **ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් පවත්වනු ලබන අදියර-I වැඩිහිටි නායක පුහුණු පාඨමාලාවක්** (මානවක අංශයේ හැර) හා, ඊට අදාළ අදියර-1 සම්මන්ත්‍රණය සාර්ථකව හදාරා, බාලදක්ෂ ඒකක නායකයෙකු ලෙස අධිකාරි පත්‍රයක් ලබා ගැනීමට සුදුස්සෙකු වීම. (සැලකිය යුතුයි: අධිකාරි පත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය නොවේ.)

(2) බාලදක්ෂ කණ්ඩායමකට සරිලන සේ, නැවුම් අදහස් හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිතව, කණ්ඩායම් රැස්වීම් වැඩ සටහන් 2ක් සකස් කර එම වැඩ සටහන්, බාලදක්ෂ නායකයෙකුගේ මග පෙන්වීම යටතේ එම කණ්ඩායමේ ක්‍රියාත්මක කර පෙන්වීම.

3) පහත ක්‍රමවේද 2න් එකක් තෝරාගත යුතුය:

<u>ක්‍රමවේදය-1</u>:

**බාලදක්ෂ ඒකකයක නායකත්වය (අධිකාරී පත්‍ර ලත්)**

(1) අදියර-I වැඩිහිටි නායක පුහුණුව සාර්ථකව හදාරා, බාලදක්ෂ ඒකක නායකයකු හෝ සහාය නායකයෙකු ලෙස, ජාතික බාලදක්ෂ මූලස්ථානය මගින් නිකුත් කරනු ලබන අධිකාරී පත්‍රයක් ලබා ගැනීම. (මානවක අංශයේ හැර වෙනත් අංශයක)

(2) අධිකාරී පත්‍ර ලත් නායකයෙකු හෝ සහාය නායකයෙකු ලෙස අවම වශයෙන් මාස 4කට නො අඩු කාලයක් තුළ බාලදක්ෂයින්, පෝතක බාලදක්ෂයන් හෝ සි‍ංහ්ති බාලදක්ෂයින් පිරිසක් පුහුණු කිරීමට සහය ලබා දීම හා අවම වශයෙන් ඔවුන්ගෙන් 6 දෙනෙකුට පහත සඳහන් ප්‍රදානයන් ලබා ගත හැකි වීම.

a) සාමාජිකත්ව පරීක්ෂණය සමත් වීම හා සාමාජිකත්ව පදක්කම් පැළඳවීම

b) අදාල අංශයේ මීළඟ මට්ටමේ ප්‍රගති පදක්කම සඳහා ඔවුන් සුදුසුකම් ලැබීම.

උදා: බාලදක්ෂයින් සඳහා බාලදක්ෂ ප්‍රදානය, පෝතක බාලදක්ෂයන් සඳහා ලෝකඩ තරුව, වැනි

**හෝ**

<u>**ක්‍රමවේදය-2**</u>**:**

**යහපත් ලොවක් සඳහා වූ අභිලාෂ රාමුව** *(58-65 පරිච්ඡේද)* යටතේ ඇති පහත සඳහන් පදක්කම් 5 අතුරෙන් <u>එකක්</u> සමත් වීම:

BWF-02. විශ්ව බලදක්ෂයෝ ප්‍රදානය
BWF-03. පැම්මොනිටො (ලෝක උරුම) බාලදක්ෂ පදක්කම
BWF-04. සොබාදහම් ශූරතා අභියෝගය
BWF-05. ටයිඩ් ටර්නර් ප්ලාස්ටික් අභියෝගය
BWF-06. සූර්ය බලශක්ති බාලදක්ෂ අභියෝගය

සැලකිය යුතුයි:

- තෝරාගත් පදක්කම, පදක්කම් අවශ්‍යතායක් සඳහා මීට පෙර <u>සමත් කළ</u> පදක්කමක් නොවිය යුතුය.
- පදක්කමට අදාල විෂය නිර්දේශය අනුව යෝජනාවලිය, සටහන්, ඡායාරූප හා වාර්තා සකස් විය යුතු අතර ඒ සඳහා වූ ක්‍රමවේද නිවැරදිව අනුගමනය කළ යුතුය.
- නිසි බලධාරීන්ගේ අනුමත කිරීම්, ඇගයීම් හා නිර්දේශ සහිතව මානවක සමාජ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය සම්මත විය යුතුය.

## **47.** නායකත්ව තරුව (RPS-04)
**Leadership Star**
*(කාලය: මාස 6)*



1) **නිපුණතා අංගය**
පහත මාතෘකා වලින් 2ක් සම්බන්ධයෙන් කුසලතා වැඩි දියුණු කර ගැනීම. (පළමු අවශ්‍යතාවය අනිවාර්යය වේ):

(1) **අනාගත වෘත්තීමය මාර්ගෝපදේශකත්වය** (Future Carrier Guidance) - තම අනාගත අභිවෘද්ධිය වෙනුවෙන්, තමා විසින්ම ක්‍රමවත් වෘත්තීමය මාර්ගෝපදේශකත්වයක් සකස් කිරීම.

(2) **සංකීර්ණ ගැටළු විසඳීම** (Complex Problem Solving) - ඔබට මුහුණ දීමට සිදු විය හැකි සංකීර්ණ ගැටළු 2ක් හඳුනාගෙන ඒවා විසඳීමට ක්‍රියාකාරීව සම්බන්ධ වීම.

(3) **ආපදා කළමනාකරණය** (Disaster Management) -
ආපදාවක් වලක්වා ගැනීමේ සිට එය ලිහිල් කිරීම හෝ පාලනය කිරීම හෝ යතා තත්වයට පැමිණීම දක්වා වූ ක්‍රියාවලියේ ඇති හදිසි තත්වය පිළිබඳ අවබෝධයක් තිබීම හා ආපදා කළමනාකරණ කමිටුවකට සම්බන්ධ වී ක්ෂණික ප්‍රතිචාර සඳහා සූදානම්ව සිටීම.

2) **ක්‍රියාකාරී නායකත්ව පාඨමාලාව (Leadership in-Action)**
(1) නායකත්ව පුහුණු සංවිධානයක් විසින් (ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය හැර) පවත්වනු ලබන 'ක්‍රියාකාරී නායකත්ව' පාඨමාලාවකට සාර්ථකව සහභාගී විය යුතුය.

(2) මෙය පැය 6කට නොඅඩු කාලයක් තුළදී පවත්වන ලද ප්‍රායෝගික පාඨමාලාවක් විය යුතුය.

(3) මෙම පාඨමාලාවේ වැඩ සටහනට පහත සඳහන් මාතෘකා 2ක් වත් අන්තර්ගත වී තිබිය යුතුය:

a) **විශ්ලේෂණාත්මක චින්තනය සහ නවෝත්පාදනය** (Analytical thinking and Innovation) -
ප්‍රජා මූලික ගැටළුවක් හඳුනාගෙන, එය පර්යේෂණාත්මකව විශ්ලේෂණය කර නිසි විසඳුමක් ලබා ගන්නා ආකාරය ප්‍රායෝගිකව ආදර්ශනය කිරීම.

b) **ඔරොත්තු දීමේ හැකියාව, ආතතිය දරාගැනීම සහ නම්‍යශීලී බව** (Resilience, Stress Tolerance and Flexibility) -
ගුරු උපදේශනය, ගිවිස ගැනීමේ ක්‍රමවේද, ගැටළු වලට මුහුණ දීම හා නිරාකරණය, සුහදතා වර්ධනය.

c) **නිර්මාණශීලීත්වය, උත්පාදන ශක්තිය හා මූලපිරීම** (Creativity, Originality and Initiative) -
ස්ව-ශක්තියෙන් ස්වාධිනව සිතීමේ හැකියාව හා නිර්මාණශීලීත්වය, හා කිසියම් කාර්යභාරයක් හෝ වැඩ සටහනක්, අවම මෙයවීමකින්, තක්සේරු කිරීම හා සාර්ථකව සංවිධානය කිරීම.

3) පහත ක්‍රමවේද 2 න් එකක් තෝරාගත යුතුය:
**<u>ක්‍රමවේදය-1</u>: ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය**
නායකත්වය සහ සමාජ ආභාෂය යන මාතෘකා හොඳින් අධ්‍යනය කර තිරසාර සංවර්ධන ඉලක්ක 17 න් එකක් යටතේ, ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා පසුබිමක් සාදා ගැනීම, යෝජනාවලියක් ඉදිරිපත් කිරීම, සංවිධානය කිරීම හා එය සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම.

(1) සංවිධානය: මානවක බාලදක්ෂයින් 8 ක කණ්ඩායමක සහභාගිත්වයෙන් හා වෙනත් තරුණයින් කිහිප දෙනෙකුගේ සහායෙන්, අවම වශයෙන් මිනිස් පැය 48ක **ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් සංවිධානය කිරීම**.

(2) **ව්‍යාපෘති යෝජනාවලිය**: නිසි සැලසුම් සහිත ව්‍යාපෘති යෝජනාවලිය, මානවක බාලදක්ෂ නායක මගින් මානවක සමාජ මණ්ඩලය වෙත ඉදිරිපත්කර පූර්ව අනුමැතිය ලබාගැනීම.

(3) **ව්‍යාපෘති වාර්තාව**: ව්‍යාපෘතිය සංවිධානය කර, එය නිසි ලෙස ක්‍රියාත්මක කර, බලධාරීන් විසින් අනුමත කිරීම් සහ ඇගයීම් සහිතව සාර්ථකව අවසන් කළ යුතුය. ව්‍යාපෘති වාර්තාවක් (ව්‍යාපෘති යෝජනාවලිය සමගින්) සකස් කර මානවක බාලදක්ෂ නායක හරහා මානවක සමාජ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය

*හෝ*

**ක්‍රමවේදය-2:**
**යහපත් ලොවක් සඳහා වූ අභිලාෂ රාමුව** *(58-65 පරිච්ඡේද)* යටතේ ඇති පහත සඳහන් පදක්කම සමත් වීම:

BWF-01. සාමයේ පණිවිඩකරුවෝ - මුදු පදක්කම *(59 පරිච්ඡේදය)*

සැලකිය යුතුයි:

- පදක්කමට අදාල විෂය නිර්දේශය අනුව යෝජනාවලිය, සටහන්, ඡායාරූප හා වාර්තා සකස් විය යුතු අතර ඒ සඳහා වූ ක්‍රමවේද නිවැරදිව අනුගමනය කළ යුතුය.
- නිසි බලධාරීන්ගේ අනුමත කිරීම්, ඇගයීම් හා නිර්දේශ සහිතව මානවක සමාජ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය සම්මත විය යුතුය

## *48.* ප්‍රථමාධාර සේවා පදක්කම
## First Aid Service Badge (FSB)

*(වයස අවුරුදු 17 ½ - 26 දක්වා)*




1) මානවක අනුගාමිකයෙකු ලෙස මෙම පෝදක්කම සඳහා සුදුසුකම් ලබා ගැනීම ආරම්භ කළ හැකිය.

2) ජ්‍යේෂ්ඨ බාලදක්ෂයින්ගේ 'ගිලන් සේවා' (Ambulance) හා මහජන සෞඛ්‍ය සේවක' (Public Health) යන ප්‍රවීණතා පදක්කම් සඳහා වූ විෂය නිර්දේෂයන් අධ්‍යනය කර, ප්‍රථමාධාර හා හෙද සේවාව පිළිබඳ මූලික දැනුමක් ලබා ගැනීම.

3) රතු කුරුස සමාජය, ශාන්ත ජෝන් ගිලන් රථ සංගමය/බළකාය වැනි පිළිගත් ආයතනයකින් ප්‍රථමාධාර පිළිබඳ ප්‍රායෝගික පාඨමාලාවක් හදාරා වලංගු සහතිකයක් සහ/හෝ පදක්කමක් ලබා ගත යුතුය.

4) ප්‍රථමාධාර සේවා කණ්ඩායමක් සමග සම්බන්ධ වී, පැය 2කට නොඅඩු කාලයක්, මහජන උත්සවයක හෝ ආගමික උත්සවයක / පෙරහරක සේවා කටයුතුවල නිරත විය යුතුය.

හෝ

මානවකයින් හෝ ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින් (අවම වශයෙන් 6 දෙනෙකු සඳහා) පැය 2කට නො අඩු කාලයක් පුරා ප්‍රථමාධාර හා මහජන සෞඛ්‍ය පිළිබඳව ප්‍රායෝගික වැඩමුළුවක් පැවැත්විය යුතුය.

*(මානවකයාගේ කමිස අත් දෙපැත්තේ උරහිස් කෙළවර ප්‍රථමාධාර සේවා පදක්කම් 2ක් පළඳිනු ලැබේ.)*

**49. යහපත් පුරවැසි පළඳනාව**
**Good Citizen's Decoration**
*(වයස අවුරුදු 19 ½ – 26 දක්වා)*



1) දිවුරුම් දුන් මානවක බාලදක්ෂයෙකු වීම.

2) බාලදක්ෂ අංශයේ 'දිසා කොමසාරිස් රැහැනට' අදාල බාලදක්ෂ ශිල්පීය දැනුම ලබාගෙන තිබීම

3) ප්‍රථමාධාර සේවා පදක්කම දිනා ගැනීම. *(48 පරිච්ඡේදය)*

4) පහත සඳහන් මානවක ප්‍රවීණතා තරු 4න් 2ක් සමත් වීම.
   (1) RPS-01 - ව්‍යාපෘති තරුව
   (2) RPS-02 - ගවේෂක තරුව
   (3) RPS-03 - බාලදක්ෂ ශිල්පීය තරුව
   (4) RPS-04 - නායකත්ව තරුව
   *(43-47 පරිච්ඡේද)*

5) **යහපත් ලොවක් සඳහා වූ අභිලාෂ රාමුව** *(58-65 පරිච්ඡේද)* යටතේ ඇති පහත සඳහන් පදක්කම් 5 අතුරෙන් <u>එකක්</u> සමත් වීම:

BWF-02. විශ්ව බලදක්ෂයෝ ප්‍රදානය
BWF-03. පැම්‍රිමොනිටො (ලෝක උරුම) බාලදක්ෂ පදක්කම
BWF-04. සොබාදහම් ශූරතා අභියෝගය
BWF-05. ටයිඩ් ටර්නර් ප්ලාස්ටික් අභියෝගය
BWF-06. සූර්ය බලශක්ති බාලදක්ෂ අභියෝගය

සැලකිය යුතුයි:

- තෝරාගත් පදක්කම, පදක්කම් අවශ්‍යතායක් සඳහා මීට පෙර <u>සමත් කළ</u> පදක්කමක් නොවිය යුතුය.
- පදක්කමට අදාල විෂය නිර්දේශය අනුව යෝජනාවලිය, සටහන්, ඡායාරූප හා වාර්තා සකස් විය යුතු අතර ඒ සඳහා වූ ක්‍රමවේද නිවැරදිව අනුගමනය කළ යුතුය.
- නිසි බලධාරීන්ගේ අනුමත කිරීම්, ඇගයීම් හා නිර්දේශ සහිතව මානවක සමාජ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය සම්මත විය යුතුය.

6) 'හානියෙන් සුරක්ෂාව' ප්‍රකාශනයේ 14-මට්ටම අන්තර්ගතය අවබෝධ කර ගැනීම. *(56 පරිච්ඡේදය)*

**කාලින සටහන් පොත (ලොග් පොත)** - තමන් මානවක සමාජයට ඇතුළත් වූ දින සිට මේ දක්වා වූ කාලය තුළදී (මාස 18කට නො අඩු කාලයක්) කාලින සටහන් පොතක් පවත්වා ගෙන ගොස් තිබීම.
*(30 පරිච්ඡේදය)*

7) දිවුරුම් දුන් මානවක බාලදක්ෂයෙකු ලෙස **මාස 18ක සේවා කාලයක්** සම්පූර්ණ කර තිබීම හා අවම වශයෙන් මානවක සමාජ රැස්වීම 18කට හා මානවක සමාජ මණ්ඩල රැස්වීම් 8 කට සහභාගි වී තිබීම.

## 50. බේඩන් පවල් ප්‍රදානය (බී,පී.ප්‍රදානය)
**Baden Powell Award**
*(වයස අවුරුදු 20 ½ සිට 26 දක්වා)*






1) දිවුරුම් දුන් මානවක බාලදක්ෂයෙකු වීම.

2) යහපත් පුරවැසි පළදනාව දිනාගෙන තිබීම.

3) බාලදක්ෂ අංශයේ 'ප්‍රධාන කොමසාරිස් ප්‍රදානයට' අදාල බාලදක්ෂ ශිල්පීය දැනුම ලබාගෙන තිබීම.

4) **මානවක ප්‍රවීණතා තරු:**
පහත සඳහන් මානවක ප්‍රවීණතා තරු 4න් <u>මෙතෙක් දිනා නොගත්</u> ඉතිරි ප්‍රවීණතා තරු 2ක සමත් වීම.
   (1) RPS-01 - ව්‍යාපෘති තරුව
   (2) RPS-02 - ගවේෂක තරුව
   (3) RPS-03 - බාලදක්ෂ ශිල්පීය තරුව
   (4) RPS-04 - නායකත්ව තරුව
   *(43-47 පරිච්ඡේද)*

5) **යහපත් ලොවක් සඳහා වූ අභිලාෂ රාමුව** *(58-65 පරිච්ඡේද)* යටතේ ඇති පහත සඳහන් පදක්කම පදක්කමක් සමත් වීම:

   BWF-07. සාමය සඳහා වූ සංවාදය *(65 පරිච්ඡේදය)*

   සැලකිය යුතුයි:
   - පදක්කමට අදාල විෂය නිර්දේශය අනුව යෝජනාවලිය, සටහන්, ඡායාරූප හා වාර්තා සකස් විය යුතු අතර ඒ සඳහා වූ ක්‍රමවේද නිවැරදිව අනුගමනය කළ යුතුය.
   - නිසි බලධාරීන්ගේ අනුමත කිරීම්, ඇගයීම් හා නිර්දේශ සහිතව මානවක සමාජ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එය සම්මත විය යුතුය

6) 'හානියෙන් සුරක්ෂාව' ප්‍රකාශනයේ 15-මට්ටම අන්තර්ගතය අවබෝධ කර ගැනීම. *(57 පරිච්ඡේදය)*

7) **කාලින සටහන් පොත (ලොග් පොත):**
තමන් මානවක සමාජයට ඇතුළත් වූ දින සිට මේ දක්වා වූ කාලය තුළදී (මාස 30කට නො අඩු කාලයක්) කාලින සටහන් පොතක් පවත්වා ගෙන ගොස් තිබීම.
*(30 පරිච්ඡේදය)*

8) **බී.පී.ප්‍රදාන වාර්තා පොත** (BP Award Record Book)

(1) මානවක බාලදක්ෂ ප්‍රවීණතා තරුවලට හා පදක්කම් වලට අදාලව හදාරන ලද සියළුම සටහන්, අත් පත්‍රිකා, ලියකියවිලි, අවසර ගැනීම්, අනුමත කිරීම්, ඡායාරූප ආදී සියල්ල අන්තගර්ත විය යුතුය. (එම වාර්තාව A4 පිටු 240-320 අතර විය යුතුය).

(2) e-අනුවාද (e-versions) පිළිගත හැකි නමුත් ඒ සඳහා ඉහත සඳහන් ලිපි ලේඛන එකතු කර, ඒ සියල්ලම සුපිරික්සනය (scan) කර, පරිගණකය භාවිතයෙන් එක පොතක් ලෙස අමුණා (Page Making) ඉදිරිපත් කළ යුතුය.

(3) තොරතුරු අන්තර්ජාලයෙන් බාගත කර ඇත්නම් (downloaded), එම තොරතුරු හොඳින් අධ්‍යනය කර සාරාංශ කර ඉදිරිපත් කළ යුතුයි.

9) දිවුරුම් දුන් මානවක බාලදක්ෂයෙකු ලෙස **මාස 30ක සේවා කාලයක්** සම්පූර්ණ කර තිබීම හා අවම වශයෙන් මානවක සමාජ රැස්වීම 30කට හා මානවක සමාජ මණ්ඩල රැස්වීම් 15කට සහභාගි වී තිබීම.

## 51. බේඩන් පවල් ප්‍රදානය ඇගයීම
## Assessment for BP Award

මානවක බාලදක්ෂයාගේ වයස අවුරුදු 26 සම්පූර්ණ වීමට පෙර දිසා කොමසාරිස් තුමා ඇතුළු දිසා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නිර්දේශ කළ පහත සඳහන් ලියකියවිලි ප්‍රධාන කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය.

1) දිසා කොමසාරිස් තුමා විසින් නිර්දේශ කළ 'බී.පී. ප්‍රදාන අයැදුම් පත' (නිවැරදිව සම්පූර්ණ කර තිබිය යුතුයි.)

2) සියලුම පදක්කම් සහ ප්‍රවීණතා තරු සමත් කිරීම් හා අදාළ, නිවැරදිව සම්පූර්ණ කරන ලද පෝරම වල මුල් පිටපත්, බී.පී. ප්‍රදාන අයැදුම් පතට අමුණා තිබිය යුතුය.

3) ප්‍රවීණතා තරු සමත් කිරීම් හා අදාළ, පෝරම වල ඡායා පිටපත්, බී.පී. ප්‍රදාන වාර්තා පොතේ, අදාළ සමත් කිරීම් වලට අදාළ කොටසේ, අමුණා තිබිය යුතුය.

4) බී.පී. ප්‍රදාන වාර්තා පොත (අතින් සකසන ලද - manual), හෝ ඉහත 8) (2) හි පැහැදිලි කළ පරිදි e-අනුවාදය / e -version) ඉදිරිපත් කළ යුතුය.

5) විදුහල්පතිවරයෙකු හෝ සාම විනිසුරුවරයෙකු විසින් සහතික කරන ලද උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම් පතේ සත්‍ය පිටපත් ඉදිරිපත් කළ යුතුය

6) ජාතික බාලදක්ෂ මූලස්ථානය විසින් වෙනත් ලේඛනයක්, හෝ මානවක සමාජ මණ්ඩල වාර්තා පිටපත් ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවකදී ඒවා ඉදිරිපත් කළ යුතුය.

## 52. බී.පී. ප්‍රදානය අනුමත කිරීම
## Processing of BP Award Applications

1) **දිස්ත්‍රික් නිර්දේශය:** දිසා කොමසාරිස් තුමා හා සහය දිසා කොමසාරිස් (මානවක) ඇතුළත් ත්‍රිපුද්ගල කමිටුවක් මගින් දිසා මට්ටමෙන් සම්මුඛ පරීක්ෂණය පවත්වා දිසා කොමසාරිස් තුමා විසින් එහි නිර්දේශය ඉදිරිපත් කළ යුතුය.

2) **ජාතික මට්ටමේ නිර්දේශය:** සහාය ප්‍රධාන කොමසාරිස් (මානවක) ඇතුළු ජාතික බාලදක්ෂ මූලස්ථානයේ තවත් කොමසාරිස් වරුන් දෙදෙනෙකුගෙන් සැදුම් ලත් පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණය පවත්වා එහි නිර්දේශය ප්‍රධාන කොමසාරිස් තුමා වෙත ඉදිරිපත් කළ යුතුය.

3) **අවසාන අනුමැතිය:** ප්‍රධාන කොමසාරිස් තුමා විසිනි.

4) **ජාතික මට්ටමේ සහතිකය: බී.පී. ප්‍රදානය** දිනා ගන්නා මානවක බාලදක්ෂයන් සඳහා ජාතික මට්ටමේ සහතිකයක් නිකුත් කරනු ලැබේ.

## 53. මානවක උපදේශකයින්
**Rover Instructors**




මානවක උපදේශකයකු වීම සඳහා පහත අවශ්‍යතා සම්පූර්ණ කළ යුතුය.

1) මානවක නායකත්වයක් ගැනීමට උනන්දුවක් දක්වන, බී.පී.ප්‍රදාන ලාභීන්ට වයස අවුරුදු 20 ½ ඉක්මවීමෙන් පසු මානවක උපදේශකයෙකු ලෙස පත් විය හැකිය. (මානවක බාලදක්ෂ නායකගේ අනුමැතියට යටත්ව)

2) මානවක නායකත්වයක් ගැනීමට උනන්දුවක් දක්වන, වයස අවුරුදු 26 ඉක්මවූ ආදි-මානවකයින්ට හා ආදි-බාලදක්ෂයින්ටද මානවක උපදේශකයින් ලෙස පත් විය හැකිය. (මානවක බාලදක්ෂ නායකගේ අනුමැතියට යටත්ව).

3) මානවක උපදේශකයින් ලෙස පත්වන්නන් මීට පෙර මානවකයෙකු ලෙස දිවුරුම් දී නොමැති නම් හැකි ඉක්මනින් මානවක දිවුරුම් දීම සඳහා වූ අවශ්‍යතා සම්පූර්ණ කර දිවුරුම් දිය යුතුයි.

4) වයස 26 ඉක්මවූ සැණින්, මානවක උපදේශකයින් අදියර-I වැඩිහිටි නායක පුහුණු පාඨමාලාවක් (මානවක) හදාරා නායකයෙකු ලෙස අධිකාරී පත්‍රයක් ලබා ගත යුතුය.

5) නායකයෙකු ලෙස අධිකාරී පත්‍රයක් ලබා ගත් පසු මානවක උපදේශක පදක්කම පැළඳිය නොහැක.

## 54. 'හානියෙන් සුරක්ෂාව' - *මට්ටම 12*
## Safe from Harm – *Level 12*

1) **තමා පිළිබඳව හා අවට සමාජය පිළිබඳව දැනුවත් වීම:**
   (1) අතරමං වූ දරුවෙකු සඳහා, ඔහුගේ/ඇයගේ දෙමාපියන් සම්බන්ධ කර ගත නොහැකිඅවස්ථාවකදී වුවද, පිහිට වීමට හැකි වීම.

   (2) ගිලන් රථ සේවාව, පොලිසියේ හදිසි ඇමතුම් අංකය, ගිනි නිවන ආරක්ෂක සේවාව, ළමාරක්ෂක ඇමතුම් අංකය, පොලිසියේ හදිසි කැඳවුම් අංකය දැන සිටීම.

2) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - තරුණයින් අතර:**
   මිතුරන් ඇති කරගන්නා ආකාරය සහ නරක මිතුරන් සමග කටයුතු කළයුතු ආකාරය දැන සිටීම

3) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - තරුණයින් හා වැඩිහිටියන් අතර:**
   ළමුන් සහ වැඩිහිටියන් අතර තිබිය යුතු සබඳතා සීමාවන් දැන සිටීම

4) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - වැඩිහිටියන් අතර:**
   මානවක සමාජයේ සාමාජිකයන් සමග මිතුරු වීම හා සහයෝගයෙන් කටයුතු කිරීම සහ ඔවුන් සමග එකමුතු වී ක්‍රියාකාරකම් සැලසුම් කිරීම

5) **කායික ආරක්ෂාව:**
   දේහ ස්වරූපයේ සිදුවන වෙනස් වීම්වලදී ඇතිවන ගැටළු පිළිබඳ අවබෝධය, ක්‍රියාකාරකම් හා ව්‍යායාමවලදී සිදුවිය හැකි අණතුරුවලින් ආරක්ෂා වන ආකාරය දැන සිටීම.

6) **චිත්තවේගී සෞඛ්‍යය හා ආරක්ෂාව:**
   චිත්තවේගී ආරක්ෂාව, චිත්තවේග සෞඛ්‍යය හා චිත්තවේග අපයෝජනය හා සම්බන්ධ මූලධර්ම පිළිබඳ අවබෝධය.

7) **මානසික ආරක්ෂාව:**
   මානසික සෞඛ්‍යය වර්ධනය කරගත හැකි ආකාරය දැන සිටීම

8) **ස්ථානීය ආරක්ෂාව හා උපකරණ භාවිතයේදී ආරක්ෂාව:**
නිවෙස තුළ සිදුවන අණතුරු වලක්වා ගන්නා අකාරය දැන සිටීම, රැස්වෙන ස්ථානවලදී ආරක්ෂාව, විදුළියෙන් ආරක්ෂා වීම, ගින්නකදී ආරක්ෂා වීම, මුළුතැන්ගෙයි ආරක්ෂාව.

9) **සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම:**
දුම් පානය, මධ්‍යසාර භාවිතය හා අන්තරාකාරී මත් ද්‍රව්‍ය භාවිතයේ ආදීනව දැන සිටීම

10) **සයිබර් ආරක්ෂාව:**
සයිබර් තර්ජන හා සයිබර් ආරක්ෂාවට අදාළ කරුණු මූලික කරුණු දැන සිටීම.

11) **දත්ත ආරක්ෂණය:**
පෞද්ගලික තොරතුරු එක් රැස් කරන අයුරු දැන සිටීම, දත්ත සුරක්ෂාව පිළිබඳ සංකල්පය දැන සිටීම.

12) **පෞද්ගලික ඒකාග්‍රතවය:**
අවංක පුද්ගලයෙකු වීමේ ස්ථිර අධිඨානයකින් කටයුතු කිරීම.

**55. 'හානියෙන් සුරක්ෂාව' - *මට්ටම 13***
**Safe from Harm – *Level 13***

1) **තමා පිළිබඳව හා අවට සමාජය පිළිබඳව දැනුවත් වීම:**
   (1) අතරමං වූ දරුවෙකු සඳහා, ඔහුගේ/ඇයගේ දෙමාපියන් සම්බන්ධ කර ගත නොහැකිඅවස්ථාවකදී වුවද, පිහිට වීමට හැකි වීම
   (2) ගිලන් රථ සේවාව, පොලිසියේ හදිසි ඇමතුම් අංකය, ගිනි නිවන ආරක්ෂක සේවාව, ළමාරක්ෂක ඇමතුම් අංකය, පොලිසියේ හදිසි කැඳවුම් අංකය දැන සිටීම.

2) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - තරුණයින් අතර:**
ශක්තිමත් මිතුදම් ගොඩ නගා ගැනීම සහ නරක මිතුරන් හඳුනා ගැනීම හා ඔවුන් හැසිරවීම පිළිබඳ කතාවක් පැවැත්වීම

3) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - තරුණයින් හා වැඩිහිටියන් අතර:**
බාලයන් ඇසුරු කිරීමේදී අදාල සීමාවන් තුළ කටයුතු කිරීමට දැන ගැනීම.

4) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - වැඩිහිටියන් අතර:**
ධනාත්මක හා ශක්තිමත් සම්බන්ධතා ගොඩ නගා ගැනීමේ උපාය මාර්ග දැන සිටීම.

5) **කායික ආරක්ෂාව:**
පහත අවස්ථා හඳුනා ගැනීම හා නිසි පරිදි ක්‍රියාකිරීම:
(1) හිරිහැරයට ලක්වූ දරුවෙක්
(2) ශාරීරික හිංසනයට ලක්වූ දරුවෙක්
(3) ලිංගිකව හිංසනයට ලක්වූ දරුවෙක්
(4) නොසලකා හරින ලද දරුවෙක්

6) **චිත්තවේගී සෞඛ්‍යය හා ආරක්ෂාව:**
+ අන්‍යයන්ට තමා තුළ ඇති ආත්ම අභිමානය හෝ ආශ්‍රය කිරීම්, තැති ගන්වන සුළු හැසිරීම් වලින් යටපත් වීමට ඉඩ නොදීම.

7) මානසික ආරක්ෂාව:
සෞඛ්‍යය වර්ධනය කර ගැනීම සඳහා, තමා තුළ ඇති සතුට හඳුනා ගන්නේ කෙසේදැයි දැන සිටීම හා ක්‍රියාශීලීව කටයුතු කිරීම.

8) **ස්ථානීය ආරක්ෂාව හා උපකරණ භාවිතයේදී ආරක්ෂාව:**
අණතුරුදායක සමාජීය ගැටුම් නිර්මාණය වීම මගහරවා ගන්නා ආකාරය දැන සිටීම.

9) **සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම:**
යහපත් සෞඛ්‍ය පුරුදු 10/10 දැන සිටීම, ව්‍යායාමයේ හා නින්දේ වැදගත් කම දැන සිටීම.

10) **සයිබර් ආරක්ෂාව:**
විද්‍යුත් තැපැල (email), අන් අයෙකු විසින් අනවසරයෙන් අත්පත් කර ගෙන ඇති අවස්ථාවකදී (hacked) ක්‍රියා කළ යුතු ආකාරය දැන සිටීම හා අන්තර්ජාලය භාවිතයේදී අනුගමනය කළ යුතු ආරක්ෂිත ක්‍රියා මාර්ග පිළිබඳව දැන සිටීම.

11) **දත්ත ආරක්ෂණය:**
තම මානවක සමාජය විසින් එක් රැස් කරන පෞද්ගලික දත්ත පිළිබඳව දැන සිටීම හා දත්ත ආරක්ෂා කිරීම පිළිබඳව සරල දැනුමක් තිබීම.

12) **පෞද්ගලික ඒකාග්‍රතවය**
අවංක භාවය හා ඒකාග්‍රතාවය යනු කුමක්ද? ඒවායේ වෙනස්කම් දැන සිටීම.

## 56. 'හානියෙන් සුරක්ෂාව' - *මට්ටම 14*
## Safe from Harm – *Level 14*

1) **තමා පිළිබඳව හා අවට සමාජය පිළිබඳව දැනුවත් වීම:**
   (1) අතරමං වූ දරුවෙකු සඳහා, ඔහුගේ/ඇයගේ දෙමාපියන් සම්බන්ධ කර ගත නොහැකිඅවස්ථාවකදී වුවද, පිහිට වීමට හැකි වීම
   (2) ගිලන් රථ සේවාව, පොලිසියේ හදිසි ඇමතුම් අංකය, ගිනි නිවන ආරක්ෂක සේවාව, ළමාරක්ෂක ඇමතුම් අංකය, පොලිසියේ හදිසි කැඳවුම් අංකය දැන සිටීම.

2) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - තරුණයින් අතර:**
   හානිකර ශාරීරික අනතුරු හඳුනා ගැනීම, අවම කිරීම හා වලක්වා ගැනීම පිළිබඳ දැනුම.

3) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - තරුණයින් හා වැඩිහිටියන් අතර:**
   ධනාත්මක සම්බන්ධතාවක් ගොඩනගා ගැනීමේ ක්‍රමෝපායන් දැන සිටීම.

4) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - වැඩිහිටියන් අතර:**
   සහයෝගිත්වය පිළිබඳ අවබෝධය, හා සහයෝගිත්වය ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන්නේ කෙසේදැයි දැන ගැනීම.

5) **කායික ආරක්ෂාව:**
   ළමුන් හා තරුණයන් ගේ අනතුරුදායක හැසිරීම් හඳුනා ගැනීම හා වැලැක්වීම

6) **චිත්තවේගී සෞඛ්‍යය හා ආරක්ෂාව:**
   + චිත්තවේග සෞඛ්‍යය ප්‍රවර්ධනය කළ හැක්කේ කෙසේද හා චිත්තවේග අපයෝජනය වලක්වා ගන්නේ කෙසේදැයි දැන සිටීම.

7) **මානසික ආරක්ෂාව:**
   + අන්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කරන්නේ කෙසේදැයි දැන සිටීම +.

8) **ස්ථානීය ආරක්ෂාව හා උපකරණ භාවිතයේදී ආරක්ෂාව:**
   ඔබ අතරමං වූ අවස්ථාවකදී කළ යුතු දෑ පිළිබඳ දැනුම. කඳුකරයේදී, ගංගාවකදී අතරමං වූ විට පිළිපැදිය යුතු ක්‍රමෝපායන් ප්‍රදර්ශනය කිරීම.

9) **සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම:**
   + තම ශරීරයේ ස්ථුල බාවය (තර වීම) පාලනය කර ගැනීම, භෝජන ප්‍රමාණය හා සමබර ආහාර වේලක වැදගත් කම පිළිබඳ දැනුම.

10) **සයිබර් ආරක්ෂාව:**
බියකරු අන්තර්ජාල ක්‍රීඩා පිළිබඳ අවබෝධය, සයිබර් හිරිහැර පිළිබඳ අවබෝධය

11) **දත්ත ආරක්ෂණය:**
+ දත්ත සුරක්ෂිතව තබා ගැනීම පිළිබඳ කරුණු දැන සිටීම, දත්තවල රහස්‍යතාවය පවත්වා ගැනීම පිළිබඳ දැනුම.

12) **පෞද්ගලික ඒකාග්‍රතාවය**
අවංක භාවය හා ඒකාග්‍රතාවය වැදගත්වන්නේ මන්දැයි දැන සිටීම.

**57. 'හානියෙන් සුරක්ෂාව' - *මට්ටම 15***
**Safe from Harm – *Level 15***

1) **තමා පිළිබඳව හා අවට සමාජය පිළිබඳව දැනුවත් වීම:**
(1) ශ්‍රී ලංකා බලදක්ෂ සංගමයේ, 'හානියෙන් සුරක්ෂාව' ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවා අවබෝධ කර ගැනීම.
(2) දුරකතන අංක දැන සිටීම: + මද්‍යසාරය හා අන්තරාකාරී ඖෂධ (මත් ද්‍රව්‍ය) තොරතුරු මධ්‍යස්ථානය, දුම්වැටි හා මධ්‍යසාර නියාමනය පිළිබඳ ජාතික අධිකාරිය.

2) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - තරුණයින් අතර:**
පෞද්ගලික සම්බන්ධතා සීමාවන් හා සීමාව ඉකමවා යාමේ ආදීනව දැන සිටීම.

3) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - තරුණයින් හා වැඩිහිටියන් අතර:**
සමාජ සාරධර්ම *(etiquette)* හා පෞද්ගලික සදාචාරය *(decorum)* පිළිබඳ දැනුම

4) **අන්තර්-පුද්ගල සම්බන්ධතා - වැඩිහිටියන් අතර:**
නළා සංඥා ක්‍රමවේදයේ ඇති වැදගත්කම දැන සිටීම, අළුතෙන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය අනුව සුරක්ෂිතතාවය අවබෝධ කර ගැනීම.

5) **කායික ආරක්ෂාව:**
කල්ක්‍රියාව පිළිබඳ නීති සංග්‍රහය හා ආචාර ධර්ම පද්ධතිය අවබෝධ කර ගැනීම; මේ සඳහා, සිය දිවි හානි කර ගැනීම් හා ස්ත්‍රී දූෂණ වැලැක්වීමේ සංවිධානයක / ගුරු උපදේශන ආයතනයක සම්පත් දායකයින්ගේ සහාය මානවක සමාජයට ලබා ගැනීම

6) **චිත්තවේගී සෞඛ්‍යය හා ආරක්ෂාව:**

+ සමීප රහස්‍යගත සම්බන්ධතාවලදී, යහපත් ලෙස චිත්තවේගී සෞඛ්‍යාරක්ෂාව වර්ධනය කරගන්නා අයුරු දැන සිටීම - විශේෂයෙන් ඉතා සමීප ප්‍රතිවිරුද්ධ ලිංගික සම්බන්ධතාවලදී.

7) **මානසික ආරක්ෂාව:**

මානසික ආරක්ෂාව වර්ධනය කර ගත හැකි අන්දම දැන සිටීම.

8) **ස්ථානීය ආරක්ෂාව හා උපකරණ භාවිතයේදී ආරක්ෂාව:**

+ අවදානම් සහගත කර්තව්‍යයන් පරිශීලනය කරන ආකාරය, ප්‍රචණ්ඩත්වයට නැඹුරු අවස්ථා වර්ධනය නොවන බවට වග බලා ගැනීම පිළිබඳව දැනුම.

9) **සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම:**

+ තම ශරීරයේ ස්ථුල බාවය (තර වීම) පාලනය කර ගැනීම පිළිබඳ දැනුම, හා දුම් පානය, මධ්‍යසාර භාවිතය හා අන්තරාකාරී මත් ද්‍රව්‍ය භාවිතයේ ආදීනව දැන සිටීම.

10) **සයිබර් ආරක්ෂාව:**

සයිබර් තර්ජන දැන සිටීම හා සයිබර් ආරක්ෂාවට අදාළ කරුණු ඇතුළත් කථාවක් පැවැත්වීම. (මානවක සමාජයට, බාලදක්ෂ සමූහට හෝ එවැනි කණ්ඩායමකට).

11) **දත්ත ආරක්ෂණය:**

+ බුද්ධිමය දේපල වංචා කිරීම පිළිබඳ දැනුම හා බාලදක්ෂ කටයුතුවල්දී එය සිදුවන ආකාරය දැන සිටීම.

12) **පෞද්ගලික ඒකාග්‍රතවය**

අවංකභාවයේ හා ඒකාග්‍රතාවයේ ඇති වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම, ඒකාග්‍රතාවය වර්ධනය කර ගත හැක්කේ කෙසේදැයි දැන සිටීම.

## 58. 'වඩා යහපත් ලොවක අභිලාශ රාමුව' (ජාත්‍යන්තර පදක්කම්) Better World Framework Initiatives (International Badges)




## 59. සාමයේ පණිවුඩකරුවෝ - මුදු පදක්කම *(BWF-01)* Messengers of Peace (MoP) - Ring Badge

*(වයස 17 ½ - 26 මානවක බාලදක්ෂයන් සඳහා)*




'සාමයේ පණිවුඩකරුවෝ' දිස්ත්‍රික් සම්බන්ධිකාරක හෝ සහාය දිසා කොමසාරිස් (මානවක) යන අයගේ සහාය හා මගපෙන්වීම යටතේ සම්පූර්ණ කළ යුතුයි

1) **උද්දීපනය (Inspire)**
   පහත සඳහන් එක් ක්‍රමයක් මගින් මානවක බාලදක්ෂයා උද්දීපනය විය යුතුයි.

(1) බාලදක්ෂ කණ්ඩායම්, දිස්ත්‍රික් හෝ ජාතික මට්ටමෙන්, 'සාමයේ පණිවිඩකරුවෝ' මගින් සංවිධානය කරන ලද වැඩ සටහනක් හෝ ක්‍රියාකාරකමක් නිරීක්ෂණය කිරීම,

(2) 'සාමයේ පණිවුඩකරුවෝ' දිස්ත්‍රික් සම්බන්ධිකාරක හෝ සහාය දිසා කොමසාරිස් (වැඩ සටහන්) හෝ සහාය දිසා කොමසාරිස් (මානවක) හෝ මානවක බාලදක්ෂ නායක විසින් පහසුකම් සපයන ලද වාර්තාමය වැඩ සටහනක් නැරඹීම, හෝ කථාවකට සවන් දීම

2) **අධ්‍යනය සහ තීරණය කිරීම (Learn & Decide)**

(1) මානවක බාලදක්ෂයා තමා විසින් සිදු කිරීමට කැමති ව්‍යාපෘතිය පිලිබඳ අධ්‍යනය කර හා තීරණය කිරීම

(2) මානවක බාලදක්ෂයාට ප්‍රබෝධයක් ගෙන දුන් අත්දැකීමක් හා සම්බන්ධ විෂය කරුණක් එහි අන්තර්ගතය විය යුතුයි.

(3) අදාල ව්‍යාපෘතිය තිරසාර සංවධර්න අරමුණු (SDGs) එකක් හෝ කිහිපයක් ආවරණය වන සේ සැලසුම් කළ යුතුය

(4) ව්‍යාපෘති යෝජනාවේ ඉලෙක්ට්‍රොනික පිටපතක් (Soft Copy) හෝ සුපිරික්සන (Scanned) ප්‍රකාශනයක් මානවක බාලදක්ෂ නායක වෙත ඉදිරිපත් කළ යුතුය

(5) මානවක බාලදක්ෂ නායක විසින් ව්‍යාපෘති යෝජනාවේ ඉලෙක්ට්‍රොනික පිටපත (Soft Copy) හෝ සුපිරික්සන (Scanned) ප්‍රකාශනය සහාය දිසා කොමසාරිස් (මානවක) හරහා 'සාමයේ පණිවිඩකරුවෝ' දිස්ත්‍රික් සම්බන්ධීකාරක වෙත ඉදිරිපත් කළ යුතුය. (දී ඇති ආකෘතිය අනුගමනය කරන්න.)

3) **ක්‍රියාත්මක කිරීම (Do)**

තෝරාගත් සේවා ව්‍යාපෘතිය, අදාල මානවක බාලදක්ෂයා විසින් පැය 32 කට නොඅඩු කාලයක පුද්ගලික සේවා දායකත්වයෙන් (ව්‍යාපෘතියේ සංවිධායක ලෙස) මානවක සමාජයෙහි සෙසු සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් සාර්ථකව ක්‍රියාත්මක කළ යුතුය

4) **බෙදා ගැනීම (Share)**

www.scout.org වෙබ් අඩවිය හරහා ව්‍යාපෘතියේ සාර්ථකත්වයේ කතාව උඩු ගත (upload/share) කළ යුතුය. (අනිවාර්යය වේ). සම්පූර්ණ කරන ලද පෝරම සහිත ව්‍යාපෘති වාර්තාව, සහාය දිසා කොමසාරිස් (මානවක) මගින් **'සාමයේ පණිවුඩකරුවෝ'** දිස්ත්‍රික් සම්බන්ධීකාරක වෙත ඉදිරිපත් කළ යුතුය

5) **පදක්කම සහ සහතිකය පිරිනැමීම (Awarding Badge & Certificate)**
අදාළ දිස්ත්‍රික් නිලධාරීන්ගේ නිර්දේශය ඇතිව, **'සාමයේ පණිවිඩකරුවෝ'** දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් ව්‍යාපෘති වාර්තාව ජාතික බාලදක්ෂ මූලස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර ජාතික 'සාමයේ පණිවුඩකරුවෝ' කණ්ඩායම විසින් **'සාමයේ පණිවිඩකරුවෝ'** මුද්‍ර පදක්කම සහ සහතිකය නිකුත් කරනු ඇත.

සාමයේ පණිවුඩකරුවෝ දිස්ත්‍රික් සම්බන්ධීකාරක නොමැති විට, සහාය දිසා කොමසාරිස් (වැඩසටහන්) විසින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත පෝරම සහිත ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කරනු ඇත.

## 60. 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය *(BWF-02)*
## 'Scouts of the World' Award

*(වයස 17 ½ - 26 මානවකයින් සඳහා)*




මෙම පදක්කම් පරීක්ෂක විසින් මානවක බාලදක්ෂයාට අවශ්‍ය උපදෙස් හා මාර්ගෝපදේශය ලබා දිය යුතුය.

1) **'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය අනාවරණය (SW Discovery)**
ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් සංවිධානය කරනු ලබන 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය අනාවරණ වැඩමුළුවකට සහභාගි වීම

2) **'විශ්ව බාලදක්ෂයෝ' ස්වේච්ඡා සේවාව (SW Voluntery Service)**
   (1) **සැලසුම් කිරීම (Plan) -** සංවර්ධනය, සාමය හෝ පරිසරය යන අංශ වලින් 1ක් සම්බන්ධ ගැටලුවක් හඳුනාගෙන එයට විසඳුමක් ලබා දීම සඳහා ස්වේච්ඡා සේවාවක් සැලසුම් කිරීම

   (2) **ක්‍රියාත්මක කිරීම (Conduct) -** අදාල මානවක බාලදක්ෂයාගේ පුද්ගලික සේවා පැය 32 කට නොඅඩු දායකත්වයෙන්, මානවක සමාජයේ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන්, 'විශ්ව

බාලදක්ෂයෝ' ස්වේච්ඡා සේවාව සංවිධානය කළ යුතුය (ව්‍යාපෘති සංවිධායක ලෙස).

(3) **හුවමාරු කර ගැනීම (Share) -** ව්‍යාපෘතියේ සාර්ථකත්වයේ කතාව <u>www.scout.org</u> වෙබ් අඩවිය හරහා උඩු ගත කළ යුතුය. (අනිවාර්යය වේ). ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ සමාජ මාධ්‍ය පිටු වලටද උඩුගත කළ හැකිය (අනිවාර්යය නොවේ).

(4) **වාර්තාව ඉදිරිපත් කිරීම (Sumbit) -** ව්‍යාපෘති වාර්තාව, සහාය දිසා කොමසාරිස් (මානවක) මගින් 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක වෙත ඉදිරිපත් කළ යුතුය.

3) **පදක්කම සහ සහතිකය පිරිනැමීම**
අදාළ දිස්ත්‍රික් නිලධාරීන්ගේ නිර්දේශ සහිතව, 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් පෝරම සහිත වාර්තාව ජාතික බාලදක්ෂ මූලස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර, 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර ජාතික සම්බන්ධීකාරක විසින් අදාල පදක්කම සහ සහතික පත්‍රය නිකුත් කරනු ඇත.

'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක නොමැති විට, සහාය දිසා කොමසාරිස් (වැඩසටහන්) විසින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත පෝරම සහිත වාර්තාව ඉදිරිපත් කෙරේ.

## 61. පැට්‍රිමොනිටො *(ලෝක උරුම)* බාලදක්ෂ පදක්කම *(BWF-03)*
## PATRIMONITO *(World Heritage)* Scout Badge

*(වයස 17 ½ - 26 මානවක බාලදක්ෂයන් සඳහා)*



1) 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර දිස්ත්‍රික් සම්බන්ධීකාරකගේ සහාය සහ මගපෙන්වීම ඇතිව ලෝක උරුම සම්බන්ධ ව්‍යාපෘති ගවේෂණය කර තොරතුරු අධ්‍යනය කරන්න.

2) ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය විසින් සංවිධානය කරනු ලබන 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය අනාවරණ (SW Discovery) වැඩමුළුවක් සාර්ථකව නිමා කිරීම.

3) පැට්‍රිමොනිටො ව්‍යාපෘතිය තුල ඔබේ භූමිකාව තීරණය කිරීම *(දෙයාකාරය):*

**(a) කඳවුරු නායකයකු ලෙස** - මෙහිදී ඔබ විසින් සවිස්තරාත්මක ව්‍යාපෘති වාර්තාවක් සකසා එය ක්‍රියාත්මක කිරීමට සාමාජිකයින් පිරිසක් පත්කර ගත යුතුය.

හෝ

**(b) ස්වේච්ඡා ක්‍රියාකරුවකු ලෙස**: මෙහිදී බාලදක්ෂයින් පිරිසක් විසින් හෝ ලෝක උරුම ස්වේච්ඡා ක්‍රියාකරුවන් (WHV- World Heritage Volunteers) විසින් සූදානම් කරන ලද ව්‍යාපෘතියකට ඔබ විසින් දායකත්වය ලබා දිය යුතුය.

4) **ඔබ කඳවුරු නායකයකු ලෙස කටයුතු කරන්නේ නම්:**

(1) 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර දිස්ත්‍රික් හා ජාතික සම්බන්ධිකාරකයින් මගින් එක්සත් ජාතීන්ගේ සමාජීය හා සංස්කෘතික සංවිධානය (UNESCO) ලෝක උරුමස්ථාන බලධාරීන් හා සම්බන්ධ වීම.

(2) ව්‍යාපෘතිය සඳහා මානවකයින් සහ/හෝ බාලදක්ෂයන් නොවන ස්වේච්ඡා ක්‍රියාකාරීන් පිරිසක් සම්බන්ධ කර ගැනීම.

(3) සැපයුම් හා බෙදා හැරීම් (logistics) නිසි පරිදි සූදානම් කරගන්න.

(4) ව්‍යාපෘතිය කෙටුම්පත් කිරීම (අත්හුරු වීමේ හා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් ඇතුළුව)

5) **ඔබ ස්වේච්ඡා ක්‍රියාකරුවකු ලෙස කටයුතු කරන්නේ නම්:**

(1) 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර දිස්ත්‍රික් සම්බන්ධීකාරකගේ සහාය ඇතිව, කඳවුරු නායකයකු විසින් මේ වන විටත් සැලසුම් කර ඇති 'විශ්වීය බාලදක්ෂයෝ' ස්වේච්ඡා ව්‍යාපෘතියක් තෝරා ගැනීම.

(2) ව්‍යාපෘති සංවිධානය සමඟ කෙළින්ම සම්බන්ධ වී, අදාල ක්‍රියාකාරකම්, හා සැපයුම් හා බෙදා හැරීම් අවශ්‍යතා පිළිබඳ තොරතුරු ලබා ගනිමින්, ලෝක උරුම ස්වේච්ඡා (WHV) ව්‍යාපෘතියට සම්බන්ධ වීම.

6) **'විශ්ව බාලදක්ෂයෝ' ස්වේච්ඡා සේවා ව්‍යාපෘතිය,** ලෝක උරුම අඩවියක හෝ ඔවුන් විසින් යෝජනා කරන වෙනත් සුදුසු ස්ථානයක, 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර ජාතික කණ්ඩායමේ සහ UNESCO ලෝක උරුම බලධාරීන්ගේ සහාය ඇතිව සාර්ථකව නිමා කිරීම.

   (1) මානවක සමාජයේ සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන්, 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය සඳහා ස්වෙච්ඡා ක්‍රියාකරුවකු ලෙස සංවිධානය කරන ලද මෙම ස්වේච්ඡා සේවා ව්‍යාපෘතියේදී මානවකයාගේ ඒක පුද්ගල සේවා දායකත්වය පැය 32 කට නොඅඩු විය යුතුය. (ව්‍යාපෘතියේ සංවිධායක ලෙස).

   (2) ස්වේච්ඡා ක්‍රියාකරුවෙකු ලෙස, 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානයේ ස්වෙච්ඡා සේවයේ, හෝ ලෝක උරුම ස්වෙච්ඡා ක්‍රියාකරුවෝ ව්‍යාපෘතියේ, ඔබ පූර්ණ කාලීනව සම්බන්ධවී තිබිය යුතුය.

   (3) මානවක බාලදක්ෂයා විසින් 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය අනාවරණය හෝ 'විශ්වීය බාලදක්ෂයෝ' ප්‍රදානය ස්වෙච්ඡා ක්‍රියාකාරීන් ලෙස තම කර්තව්‍යයන් නිමා කර ඇත්නම් (කඳවුරු නායකයින් හෝ ස්වෙච්ඡා ක්‍රියාකාරීන් ලෙස):

      a) විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය හා අදාල www.scout.org වෙබ්ජාලයට සම්බන්ධ වී තම ව්‍යාපෘතිය උඩුගත කළ යුතුය.

      b) ලෝක උරුමයන් පිළිබඳ ව්‍යාපෘති වාර්තාව සම්පූර්ණ කර එය සහාය දිසා කොමසාරිස් (මානවක) මගින් 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර දිස්ත්‍රික් සම්බන්ධිකාරක වෙත ඉදිරිපත් කළ යුතුය.

7) **පදක්කම සහ සහතිකය පිරිනැමීම**

   අදාළ දිස්ත්‍රික් නිලධාරීන්ගේ නිර්දේශ සහිතව, 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් පෝරම සහිත වාර්තාව ජාතික මූලස්ථානයට ඉදිරිපත් කළ යුතු අතර, 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර ජාතික සම්බන්ධීකාරක විසින් අදාල පැට්‍රොමොනිටො බාලදක්ෂ පදක්කම සහ සහතික පත්‍රය නිකුත් කෙරේ.

   'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය බාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක නොමැති විට, සහාය දිසා කොමසාරිස් (වැඩසටහන්) විසින් ජාතික මූලස්ථානයට වෙත පෝරම සහිත ව්‍යාපෘති වාර්තාව කෙරේ.

   පැට්‍රොමොනිටො බාලදක්ෂ පදක්කම දිනා ගත් අය 'විශ්ව බාලදක්ෂයෝ' ප්‍රදානය දිනා ගැනීම සඳහාද සුදුසුකම් ලබනු ඇත.

## 62. සොබාදහම් ශූරතා අභියෝගය *(BWF-04)*
## Champions for Nature Challenge
*(වයස 17 ½ - 26 මානවක බාලදක්ෂයන් සඳහා)*





1) **දැනුවත් වීම** (Be aware)
   (1) මානවයා, සොබාදහම සහ ජෛව විවිධත්වය අතර සම්බන්ධය පිළිබඳ මානවක බාලදක්ෂයාගේ දැනුම සහ අවබෝධය පිළිබඳ ස්වයං තක්සේරුවක්, පදක්කම් පරීක්ෂකගේ සහාය ඇතිව සම්පූර්ණ කිරීම (පදක්කම් පරීක්ෂක විසින් මානවක බාලදක්ෂයා වෙත අදාල උපදෙස් හා සුදුසු ලිපි ලේඛන ලබා දිය යුතුව ඇත.)

   (2) පදක්කම් පරීක්ෂකගේ සහාය ඇතිව, මානවක බාලදක්ෂයා විසින් ක්‍රියාත්මක කිරීමට කැමති කුමන ඉගෙනුම් මාර්ගයද යන්න (වඩා හොඳ තේරීම් හෝ සොබාදහම සහ ජෛව විවිධත්වය අතුරෙන්) තීරණය කරනු ලැබේ.

   (3) පදක්කම් පරීක්ෂකගේ සහාය ඇතිව තෝරාගත් එක් ඉගෙනුම් මාර්ගයක් පිළිබඳ අවබෝධය වර්ධනය වනු සඳහා එම මාර්ගය යටතේ ඇති ක්‍රියාකාරකම් 3ක් සම්පූර්ණ කරන්න. (පදක්කම් පරීක්ෂක විසින් ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ලබා දීමට සහ මානවක බාලදක්ෂයාගේ රුචිකත්වය අනුව ක්‍රියාකාරකම් තෝරා ගැනීමට උපකාර කළ යුතු වේ.)

2) **ක්‍රියාකාරකම් ලැයිස්තුව (List of Activities)**
   (1) **ඉගෙනුම් මාර්ගය:**
   **'වඩා හොඳ තේරීම්'** (Better Choices)
   a) ඔබේ අභිමතය කුමක්ද?
   b) සැලකිලිමත් වන කරුණු 4 (Concerns)
   c) ආහාර පිරමිඩය (Food pyramid)

   (2) **ඉගෙනුම් මාර්ගය:**
   **සොබාදහම හා ජෛව විවිධත්වය** (Nature & Bio Diversity)
   a) සබඳතා දැකීම (See the Links)

b) සොබාදහම අනාවරණය කර ගැනීම - ස්වභාව ධර්මඥයින්ගේ දැනමුතුකම් මත (Discovering Nature with Seek App by Naturalist)
c) එක් ග්‍රහලෝකයකි (One Planet)
d) කතාන්දර කීම - තාරතාව (Pixar Pitch)

3) **සැලසුම් කිරීම (Cooperate)**

මානවක බාලදක්ෂ නායකයාගේ සහාය ඇතිව මානවක සමාජ මට්ටමෙන්, උපරිම වශයෙන් මානවක බාලදක්ෂයන් 6 දෙනෙකු (එක් මානවක පර්ෂදයක්) සහභාගි කර ගනිමින්, පරිසරය සම්බන්ධ ප්‍රජා සේවා ව්‍යාපෘතියක් සැලසුම් කිරීම. (එක් මානවක බාලදක්ෂයෙකුගේ සේවා දායකත්වය පැය 20ක් විය යුතුය.

(1) ඔබේ ප්‍රදේශයේ පාරිසරික ගැටලු හෝ පාරිසරික අවශ්‍යතා හඳුනා ගැනීම.
(2) සෙසු මානවක බාලදක්ෂයින් සමඟ එකමුතු වී, හැකි විසඳුම් ගවේෂණය කිරීම.
(3) ප්‍රජා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සැලසුම් කිරීම.

4) **ක්‍රියාත්මක වීම (Act)**

(1) සැලසුම් කළ සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න.
(2) සේවා ව්‍යාපෘතියේ වාර්තාව පදක්කම් පරීක්ෂක වෙත ඉදිරිපත් කරන්න
(3) මානවක බාලදක්ෂයාගේම scout.org ගිණුමෙන් www.scout.org වෙබ් අඩවිය හරහා ව්‍යාපෘතියේ **සාර්ථකත්වය උඩු ගත කරන්න.**

5) **පදක්කම සහ සහතිකය පිරිනැමීම**

අදාළ දිස්ත්‍රික් නිලධාරීන්ගේ නිර්දේශය ඇතිව, දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් ව්‍යාපෘති වාර්තාව ජාතික මූලස්ථානයට ඉදිරිපත් කළ යුතුය.

**සොබාදහමේ ශූරතා අභියෝගතාව** භාර ජාතික සම්බන්ධීකාරක (BWF වැඩ සටහන් උප කමිටුව) විසින් පදක්කම සහ සහතිකය නිකුත් කරනු ඇත.

**සොබාදහමේ ශූරතා අභියෝගතාව** භාර දිස්ත්‍රික් සම්බන්ධීකාරක නොමැති විට, සහාය දිසා කොමසාරිස් (වැඩසටහන්) විසින් ජාතික බාලදක්ෂ මූලස්ථානය වෙත පෝරම හා වාර්තාව ඉදිරිපත් කරනු ඇත

## **63.** ටයිඩ් ටර්නර් ප්ලාස්ටික් අභියෝගය *(BWF-05)*
## Tide Turners Plastic Challenge
*(වයස 17 ½ - 26 මානවක බාලදක්ෂයන් සඳහා)*

1) **දැනුවත් වීම (Be aware)**
   (1) ප්ලාස්ටික් සම්බන්ධ ගැටලු, ප්ලාස්ටික් අපද්‍රව්‍ය, ප්ලාස්ටික් නිසා වන පරිසර දූෂණය පිළිබඳව මානවක බාලදක්ෂයාගේ අවබෝධය පිළිබඳ ස්වයං-තක්සේරුවක් සම්පූර්ණ කිරීම.
   *(පදක්කම් පරීක්ෂක විසින් මානවක බාලදක්ෂයාට අවශ්‍ය උපදෙස් හා ලිය-කියවිලි ලබා දිය යුතුයි.)*

   (2) මානවක බාලදක්ෂයාගේ එදිනෙදා ජීවිතයේ ප්ලාස්ටික් භාවිතය ඇගයීම සඳහා වන 'ප්ලාස්ටික් විගණන ප්‍රහේලිකාව' (Plastic Audit Quiz) සම්පූර්ණ කිරීම.
   *(පදක්කම් පරීක්ෂක විසින් මානවක බාලදක්ෂයාට අවශ්‍ය උපදෙස් හා ලිය-කියවිලි ලබා දිය යුතුයි.)*

   (3) ජලය සහ ගොඩබිම්, පරිසර පද්ධති දූෂණයෙන් වැලැක්වීම සහ ප්‍රතිසාධනය කිරීම පිළිබඳව 'සුවදායක ලෝකයක් සඳහා වූ ක්‍රියාකාරකම්' ලැයිස්තුවෙන් *(Healthy Planet Activity list)* අවම වශයෙන් ක්‍රියාකාරකම් 4ක් සම්පූර්ණ කිරීම.
   *(පදක්කම් පරීක්ෂක විසින් මානවක බාලදක්ෂයාට අවශ්‍ය උපදෙස් හා ලිය-කියවිලි ලබා දිය යුතුයි.)*

2) **සුවදායක ලෝකයක් සඳහා වූ ක්‍රියාකාරකම් ලැයිස්තුව**
   (1) ඔබ ප්ලාස්ටික්වලට හුරුවීම පිළිබඳව විගණනය (Audit your Plastic Habit)
   (2) කැළි කසළ, එය කෙසේ බලපායිද? (Litter, why does it matter)
   (3) කැළි කසළ අභියෝගය (Litter Blitz)
   (4) ප්ලාස්ටික් පාලනය කිරීම (Regulating the use of plastics)
   (5) සමුද්‍ර දූෂණය පිළිබඳව පෝස්ටරයක් නිර්මාණය කිරීම (Making a Poster on Marine Pollution)

(6) ඔබ ප්ලාස්ටික්වලට හුරුවීම පිළිබඳව විගණනය (Audit your Plastic Habit)

3) **සැලසුම් කිරීම (Cooperate)**

මානවක බාලදක්ෂ නායකයාගේ සහාය ඇතිව මානවක සමාජ මට්ටමෙන් අරිසරය හා සම්බන්ධ ප්‍රජා සේවා ව්‍යාපෘතියක් සැලසුම් කිරීම. (උපරිම වශයෙන් මානවකයින් 6 දෙනෙකු / එක් මානවක පර්ෂදයක සහභාගීත්වය ඇතිව) සෑම මානවක බාලදක්ෂයෙකුගේ දායකත්වය සේවා පැය 20ක් විය යුතුය.

(1) කණ්ඩායම්, ප්‍රජාව සහ හවුල්කරුවන් සමග එක් වී, ඔබ ප්‍රදේශයේ පරිසර ගැටළු හෝ අවශ්‍යතා හඳුනා ගැනීම.

(2) ජ්‍යේෂ්ඨ බාලදක්ෂයින් පිරිසක් හා එක්වී ඒවාට විසඳුම් ලබා දිය හැකි ආකාරය ගවේෂණය කරන්න.

(3) ප්‍රජා සේවා ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් නිර්මාණය කිරීම.

4) **ක්‍රියාත්මක වීම (Act)**

(1) සැලසුම් කළ සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.

(2) සේවා ව්‍යාපෘතියේ වාර්තාව පදක්කම් පරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කිරීම.

(3) මානවක බාලදක්ෂයාට අයත් *https://sdgs.scout.org* ගිණුමෙන් *https://sdgs.scout.org* වෙබ් අඩවිය හරහා ව්‍යාපෘතියේ සාර්ථකත්වය උඩු ගත කරන්න.

5) **පදක්කම සහ සහතිකය පිරිනැමීම**

අදාළ දිස්ත්‍රික් නිලධාරීන්ගේ නිර්දේශය ඇතිව, Tide Turners Plastic Challenge දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් පෝරම හා වාර්තාව ජාතික බාලදක්ෂ මූලස්ථානයට ඉදිරිපත් කළ යුතුය.

අනතුරුව, Tide Turners Plastic Challenge ජාතික සම්බන්ධීකාරක විසින් පදක්කම සහ සහතිකය නිකුත් කරනු ඇත.

දිස්ත්‍රික් සම්බන්ධීකාරක නොමැති විට, සහාය දිසා කොමසාරිස් (වැඩසටහන්) විසින් ජාතික බාලදක්ෂ මූලස්ථානයට වෙත පෝරම හා වාර්තාව ඉදිරිපත් කරනු ඇත

## **64. සූර්ය බලශක්ති බාලදක්ෂ අභියෝගය *(මට්ටම-3)* *(BWF-06)***
## **Scouts Go Solar Challenge *(Level-3)***

*(වයස 17 ½ - 26 මානවක බාලදක්ෂයන් සඳහා)*

පදක්කම් පරීක්ෂක විසින් ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර ලබා දීම සහ ක්‍රියාකාරකම තෝරා ගැනීමට මානවක බාලදක්ෂයාට උපකාර කරනු ඇත. මෙහිදී මානවක බාලදක්ෂයින්ගෙන් ඉහළ නිපුණත්වයක් අපේක්ෂා කෙරේ.

1)

(1) සූර්යයා, සූර්ය බල ශක්තිය සහ එය අපගේ ජීවිතයට සම්බන්ධ වන්නේ කෙසේදැයි දැන සිටීම

(2) පුනර්ජනනීය සහ පුනර්ජනනීය නොවන බලශක්ති ප්‍රභවයන් ගැන දැන සිටීම

(3) සෞඛ්‍යයට සහ පරිසරයට සූර්යයාගේ යහපත් හා අයහපත් බලපෑම් ගැන දැන සිටීම

(4) සෞඛ්‍යයට සහ පරිසරයට සූර්යයාගේ අහිතකර බලපෑම් අවම කර ගන්නේ කෙසේදැයි දැන සිටීම

(5) සූර්ය බල ශක්ති භාවිතය සහ සූයර්යාගේ බල ශක්තියෙන් සන්නද්ධ වීමේ තාක්ෂණයන් ගැන දැන සිටීම.

(6) 3වන මට්ටමේ සූර්ය බලශක්ති බාලදක්ෂ අභියෝගය හඳුන්වා දීමේ වැඩමුළුවකදී, පහත සඳහන් සූර්ය ක්‍රියාකාරකම් (එක් කොටසකින් ක්‍රියාකාරකම් 3 බැගින්), අනිවාර්ය කරුණු ඇතුළත්ව, සිදු කිරීම

(7) පර්ෂදය (උපරිම වශයෙන් මානවක බාලදක්ෂයන් 6ක්) එකතුවී, සූර්ය බලශක්තිය සම්බන්ධ ප්‍රජා සේවා ව්‍යාපෘතියක් සංවිධානය කර, අවම වශයෙන් සේවා පැය 72ක් සහිතව (සම්පූර්ණ දායකත්වය) එය ක්‍රියාත්මක කිරීම

2) **ක්‍රියාකාරකම් ලැයිස්තු**

**(1) සූර්යයා වනාහී ජීවයයි** (Sun is Life) **- ක්‍රියාකාරකම් ලැයිස්තුව**

a) ආලෝකය ලුහු බැඳීම (Chasing Light)
b) කෙනෙකුට නොදැනෙන සේ ඔහු/ඇය අනුගමන කිරීම (Shadow Thief)
c) සූර්ය ශිල්පය (Solar Art)
d) සූර්ය බලශක්ති වර්ණාවලිය (Colors of Solar energy)
e) හිරු තැටිය (Sundial)
f) සූර්ය සහ අනිකුත් බලශක්ති ප්‍රභව - අනිවාර්යයි (Solar and other energy sources)
g) සූර්ය මාලිමාව (Solar compass)

**(2)** සෞඛ්‍යයට සහ පරිසරයට සූර්යයාගේ බලපෑම් (Impact of the Sun on health and environment) **- ක්‍රියාකාරකම් ලැයිස්තුව**

a) අව් කණ්නාඩි (Sunglasses)
b) ඔබේ හරිතාගාරය (Your Greenhouse)
c) ඕසෝන් වියන හා හිරු රශ්මියෙන් සම පිළිස්සීම (Ozone and Sunburn)
d) හිරු රශ්මියෙන් සම පිලිස්සීම වලක්වා ගැනීම (Don’t get a Sunburn)
e) තද සූර්ය රශ්මිය නිසා ඇතිවන ආබාධයට ප්‍රතිකාර දැන සිටීම (How to treat a Sunstroke) - අනිවාර්ය වේ
f) ඔසෝනය හා ආශ්වාස-ප්‍රශ්වාස කිරීම (Ozone and Breathing)
g) පාර-ජම්බුල කිරණ හා තද සූර්ය රශ්මියෙන් ආරක්ෂා වීම (Ultra-Violet (UV) Rays and Sun Proection Factor (SPF)

**(3)** සූර්ය බල ශක්තිය භාවිතය **(Uses of solar energy) – ක්‍රියාකාරකම් ලැයිස්තුව**

a) සූර්යයා එක් දිනක් - සෑම දිනකම (Sun one day – Every day)
b) සූරය තාප උඳුන් පෙට්ටිය (Solar box cooker)
c) සුපිරිසිදු ජලය (Pure water) - SODIS method
d) ජලය එක් රැස් කිරීම (Collect water)
e) සූර්ය ප්‍රහේලිකාව (Solar Quiz) - අනිවාර්ය වේ.
f) ඔබේ සූර්ය ලාම්පුව (Your Solar lamp)

**(4) සූර්ය බලශක්තියට අනුගත වීම (Go Solar)**

a) සූර්ය තාපයෙන් පිසූ දිවා ආහාරයක් අනුභව කිරීම (සමබර ආහාර වේලක්) (Have a Solar lunch (Balanced diet) – අනිවාර්ය වේ.

b) පිරිසිදු ජලය පානය කිරීම. (Use clean water)

c) සූර්ය තාප දිය ස්නානය. (Have a solar shower)

d) උණුසුම් වතුර රැස් කිරීමේ උපාංගයක් ස්ථාපිත කිරීම. (Install a warm water collector)

3) **පදක්කම සහ සහතිකය පිරිනැමීම**

අදාළ දිස්ත්‍රික් නිලධාරීන්ගේ නිර්දේශය ඇතිව, දිස්ත්‍රික් සම්බන්ධීකාරක විසින් පෝරම හා වාර්තාව ජාතික බාලදක්ෂ මූලස්ථානයට ඉදිරිපත් කළ යුතුය.

අනතුරුව, සූර්ය බලශක්ති බාලදක්ෂ පදක්කම (Scouts go Solar) භාර ජාතික සම්බන්ධීකාරක (BWF වැඩසටහන් කමිටුව) විසින්, සූර්ය බලශක්ති බාලදක්ෂ පදක්කම සහ සහතිකය නිකුත් කරනු ඇත.

දිස්ත්‍රික් සම්බන්ධීකාරක නොමැති විට, සහාය දිසා කොමසාරිස් (වැඩසටහන්) විසින් පෝරම හා වාර්තාව ජාතික බාලදක්ෂ මූලස්ථානයට වෙත ඉදිරිපත් කරනු ඇත.

## 65. සාමය සඳහා සවාදය *(BWF-07)*
## Dialogue for Peace

*(වයස 17 ½ - 26 මානවක බාලදක්ෂයන් සඳහා)*




- සාමය සඳහා වූ සංවාදය පදක්කමේ පුහුණු කරුවෙකු හෝ පහසුකම් සපයන්නෙකු ලෙස ජාතික මට්ටමෙන් පුහුණුවක් ලබා දෙනු ඇත.

- සාමය සඳහා වූ සංවාදය පදක්කමේ පුහුණු කරුවෙකු හෝ පහසුකම් සපයන්නෙකු ලෙස මානවකයා ජාතික මට්ටමේ පුහුණුවක් ලබා ගැනීම, හා ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ සාම කඳවුරකදී පෝතක බාලදක්ෂ, කනිෂ්ඨ බාලදක්ෂ සහ ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින්ට පුහුණුවක් ලබා දීම.

- වසරක කාලයක් තුළ ජාතික, පළාත් හා දිස්ත්‍රික් මට්ටමේ 'සාමය සඳහා වූ සංවාදය' කඳවුරකට සාර්ථකව සහභාගි වීමෙන් අනතුරුව, ජාතික බාලදක්ෂ සංගමයේ සම්බන්ධිකාරකගේ නිර්දේශයට යටත්ව, පහසුකම් සපයන්නන්, පුහුණුකරුවන් ලෙස උසස් කිරීම

**1) අධ්‍යනය කිරීම (Learn)**

සාමය සඳහා වූ සංවාදය පදක්කමේ පුහුණු කරුවෙකු හෝ පහසුකම් සපයන්නෙකු ලෙස කටයුතු කිරීම සඳහා මානවකයා විසින් හැදෑරිය යුතු කරුණු:

(1) විනෝදජනක ඉගෙනුම් පරිසරයක් තුළ බාලදක්ෂ ක්‍රම යොදා ගනිමින්, විමසිලිමත් බව දිරිමත් කරන සහ දැනුවත්භාවය ඇති කරන, ව¾හගත නොවූ, ගවේෂණාත්මක ලෙස පදක්කමේ කටයුතු වල නිරත වීම.

(2) සාමය සඳහා වූ සංවාදය පදක්කමේ පුද්ගලික පදක්කම සඳහා පෝතක බාලදක්ෂයින්, කනිෂ්ඨ බාලදක්ෂයින් සහ ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින් සඳහා පහසුකම් සැලසීමට සහ පුහුණු කිරීමට රැල රැස්වීම්, කණ්ඩායම් රැස්වීම් සහ සමාජ රැස්වීම් සැලසුම් කිරීම

(3) ජීවිතයේ අත්දැකීම් බෙදාහදා ගැනීම යෞවනයන් සඳහා විශිෂ්ට ඉගෙනුම් අත්දැකීමක් නිර්මාණය කරන බව දැන සිටීම

(4) සංවාදය වැදගත් වන්නේ ඇයිද යන්න සහ ගැටුම් සහ වරදවා වටහාගැනීම් නිරාකරණය කර ගැනීමේ මාර්ග පිළිබඳව අත්දැකීම් මත පදනම් වූ ක්‍රියාකාරකම් පිළිබද දැන සිටීම. පුද්ගලයින් සතු වගකීම් පිළිබඳව දැනුවත් වීමට හා ගැඹුරින් තේරුම් ගැනීමට මෙය ඉවහල්වනු ඇත.

(5) හැකි අවස්ථාවන්හිදී, සංවාදයේ ප්‍රතිපත්ති 7 ප්‍රායෝගිකව යෙදිය හැකි ආකාරය ගැන සිතීම දිරි ගන්වන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම

**2) ක්‍රියාත්මක කිරීම (Do)**

සාමය සඳහා වූ සංවාදය (Dialogue for Peace) පදක්කම සඳහා පුහුණුකරුවෙකු හෝ පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා මානවකයින් විසින් පහත කරුණු ක්‍රියාත්මක කළ යුතුය:

(1) ඉගෙනුම් ක්‍රියාවලියේදී අතිශයින් වැදගත්යැයි සැලකෙන බාලදක්ෂ ක්‍රම යොදා ගනිමින් ක්‍රියාකාරකම් පිළිබඳ ආවර්ජනය කර ගැනීම.

(2) පෝතක බාලදක්ෂයින්, කනිෂ්ඨ බාලදක්ෂයින් සහ ජ්‍යේෂ්ඨ බාලදක්ෂයින් සඳහා රැස්වීම් පවත්වමින් සාමය සඳහා වූ සංවාදය (Dialogue for Peace) පදක්කම සඳහා පහසුකම් සැලසීම හා පුහුණු කිරීම.

(3) විවිධ තත්වයන් විශ්ලේෂණය කිරීමට සහාය වීම, ප්‍රදේශයේ ගැටළු හඳුනා ගැනීම, ප්‍රාදේශීය, ජාතික සහ ගෝලීය ගැටළු අතර පවතින සම්බන්ධතා වටහා ගැනීම.

(4) සැලසුම් අධීක්ෂණය සහ ඇගයීම, ව්‍යාපෘති හා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

(5) වයස් කාණ්ඩ අනුව ඉගෙනීමේ අවස්ථා සඳහා පහසුකම් සැලසීම

# නිල ඇඳුම් *(මානවකයින් සඳහා)*
# UNIFORMS (*Rover Scout Section)*

## 66. නිල ඇඳුම - මානවක බාලදක්ෂ
## Uniform – Rover Scout



## 67. නිල ඇඳුම - ගුවන් මානවක බාලදක්ෂ
## Uniform – Air Rover Scout



## 68. නිල ඇඳුම - මුහුදු මානවක බාලදක්ෂ
## Uniform – Sea Rover Scout



## **69.** මානවක බාලදක්ෂ නිල ඇඳුම - සම්මත
## Rover Scout Uniform – Standard

මානවක නිළ ඇඳුම, එහි වර්ණයන් හා නිර්මාණය, ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය අනුමත කර ඇති පරිදි මෙසේ විය යුතුය:

1) **කලිසම** - අනුමත වර්ණය (තද නිල්) - පැන්ටොන් (Pantone) 655 C,



Pantone 655 C

පැති සාක්කු සහිත, කෙලවර වාටිය ඉහලට නොනැමූ දිග කලිසම.

2) **කමිසය** - අනුමත වර්ණ මෙසේය:
මානවක - පැන්ටොන් Cool Grey 9 C
මුහුදු මානවක - පැන්ටොන් 293 C
ගුවන් මානවක - පැන්ටොන් 278 C



Pantone Cool Gray 9 C



Pantone 293 C



Pantone 278 C

අත් කොට, පියන් සහිත සාක්කු යුගලකින් හා උරපටි යුගලකින් සමන්විත කමිසය

3) **හිස් වැස්ම** -
**මානවක** - තද නිල් පැහැති බෙරෙ(ට්) (Beret) හිස්වැස්මේ (අනුමත කළ) ඉහලින් මානවක හිස්වැසුම් පදක්කම

**මුහුදු මානවක** - තද නිල් පැහැති කැප් හිස්වැස්මේ (අනුමත කළ) ඉහලින් මුහුදු මානවක හිස්වැසුම් පදක්කම

**ගුවන් මානවක** - තද නිල් පැහැති සයිඩ් හැට් හිස්වැස්මේ (අනුමත කළ) ඉහලින් ගුවන් මානවක හිස්වැසුම් පදක්කම

4) **කරපලඳනාව** - රතු වර්ණ, තුන් හුලස් කරපලඳනාව, පිටුපස ත්‍රිකෝණාකාර කොටසේ මැද, තම පාසලේ හෝ සමාජයේ හෝ අනුග්‍රාහකත්වය දක්වන ආයතනයේ ලාංඡනය (අනුමත කළ) සහිතව, බාලදක්ෂ වොගලය සමග පැළඳිය හැක.



5) **පාවහන්** - කළු වර්ණ (ඔප දැමිය හැකි) පාවහන්

6) **මේස්** - කළු වර්ණ මේස්

7) **ඉන පටිය** - බාලදක්ෂ ඉන පටිය (අනුමත කළ)

8) **සමූහයේ/සමාජයේ නම** - සෙ.මී.7x1.5 ප්‍රමාණයෙන්, පදක්කමක ආකාරයෙන් සකස් කළ, සමාජය හඳුන්වන නම් පටි 2ක්, කමිස අත ඉහලින්ම පැලඳිය හැක.

9) **පර්ෂද වර්ණ අණ්ඩය** - පර්ෂදයට අයත් වර්ණවලින් සකසන ලද සෙ.මී.3x3 අණ්ඩයක්, වම් අතේ, ප්‍රථමාධාර සේවා පදක්කමට මඳක් පහළින් පැළඳිය හැක.



5) **පර්ෂද නායක/උප නායක අණ්ඩය**

පර්ෂද නායකයින් හඳුනා ගැනීමට **CL** *සෙ.මී.1.5xසෙ.මී.1.5* ප්‍රමාණයේ අණ්ඩයක්ද (CL Patch),

පර්ෂද උප නායකයින් හඳුනා ගැනීමට **ACL** *සෙ.මී.1.5xසෙ.මී.1.5* ප්‍රමාණයේ අණ්ඩයක්ද (ACL Patch),

තම නිල ඇඳුමේ, වම් පස කමිස සාක්කු පියනේ ඉහළ පළඳිනු ලැබේ.

10) සෙ.මී.3x3 පදක්කමක ආකාරයෙන් සකස් කළ **’CL’** හෝ **’ACL’** ලෙස සඳහන් කළ අණ්ඩයක්, කමිසයේ වම් සාක්කු පියනේ ඉදිරිපස පැළඳිය හැක.

## 70. මානවක බාලදක්ෂ නිල ඇඳුම - පදක්කම්
## Rover Scout Uniform - Badges

නිල ඇඳුමේ පලඳින පදක්කම් පහත සඳහන් පරිදි වේ

1) ජාතික බාලදක්ෂ පදක්කම (මානවක)
2) ලෝක බාලදක්ෂ පදක්කම
3) ජාතික ධජය පදක්කම
4) දිස්ත්‍රික් පදක්කම
5) වාර්ෂික සගණන පදක්කම
6) කඳවුරු/ජම්බෝරි පදක්කම
7) 'මානවකයෝ' අනන්‍යතා පදක්කම
8) මානවක පරමාදර්ශ පදක්කම
9) සේවා තරු




10) මානවක උර පලඳනා
11) ප්‍රවීණතා තරු 4 (එක් උර පලඳනාවක තරු 2 බැගින් වන සේ)
12) යහපත් පුරවැසි පළඳනාව (දකුණු උරහිස් අත වටා)
13) යහපත් ලොවක අභිලාශ රාමුව (Better World Framework) ජාත්‍යාන්තර පදක්කම්
14) බී.පී. ප්‍රදානය
15) ජනාධිපති ප්‍රදානය හෝ අග්‍රාමාත්‍ය ප්‍රදානය
16) මානවක උපදේශක පදක්කම- අවශ්‍යතා සම්පූර්ණ කර ඇත්නම්, කමිසයේ වම් සාක්කුවට මදක් ඉහළින් පැළඳිය හැකිය

## 71. මානවක නිල ඇඳුමේ පැළඳිය හැකි ජ්‍යේෂ්ඨ බාලදක්ෂ ප්‍රදානයන්
## Senior Scout Achievements in Rover Uniform






1) මානවක බාලදක්ෂයා විසින් ජනාධිපති ප්‍රදානය හෝ අග්‍රාමාත්‍ය ප්‍රදානය දිනා ගෙන ඇත්නම්, වයස අවුරුදු 26 සම්පූර්ණ වන තෙක් තම නිල ඇඳුමේ ඉහත සඳහන් කළ පදක්කම් දෙකෙන් එකක් (ඉහලම පදක්කම) පමණක් පැළඳිය හැක.

2) ජනාධිපති ප්‍රදානය දිනා ඇත්නම්, එය පමණක් (අවුරුදු 26 සම්පූර්ණ වන තෙක්) බී.පී.ප්‍රදනය හා සමගාමීව පැළඳිය හැකිය.

## 72. මානවක බාලදක්ෂ නායක නිල ඇඳුම් Rover Scout Leaders' Uniform

1) මානවක බාලදක්ෂ නායක නිල ඇඳුම, නිවැරදිව හා ක්‍රමවත්ව, අනුමත කළ පදක්කම් පමණක් සහිතව සකස් වී තිබීම අතිශයින් වැදගත්ය.

2) වෙනත් අංශයක බාලදක්ෂ නායකයින් ලෙස ක්‍රියා කරන මානවකයින්, තම බාලදක්ෂ නායක නිල ඇඳුම, මානවක නිල ඇඳුමත් සමග මිශ්‍ර කර නොගත යුතුය.

3) සාමාජිකත්ව පදක්කම හා බී.පී. ප්‍රදානය හැරුණු විට, බාලදක්ෂ නායකයින්, මානවකයින් ලෙස දිනා ගත් වෙනත් කිසිදු පදක්කමක් තම බාලදක්ෂ නායක නිළ ඇඳුමේ පළඳිනු නොලැබේ. (බී පී ප්‍රදානය, තම ජීවිතාන්තය දක්වා නිළ ඇඳුමේ (මානවක හෝ බාලදක්ෂ නායක) පැළඳිය හැකි පදක්කමකි.

4) බාලදක්ෂ නායකයින් ලෙස කටයුතු කරන මානවකයින්, බාලදක්ෂ නායක නිල ඇඳුමට අමතරව 'මානවක බාලදක්ෂ නිල ඇඳුමක්' (තවත් කමිසයක්), මානවක් ක්‍රියාකාරකම් හා වැඩ සටහන් සඳහා භාවිතා කළ යුතුය. ඊට හේතුව වන්නේ මානවක නිල ඇඳුමේ පලඳින බොහෝ පදක්කම්, බාලදක්ෂ නායක නිල ඇඳුමේ පැලඳීමට අවසර නොතිබීමයි.

5) මානවකයා විසින් බාලදක්ෂයෙකුව සිටි අවධියේදී, ජනාධිපති බාලදක්ෂ පදක්කම හෝ අග්‍රාමාත්‍ය බාලදක්ෂ පදක්කම දිනා ඇත්නම්, බී.පී.ප්‍රදානය දිනා ගන්නා තුරු, එය තම මානවක නිල ඇඳුමේ පැලඳීමට අවසර ඇත. (එහෙත් එම පදක්කම තම බාලදක්ෂ නායක නිල අඳුමේ පැලඳීමට අවසර නොමැත.)

6) බාලදක්ෂ නායකයෙකු ලෙස කටයුතු කරන මානවක බාලදක්ෂයෙකුට, ලී පදක්කම දිනා ගැනීමෙන් පසු වුවද බී පී ප්‍රදානය සඳහා සුදුසුකම් ලබා ගත හැකිය. (මානවක ලී පදක්කම නොවිය යුතුය.)

## 73. මානවක බාලිකාවන් / තරුණියන් සඳහා මාර්ගෝපදේශකත්වය Guideline for the Girls in Rover Scouting

1) ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමයේ 'හානියෙන් සුරක්ෂාව' ප්‍රකාශනයේ ප්‍රතිපත්තීන්ට අනුකූල වන පරිදි කටයුතු කිරීමට සියළුම මානවක තරුණ-තරුණියන් මෙන්ම නායක-නායිකාවන්ද බැඳී සිටින අතර, එම මාර්ගෝපදේශයන් කඩ කරන සැමට එරෙහිව විනය ක්‍රියාමාරග ගනු ලැබේ.

2) මානවක සමාජයක තරුණයන් මෙන්ම තරුණියන්ද සාමාජිකත්වය දරන්නේ නම්, පිරිමි නායකයින්ට අමතරව අවම වශයෙන් කාන්තාවන් දෙදෙනෙකුවත් එහි නායකත්වයට පත් විය යුතුය.

3) තරුණයන් මෙන්ම තරුණියන්ද සාමාජිකත්වය දරණ මානවක සමාජයක, රැස්වීම්, වැඩ සටහන්, කඳවුරු වැනි ක්‍රියාකාරකම්වලදී අවම වශයෙන් කාන්තා නායිකාවන් දෙදෙනෙකුවත් සම්බන්ධ වී සිටිය යුතු අතර, විශේෂයෙන් තරුණියන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා අතිකුත් අවශ්‍යතා සලසා තිබිය යුතුය.

4) මානවක සමාජයක සියළුම මානවකයින් තරුණියන් වේ නම් අවම වශයෙන් කාන්තාවන් දෙදෙනෙකුවත් එහි නායකත්වයට අනිවාර්යයෙන්ම පත්විය යුතු අතර ඒ සඳහා පිරිමි මානවක නායකයින් පත් වීම නුසුදුසුය (සමූහ බාලදක්ෂ නායක හැර).

5) මානවක තරුණියන් කඳවුරු, පාගමන් චාරිකාවල යෙදෙන අවස්ථාවලදී අවම වශයෙන් මානවක තරුණියන් 4 දෙනෙකුවත් ඊට සහභාගි වී සිටිය යුතුය. එසේම වගකිව හැකි කාන්තාවන් දෙදෙනෙකුවත් ඔවුන්ගේ ආරක්ෂාව, ගමන් මග හා ප්‍රගතිය වරින් වර අධීක්ෂණය කිරීම සඳහා ක්‍රියා කළ යුතුය.

6) මානවක තරුණියන් කඳවුරු, පාගමන් හෝ වෙනත් චාරිකාවක යෙදීමට පෙර තම දෙමාපිය/භාරකරුගේ ලිඛිත අවසරයත්, එමෙන්ම කාන්තා කටයුතු බාර හා මානවක කටයුතු බාර සහාය දිසා කොමසාරිස් වරුන්ගේ නිර්දේශය මත දිසා කොමසාරිස් තුමාගේ ලිඛිත අවසරයත්, අවම වශයෙන් සති 2කට පෙර ලබා ගෙන තිබිය යුතුය.

7) මානවක තරුණියන්ගේ පුහුණු කටයුතු සඳහා මානවක තරුණයන්ගේ හා පිරිමි නායකයින්ගේ සහාය ලබා ගත හැකි නමුත්,

එවැනි අවස්ථාවලදී අවම වශයෙන් කාන්තා නායිකාවන් දෙදෙනෙකුවත් සහභාගි වී සිටිය යුතුය.

8) මානවක තරුණියන් කඳවුරු ගත කරන අවස්ථාවලදී, කාන්තාවන් සඳහා පමණක් වෙන් කල ආරක්ෂිත කඳවුරු භූමි පවත්වාගෙන යා යුතු අතර, එම භූමියේ පිරිමින්ට ගැවසිය නොහැක. තවද තරුණියන් සඳහා ආරක්ෂිත වැසිකිළි, ඇඳුම් මාරු කිරීමේ කුටි, වැනි දෑ අදාල භූමියට නුදුරින් පවත්වා ගෙන යා යුතුය.

9) කඳවුර විවෘත කළ අවස්ථාවේ සිට සවස 6.30 දක්වා තරුණියන්ට පිරිමින් සමග එකතු වී විවිධ ක්‍රියාකාරකම්වල යෙදිය හැකි නමුත්, ඉන් අනතුරුව, නැවතත් ආරක්ෂිතව තම කඳවුරු භූමිය වෙත ගමන් කළ යුතුය. ගිණිමැල ක්‍රීඩා වැනි රාත්‍රි කාලයේ පැවැත්වෙන කටයුතුවලදී ඔවුන් තම නායයිකාවන්ගේ අවසරය මත නායිකාවන් සමග එක්ව ක්‍රියා කල යුතුය.

10) කිසිදු හේතුවක් නිසාවත් එක් මානවක තරුණියකට පමණක් කඳවුරු භූමියක හුදකලා වෙමින් ක්‍රියාකාරකම්වල යෙදිය නොහැකි අතර, අවම වශයෙන් තවත් මානවක තරුණියන් දෙදෙනෙකුවත් ඇගේ සහායට සහභාගි විය යුතුය.

11) පර්ෂද කඳවුරු හෝ පාගමන් වැනි රාත්‍රි ගත කරන අවස්ථාවන්හිදි, මානවක තරුණියන් විසින් රාත්‍රි නවාතැන් ගන්නා ස්ථාන, ඔවුන්ගේ රුචිකත්වය අනුව, තම නෑදෑයින්ගේ නිවෙස් ආශ්‍රිතව යොදා ගත හැකි නමුත්, එම ස්ථානයේ ආරක්ෂාව හා වටපිටාව, මානවක නායිකාවන් දෙදෙනෙකු විසින් ගමනට පෙර නිරීක්ෂණය කොට නිර්දේශ කළ යුතුය.

12) අවසාන වශයෙන්, මානවක තරුණියන් විසින් තම ආරක්ෂාව තමන් විසින්ම සලසා ගැනීමට සැමවිටම උත්සාහ දැරිය යුතු අතර, තමන් විසින් මුහුණ පෑ හැකි අනතුරු කල් ඇතිව හඳුනාගමින් නිසි ක්‍රියා මාර්ග අනුගමනය කිරීමට තරම් බුද්ධිමත් විය යුතුය.

## 74. නවකයින්, මානවක ආධුනිකයොන් ලෙස පිළි ගැනීම
## Reception of New-Comers as Rover Recruits

*වයස 17 ½ හා 26 අතර වයසේ පසුවන ජ්‍යේෂ්ඨ බාලදක්ෂයින්, ආදි බාලදක්ෂයින්, බාලදක්ෂ නායකයින් හා බාලදක්ෂ නොවූවන් පිළි ගැනීම සඳහා පවත්වනු ලබන සරල උත්සවයකි.*

*නවකයින් සහභාගි වන මානවක සමාජ රැස්වීමකදී මෙම සරල උත්සවය පැවැත්විය හැකිය.*

**උත්සවය:**
**මා.බා.නා:** සියළුම නවකයින් ........... (නම/නම් ඉදිරියට පැමිණෙන්න.
*(සියළුම නවකයින් මානවකයින්, ඉදිරියට පැමිණ, මානවක බාලදක්ෂ නායකයින්ට මුහුණ ලා පෙළට සිට ගනියි.)*

**මා.බා.නා:** ඔබ මානවක සමාජයට බැඳීමට කැමැත්තෙන් පසුවන බව දැන ගතිමි. ඔබ මානවක බාලදක්ෂ පුහුණුව ලබා ගැනීමට ඉදිරිපත් වී ඇත්තේ ස්ව-කැමැත්තෙන්ද?

**නවකයින්:** එසේය.

**මා.බා.නා:** මානවක කටයුතු යනු එළිමහන් ජීවිතයේ සහෝදරත්වයත්, සේවය කිරීමත් වනු ඇත. මෙම සහෝදරත්වයට සම්බන්ධ වෙමින්, ඔබේ ජීවන රටාව හා සේවය සඳහා වූ කැපවීම වැඩි දියුණු කර ගැන්මට ඔබ කැමතිද?

**නවකයින්:** එසේය, මම කැමැත්තෙමි.

**මා.බා.නා:** ඔබේ ප්‍රථම වගකීම ඔබේ නිවසටත්, එමෙන්ම ඔබේ ජීවිතය සාර්ථක ලෙස ස්ථාපිත කර ගැනීමටත් බව ඔබ අවබෝධ කරගෙන තිබේද?

**නවකයින්:** එසේය.

**මා.බා.නා:** ඔබ ඔබේ මාතෘ භූමියට ආදරය කරන්නේද? එසේම ඔබ අදහන ආගම දහමට අනුව එහි වගකීම් නොපිරිහෙලා ඉටු කරමින්, අන් ආගම්වලටද ගරු කරමින් ජීවත් වීමට මුල පුරන්නේද?

**නවකයින්:** එසේය.

**මා.බා.නා:** මම ඔබේ එකගතාව පිළිගනිමි. මම ඔබව මානවක සමාජයේ මානවක ආධුනිකයෙකු ලෙස පිළි ගනිමි.

*(මා.බා.නා. ඇටුළු නායකයින් අතට අත දෙමින් සුබ පැතුම් එක් කරයි.)*

**මා.බා.නා:** ඔබ දැන් මානවක ආධුනිකයෙකු වේ. ඔබේ මී ලග වගකීම වනුයේ මානවක අනුගාමිකයෙකු වීම සඳහා සූදානම් වීමත්, අනතුරුව හැකි ඉක්මනින් මානවක බාලදක්ෂයෙකු ලෙස දිවුරුම් දීමත්ය.

මා.බා.නා: *(මානවකයින් අමතා)*
මෙන්න අප හා එක්වුණු මානවක ආධුනික .......... (නම/නම්). ඔවුන්ව මානවක සමාජයට (ජයඝෝෂාවක් දී) පිළි ගන්න.

*(මානවක ආධුනිකයා මේ අවස්ථාවේදී සහෝදර මානවකයින් වෙත ගොස් අතට අත දී තම පර්ෂදයට ඇතුළු වේ.)*

## 75. මානවක ආධුනිකයින්, මානවක අනුගාමිකයින් ලෙස උසස් කිරීමේ උත්සවය
## Advancement Ceremony of Rover Recruits to Rover Squires

*වයස 17 ½ - 26 අතර වයසේ පසුවන, මානවක සාමාජිකත්ව පදක්කම සඳහා වූ අවශ්‍යතා සම්පූර්ණ කළ **මානවක ආධුනිකයින්** සඳහා මෙම උත්සවය පවත්වනු ලබයි.*

*මානවක සමාජ මණ්ඩලය විසින් මෙම උත්සවය සංවිධානය කරනු ලැබේ.*

### B. සූදානම

1) උත්සවය ආරම්භ වීමට පෙර අවශ්‍ය පමණ ලෝක සාමාජිකත්ව පදක්කම්, ජාතික සාමාජිකත්ව පදක්කම් (මානවක}, 'මානවකයෝ' අනන්‍යතා පදක්කම්, ධජ, ඇතුළු අවශ්‍යතා සියල්ල සූදානම්ව තිබිය යුතුයි.

2) මානවක බාලදක්ෂ නායක විසින් මානවක ආධුනිකයින්ටත්, ඔවුන්ගේ හිටපු බලදක්ෂ නායකයින්ටත් නිල වශයෙන් ඇරයුම් කළ යුතුය.

3) වෙනත් බාලදක්ෂ සමූහයක ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින්, ආදි බාලදක්ෂයින් සහ වයස අවු 26 නො ඉක්මවූ නායකයින්, මානවක උසස් කිරීමට තෝරාගෙන ඇත්නම්, ඔවුන්වත්, ඔවුන්ගේ සමූහ බාලදක්ෂ නායක, ජ්‍යෙෂ්ඨ බාලදක්ෂ නායක ඇතුළු අනිකුත් නායකයින්ටත් මානවක බාලදක්ෂ නායක විසින් නිල වශයෙන් ඇරයුම් කළ යුතුය.

4) මෙම උත්සවයේදී උසස්වන ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින් අයත්ව සිටි කාණ්ඩයේ (Patrol) ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින්ටද ඇරයුම් කිරීම සුදුසුය.

5) අදාළ මානවක ආධුනිකයින් තම මානවක අනුග්‍රාහකයින් කැටුව පැමිණ තිබීම (මානවක සමාජ මණ්ඩලයේ අනුමැතිය කලින් ලැබී ඇත්නම්) හෝ තම මානවක අනුග්‍රාහකයාගේ කැමැත්ත ලිඛිතව එවා තිබීම අතිශයින් වැදගත්ය.

6) උත්සවය ආරම්භ කිරීම සඳහා, නිල ඇඳුමෙන් සැරසුනු මානවකයින්, මානවක ආධුනිකයින් හා නායකයින් සියළු දෙනා, කොඩිගස වටා රැස්වේ.

7) අශ්ව-ලාඩමක හැඩයට සියළුම මානවකයින් කොඩිගස මැදි කර ගනිමින් එහි එක් පසෙකින්ද, උසස්වන ජ්‍යෙෂ්ඨ බාලදක්ෂයින්, ආදි බාලදක්ෂයින්, නායකයින් හා ඔහුගේ කණ්ඩයේ අනිකුත්

බාලදක්ෂයින්, අශ්ව-ලාඩමක හැඩයට (හෝ එක් පෙළකට) කොඩිගසේ අනිත් පසද, මූණට මූණලා රැස්විය යුතුයි.

8) මානවක අනුග්‍රාහකයින් පැමිණ සිටී නම් ඔහු/ඇය තම මානවක ආධූනිකයා පිටුපස සිටිය යුතුයි.

9) මානවක බාලදක්ෂ නායක, සමූහ බාලදක්ෂ නායක හා/හෝ ජ්‍යේෂ්ඨ බාලදක්ෂ නායක ඇතුළු අනිකුත් නායකයින්, කොඩිගස මැදිවන සේ කොඩිගස ඉදිරිපිට සිටිය යුතුය.

## C. උත්සවය

*මෙම උත්සවය ලැබී ඇති සම්පත් භාවිතා කර, සුදුසු පුද්ගලයින් සහභාගි කරවා ගනිමින්, සුදුසු පරිදි පැවැත්විය හැක.*

*අශ්ව ලාඩමක් සේ සැකසුණු මානවකයින් ද, කොඩිගස පාමුල එහි මධ්‍යයේ රැඳී සිටින සමූහ/ජ්‍යේෂ්ඨ බාලදක්ෂ නායක, මානවක බාලදක්ෂ නායක,ඇතුළු නායකයින්ද, උත්සවය ආරම්භ කිරීමට සූදානමින් සිටී.*

*සමූහ/ජ්‍යේෂ්ඨ බාලදක්ෂ නායක විසින් තම ජේෂ්ඨ බාලදක්ෂයින්ව (මානවක ආධූනිකයින්ව), මානවකයින්ට මූණලා අශ්ව ලාඩමක හැඩයට හෝ තනි පෙළට සිටුවයි.*

*ඉන් අනතුරුව, කොඩිය විහිදුවීම හා ආගම සිහිකිරීම සිදුවෙයි. මානවක බාලදක්ෂ නායක විසින් පැමිණ සිටින සියළුදෙනා පිළිගනිමින් හා උත්සවයේ අරමුණ කෙටියෙන් පැහැදිළි කර දෙයි.*

*අනතුරුව, සමූහ/ජ්‍යේෂ්ඨ බාලදක්ෂ නායක විසින්, උසස් වීමට නියමිත මානවක ආධූනිකයින්ව (ජ්‍යේෂ්ඨ බාලදක්ෂයින්ව), මානවක බාලදක්ෂ නායක වෙත ඉදිරිපත් කරනු ලබයි.*

***සමූහ / ජ්‍යේෂ්ඨ බා.නා:*** මානවක වයසේ පසුවන................ කණ්ඩායමේ *(කණ්ඩායමේ නම)* ජ්‍යේෂ්ඨ බාලදක්ෂයෙකු වන ......................... *(නම)*, මානවක බාලදක්ෂ පුහුණුව ලබා ගැනීමට හැකි වන පරිදි, මානවක සමාජයට උසස් කිරීම සඳහා ඉදිරිපත් කර සිටිමි.

***මා.බා.නා:*** ඔබට ස්තූතියි.

*(මා.බා.නා., මානවක ආධූනිකයා වෙතට හැරී මෙසේ විමසයි.)*

***මා.බා.නා:*** *මානවක සමාජයට අපි ඔබව සාදරයෙන් පිළිගනිමු.* ඔබ, ඔබගේ නිදහස් කැමැත්තෙන්ම මානවක කටයුතු සඳහා ඉදිරිපත් වූයේද?

***මානවක ආධුනිකයා:*** එසේය.

***මා.බා.නා:*** යොවුන් වයසට එළඹී ඇති ඔබගේ ඉදිරි ජීවිතය තවදුරටත් සාර්ථක කර ගැනීමට, මානවක බාලදක්ෂ පුහුණුව ඉවහල් වන බව ඔබට විශ්වාසද?

***මානවක ආධුනිකයා:*** එසේය,

***මා.බා.නා:*** ඔබ ඔබේ මතු අනාගතය මානවක කටයුතු තුළින් ප්‍රගතිය කරා මෙහෙයවනු ඇතැයි උදක්ම අපේක්ෂා කරමු. ඔබට ප්‍රීතිමත් දිවියක් සඳහා සුභ පැතුම්!

***මානවක ආධුනිකයා:*** ඔබට ස්තුතියි.

***මා.බා.නා:*** මානවක සමාජයේ සම්ප්‍රදායානුකූලව බාලදක්ෂ අවධියේ දිනාගත් ප්‍රගති පදක්කම් කිහිපයක් හැර අනිකුත් ප්‍රවීණතා පදක්කම් නිල ඇඳුමේ පළඳිනු නොලැබේ.

මානවකයෙකු වීමට සූදානමක් ලෙස ඔබ විසින් දිනාගත් සියළුම ප්‍රවීණතා පදක්කම් ගලවා ඉවත් කිරීමට ඔබ කැමතිද?

***මානවක ආධුනිකයා:*** එසේය,

*(තම අභිමතය සංකේතාත්මකව ප්‍රකාශ කිරීමට, ඔහු/ඇය, තමන් විසින් තම නිල ඇඳුමේ ඇති ප්‍රවීණතා පදක්කම් එකිනෙක ගලවා ඉවත් කරයි.)*

***මා.බා.නා:*** 'අපි සේවය කරමු' යන මානවක බාලදක්ෂ ආදර්ශ පාඨය අනුව යමින් අන් අයගේ සේවයට කැපවීමට ඔබ සූදානම්ද?

***මානවක ආධුනිකයා:*** එසේය,

***මා.බා.නා:*** ඔබ බාලදක්ෂ පොරොන්දුව හා බාලදක්ෂ නීතිය අනුව තම ජීවිතය හැඩ ගස්වා ගැනීමට පොරොන්දු වන්නේද?

***මානවක ආධුනිකයා:*** එසේය

*(මෙහිදී මානවක ආධුනිකයින් බාලදක්ෂ පොරොන්දුව අළුත් කරයි,)*

> "මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමටද,
> සෑම කල්හිම අනුන්ට උපකාර කිරීමටද,
> බාලදක්ෂ නීතියට කීකරු වීමටද,
> මාගේ අවංක විශ්වාසය උඩ සම්පූර්ණ උත්සාහය යෙදීමට
> ගෞරව බහුමානයෙන් පොරොන්දු වෙමි."

***මා.බා.නා:*** එසේ නම් ඔබව අපගේ මානවක සහෝදරත්වයට 'මානවක අනුගාමිකයෙකු' ලෙස පිළිගනිමු.

*(මෙහිදී මානවක අනුගාමිකයාට පහත සඳහන් පදක්කම් හා කරපලඳනාව පලඳවයි.)*

- ලෝක බාලදක්ෂ පදක්කම (මීට පෙර නොලත් අයට)
- ජාතික සාමාජිකත්ව පදක්කම - මානවක (බාලදක්ෂයින්ගේ පදක්කම් මාරු කළ යුතුය.
- මානවක කරපලඳනාව (රතු පැහැති)

  *(මානවක සාමාජික පදක්කම සඳහා වූ අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නවකයන්ටද (බාලදක්ෂ නොවන) ඉහත පදක්කම් ප්‍රදානය කෙරේ.)*

**<u>මානවක අනුගාමිකයින් සඳහා මානවක අනුග්‍රාහකයින් පත් කිරීම</u>**

**මා.බා.නා.:** ඉදිරි කාලය තුළදී ඔබට සහාය වීමට හා මග පෙන්වීමට, ඔබ විසින්ම තෝරා ගෙන ඇති, .................... (නම) මානවක අනුග්‍රාහකයාව පත් කර සිටින අතර, මෙදින සිට ඔහු/ඇය ඔබට සහාය වනු ඇත.

*මෙ අවස්ථාවේදී මානවක අනුග්‍රාහක විසින් පහත සඳහන් **මානවක අනන්‍යතා පදක්කම**, මානවක අනුගාමිකයාගේ නිල ඇඳුමේ පළඳවයි:*

*(පදක්කම් ප්‍රදානයෙන් පසු මානවක බාලදක්ෂ නායක හා අනිකුත් නායකයින් නවක මානවක අනුගාමිකයින්ට අතට අත දී ආචාර කරමින් සුබ පැතුම් එක් කරයි. අනතුරුව ඔවුන් මානවකයින් දෙසට හැරී ආචාර කරයි.)*

***මා.බා.නා:*** මෙන්න අපට තවත් නවක මානවක අනුගාමිකයන් පිරිසක්. ඔවුන්ව මානවක සමාජයට පිළිගන්න.

*(මෙහිදී සියළු මානවක පර්ෂද නායකයින් ඉදිරියට පැමිණ තම පර්ෂදය වෙත ඔවුන් කැඳවාගෙන යයි.)*

*(උසස් වූ නවක මානවක අනුගාමිකයෙකුට ඉදිරියට පැමිණ තම අදහස් කෙටියෙන් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසා දීම සුදුසුය.)*

## 76. මානවක බාලදක්ෂ දිවුරුම් දීමේ උත්සවය
## Rover Scout Investiture Ceremony

මානවක අනුගාමිකයෙකුගේ දිවුරුම් දීමේ උත්සවය, පියවර 3කින් සමන්විතය.

A. ආරම්භක වැඩසටහන - පැය 2 (පව. 09.00 - 11.00)
B. භාවනාව (ස්වයං-විවරණය) - පැයක් (පව.11.00 - 12.00)
C. දිවුරුම් දීම - මධ්‍යම රාත්‍රියේදී

(**සටහන:** මෙම වැඩ සටහන රාත්‍රී ආහාරයෙන් පසු රාත්‍රී 9.00ට පමණ ආරම්භ කිරීම වඩාත් යෝග්‍යය)

### A. ආරම්භක වැඩසටහන (Preparation) - *(රාත්‍රී 9 - 11 දක්වා)*

මානවක අනුගාමිකයින් නිදි වර්ජිත භාවනාව හා දිවුරුම් දීම සඳහා සූදානම් කිරීම

මානවක බාලදක්ෂ නායක විසින් මෙම වැඩ සටහන මනාව සම්බන්ධීකරණය කළ යුතුය.

1) **කොඩිය විහිදුවීම හා ආරම්භක රැළිය**

2) **ආගමික සංකල්පනාව** -
ආගමික පූජ්‍ය/පූජක තුමෙකුගේ හෝ ගරු කටයුතු ආදර්ශමත් පුද්ගලයෙකුගේ මෙහෙයවීමෙන් සිදු කළ යුතුය.

3) **සාකච්ඡා වටය-1:**
යොවුන්-වැඩිහිටියෙකුගේ මනසින් **බාලදක්ෂ පොරොන්දුව හා නීතිය අවබෝධ කර ගැනීම** හා මානවක පරමාදර්ශී සාරධර්ම 5 ඔවුන් තුල ධාරණය කිරීම

(1) ගෞරවය (Honour)
(2) දැහැමි බව (Spirituality)
(3) දේශ ප්‍රේමීත්වය (Patriotism)
(4) සේවය - තමන්ට මෙන්ම අන්‍යනටත් (Service)
(5) නීති ගරුක බව (Law-abiding)

4) **සාකච්ඡා වටය-2:**
**නව යොවුන් වියේ වැඩිහිටියෙකුට** (Young Adult) **තම ජීවිත ගමනේදී හමුවන අභියෝගතා ජය ගැනීම**
*(බී.පී.තුමන් විසින් රචිත, 'මානවක කටයුතු තුළින් සාර්ථකත්වය කරා' පොතෙහි සඳහන් 'ගල්පර' අනුසාරයෙන්)*

(1) අශ්වයෝ (Horses) - සූදුව හා ඔට්ටු ඇල්ලීම
(2) සුරාව (Wine) - මත් පැන්, අන්තරාක්කාරී මත් ද්‍රව්‍ය භාවිතය, දුම් පානය, සහ අයහපත් පුරුදුවලට ඇබ්බහි වීම.
(3) ස්ත්‍රීන් හා පුරුෂයින් (Women & Men) - ප්‍රීතිමත් පවුල් ජීවිත සංකල්පයට බාධා ගෙන දිය හැකි අසම්මත ලිංගික සම්බන්ධතා සහ සල්ලාලකම
(4) කොවුලා / කොහා හා කපටීන් (Cuckoos & Humbugs) - වංචනිකයින්, රැවටිලි කරුවන්, අන්‍යයන් මුලා කරන්නන්, හා එවැනි පුද්ගලයින්ගේ උගුල්වලට හසු වීම.
(5) අනාධ්‍යාත්මිකත්වය (Irreligion) - දහම් සිතුවිළි හෝ විශ්වාසයන් හෝ ආගමික වත්පිළිවෙත් හෝ තුළින් ජීවිතයට පන්නරයක් ලබා නොගැනීම, හා ජීවිතයට අරුතක් නොමැතිව අසුබවාදීව දිවි ගෙවීම.

*('මානවක කටයුතු තුළින් සාර්ථකත්වය' පොත ඇසුරෙනි)*

*<u>මානවක අනුගාමිකයින්ගේ ප්‍රතිචාර:</u>*
(1) සමාජයේ යොවුන් වැඩිහිටියන් මුහුණ දෙන ගැටළු පිළිබඳ අවබෝධය
(2) මානවක බාලදක්ෂ අරමුණු හා ප්‍රතිපත්තීන් මත පිහිටා ඒවාට විසඳුම සොයා ගන්නා ආකාරය

5) **සාකච්ඡා වටය-3:**
**තාරුණ්‍ය, එහි වටිනාකම හා හැසිරීම් රටාව**
තාරුණ්‍ය වනසන දුර්ගුණ හා ඒවා අභිබවා යාමට ප්‍රගුණ කර ගත යුතු යහපත් ගුණාංග පිළිබඳ අවබෝධය

(1) **ක්ෂණික කෝපය** (Short temper)
තමන්ගේ කටයුතු රිසි සේ සිදු නොවන විට හෝ පුද්ගලයින් ඔබ සමච්චලයට ලක් කරන විට ඔබ කුපිත වන්නේද?
එසේ නොවී, සිනහවක් මුව අග රඳවාගෙන ඔබේ නොරිස්සීම තුලනාත්මක ලෙස සුළු පටු බව ඇඟවීම.
"ඔබ නිවැරදි නම් ඔබට ඔබේ කේන්තිය ප්‍රදර්ශනය කිරීමේ අවශ්‍යතාවයක් නොමැත; ඔබ වැරදි නම්, කේන්ති නොගොස් එය දරා ගත යුතුය.

(2) **දුම්පානය හා මත් ද්‍රව්‍ය භාවිතය** (Smoking & using Drugs)
බාල පරම්පරාව ඔබ අනුගනය කරන බවත්, එසේම දුම්පානය, සුරාව හා අන්තරාකාරී මත් ද්‍රව්‍ය භාවිතය ශරීර සෞඛ්‍යයට අහිතකර බවත් මතක තබා ගන්න.

(3) **අසභ්‍ය වචන භාවිතය** (Bad Language)
ඔබ නොරුස්සන විට විවිධාකාර වචන භාවිතා කර දිවුරන්නෙක්ද? සිතීමෙන් තොරව අසභ්‍ය වචන භාවිතා කරන්නෙක්ද?
එවැනි අවස්ථාවලදී නළා සඟාවක් දී එයින් වලකින්න.

(4) **මන්දෝත්සාහී බව හා වැඩ පැහැර හැරීම**
(Slackness & Shirking)
ඔබ විසින් කළ යුතු කාර්යයක් තවත් අයෙකු ලවා කරවා ගන්නා අයෙක්ද; ඔබට පැවරුණු වැඩක් හෝ ඔබ ලද ක්‍රීඩා කිරීමේ අවස්ථාවක්, අන් අය වෙත පවරන්නේද, හෝ යම් අපහසුතාවයක් මතු වීමට පෙරාතුව එවැන්නක් අනුමාන කරන්නෙක්ද?

කමිස අත ඉහලට නමාගෙන, තමන් විසින්ම ඒ දේ කිරීමට යුහුසුළු වන්න. “අත්විය හැකි නරක ප්‍රතිඵල සිතා බැලිය යුතු නමුත් හොඳම ප්‍රතිඵල අත් දකින්න“ එලෙස පවරුණු කාර්යය කිරීමට යුහුසුළු වන්න.

(5) **ඔපාදූප / කේලාම් කීම** (Backbiting)
ඔබ අන් අයගේ අසාර්ථක වීම් හමුවේ උද්දාමයට පත් වන්නෙක්ද, අන් අයගේ වැරදි අඩුපාඩු පමණක් දකින්නේද?
ඉතාමත් නරක පුද්ගලයෙකුගේ පවා 5%ක හොඳක් තිබිය හැකිය යන ප්‍රතිපත්තිමය කාරණය වටහා ගත යුතුය; ඔබේ වින්දනය එය සොයා ගැනීමයි.

(6) **ඉවසාගත නොහැකි වීම** (Impatience)
ඔබ හිරු රැස් හා සඳ එළිය අත් විඳින්නේද, ඔබ පතනා දේ සිද්ධ නොවන විට තමාගේ අවාසනාවන්ත කමට සාප කරන්නෙක්ද?
"සෙමින් ඉලක්කයට ලං වන්න." එය ඉක්මනින් එහා මෙහා විය හැක.
"ඉලක්කයටම සිත යොමන්න, ඔබ ජයග්‍රහණය කරනු ඇත."
"ඉවසිලිවන්තකම ඕනෑම කර්තව්‍යයක සාර්ථකත්වයේ රහසයි."

(7) **නීරසබව/උදාසීන බව** (Stodginess)

'කවටකම' යනු කුමක්ද?

සෑම දෙයකම අවම වශයෙන් 5%ක හොඳක් අත්තා සේම තවත් 5%ක විනෝදයක් අඩංගුවී ඇත. මෙය හඳුනා ගැනීමෙන් ඔබව අන් අයට ප්‍රියමනාප වනු ඇති අතර එසේ නොවන්නේ නම් බලාපොරොත්තු රහිත ප්‍රශ්නවලට මූන දීමට සිදුවිය හැක. යම් කාර්යයක නියැළී සිටින අතරතුර සිනාසිය හැකි ආකාරය ඔබේ මිතුරන්ට පෙන්වා දෙන්න.

(8) **දරගැනීමේ නොහැකියාව/නොරිස්සීම** (Intolerance)

ඔබ ඔබේ සමාජීය තත්වය, දේශපාලන පක්ෂය හෝ තම ආගමික පිළිවෙත පිළිබඳව අවශ්‍ය ප්‍රමාණයට වඩා උද්දාමට පත් වන්නේද?

මෙම තාන්න මාන්න, බාලදක්ෂ සහෝදරත්වය හමුවේ යටපත් වනු ඇත. විඳ දරා ගැනීම අත් දකින්න. ඔබ කිසියම් ප්‍රශ්නයක් හමුවේ තීරණයකට එළඹීමට පෙර, එම ප්‍රශ්නයේ දෙපැත්තම සිතා බලන්න

(9) **ස්වයං-නිර්ණය/තනි මතයට ක්‍රියා කිරීම**

(Self-determination/Disobedience)

ස්වයං නිර්ණය, බොහෝවිට අකීකරුකම විදහාපාන අතර, තනි මතයට ක්‍රියා කිරීම සහ විනයක් නොමැතිවීම පෙන්නුම් කරයි. තම මතයට නොව වැඩි පිරිසකගේ එකගත්වය මත වගකීම් බාර ගැනීම හා ස්වයං-විනය වර්ධනය කරගත යුතුය

(10) **ආත්මාර්ථකාමීත්වය** (Selfishness)

මෙය අප දිවි ගමනේ නරකම කඩා වැටීම වන අතර අදූරදර්ශී වටපිටාවක් නිර්මාණය කරයි. පෞද්ගලික හා පොදුවේ සෑහීමකට පත් විය නොහැකි වනසේ බලපායි.

පරාර්ථකාමීත්වය අත් දකින්න; එනම් අන්‍යයන් පළමුවට, තමා දෙවනුවට.

පුළුල්ව බලන්න.

(11) **අතෘප්තිමත්බව / කලකිරුණුබව** (Discontent)

සාමාන්‍යයෙන්, තමා කේන්ද්‍රස්ථානය වීමේ හා ජීවිතය ඉතා සංකීර්ණ ලෙස සිතීමේ ප්‍රතිඵලයයි.

අන් අය සතුටු කිරීමෙන් තම සතුට අත් විඳින්න.

තමා ලද දේවල ඇති වටිනාකම, ජීවිතයේ ඇති සතුට, සොබා දහමේ ඇති මහිමය, අශ්වර්යමත්බව හා චමත්කාරය හඳුනා ගන්න.

පෞද්ගලික අභිමතාර්ථ ඉවත දමන්න.

(12) **අසුබවාදීවීම** (Pessimism)

ඔබ ජීවිතයේ කිසියම් කර්තවයක ඇති දුෂ්කරතා හා බියකරු බව නිසා, ඔබට කළ හැකි දේ යටපත් කර දමනවාද?

"විය හැකි නරකම දේ සිතන්න; එහෙත් හැමවිටම හොඳම දේ ලබා ගැනීමට සිත යොදන්න"

සුබවාදී වීම යනු අන්‍යයන්ට දැඩි විශ්වාසයෙන් කටයුතු කිරීම දිරි ගන්වන ක්‍රමවේදයක් වන අතර සාර්ථකත්වය කරා ඔබ මෙහෙයවයි.

(13) **පටු අදහස් දැරීම / අගතගාමී** (Narrow-mindness)

කිසියම් ප්‍රශ්නයකදී ඔබ දරණ මතය නිවැරදි බවට උදම් අනන්නේද? අහංකාර වන්නේද?

පුළුල්ව බලන්න, නැවත නැවතත් තවත් පුළුල්ව බලන්න.

(14) **තමා සියල්ල දන්නා බව සිතීම** (Know-all)

තමා බාලදක්ෂ කටයුතු ගැන A සිට Z දක්වා සියල්ල දන්නා බව අඟවන්නේද?

ලොවේ පවතින දෙයාකාර වූ බුද්ධි මට්ටම් අවබෝධ කර ගන්න

*('මානවක කටයුතු තුළින් සාර්ථකත්වය' පොත ඇසුරෙනි)*

## B. භාවනාව (ස්වයං-විවරණය)
## Vigil (Self-Examination)

- *ආදර්ශමත් මානවක බාලදක්ෂ නායකයෙකු, විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චය කරුවෙකු වැනි මානවක අනුගාමිකයාට ආදර්ශයට ගත හැකි, ගරු කටයුතු පුද්ගලයෙකු විසින් මෙහෙයවීම වඩාත් සුදුසුය.*

- *පන්සල් භූමියක, වෙනත් ආගමික සිද්ධස්ථානයක් අබියස හෝ නිසසල නිහඬ පරිසරයක පැවැත්වීම මේ සඳහා වඩාත් යෝග්‍ය වනු ඇත.*

- *පහනක හෝ ඉටිපන්දමක සීමිත ආලෝකය එක් එක් මානවක අනුගාමිකයාට ලබා දෙමින්, මෙනෙහි කිරීමට සුදුසු වටපිටාවක් නිර්මාණය කර දිය යුතුය.*

- *පහත සඳහන් ස්වයං-නිර්ණ ප්‍රශන මාලාව, ඔවුන්ට ඇසෙන සේ සෞම්‍ය ලෙස, ඔවුන්ට නොපෙනෙන පසුබිමක සිට කියවීම වඩාත් සුදුසුය.*

- *තම පිළිතුර භාවනාත්මකව අවබෝධ කර ගත හැකි වන සේ, එක් එක් ප්‍රශ්නය අවසානයේදී තත්පර 15-30 අතර කෙටි විරාමයක් ලබා දීම වඩාත් සුදුසුය.*

**1) ප්‍රවේශය:**

(1) කාර්ය බහුල අප ජීවිතයන් තුළ ඇතුලාන්තය පරීක්ෂා කර ගැන්මට නිහඬතාවය හා මෙනෙහි කිරීම අවශ්‍ය බව අපි වටහා ගනිමු.

(2) මෙම සාමකාමී හා නිහඬ වට පිටාව තුල අපගේ සිත් වඩා උසස් තත්වයකට ඔසවා තබා, අපි අපේ දුර්වලතා හා අප අතින් සිදුවූ වැරදි අඩුපාඩු හදවතින්ම හඳුනා ගෙන, ඒවා නිවැරදි කර ගැන්මට උත්සාහ දරමු.

(3) මෙහිදී අප සිත් තුළට ගලා එන සිතුවිලි හා ධාරණය කර ගන්නා විසඳුම් මගින් අප සිත් සතන් තුළ සාමය ඇතිවන බවත්, අධ්‍යාත්මික ශාන්තිය උදාවන බවත් තරයේ විශ්වාස කරමු.

(4) ඒකාකාරී ජීවිතයකට හුරු පුරුදුවී සිටින අපි දැන් මඳක් අපේ හුරු පුරුදු හා සිතුම් පැතුම් වලින් ඈත්වී ඇතුලාන්ත සාරධර්ම වෙත සිත් සතන් යොමු කරමු.

**2) භාවනාව (ප්‍රශ්න මාලාව):**

(1) ස්වභාව ධර්මයා විසින් මා වෙත පිරිනමා ඇති මෙම වටිනා ජීවිතයේ අරමුණ මා අවබෝධ කරගෙන තිබේද, මා එහි විපුල ප්‍රයෝජන සලසා ගත්තේද?

(2) වැදගැම්මකට නැති දෑ කිරීමෙන් මා එය අපතේ හරිනවාද, නැතිනම්ක්‍රමයෙන් පරිහානිය කරා ගෙන යමින් සිටින්නේද?

(3) කිසිවෙකුටත් ප්‍රයෝජනවත් ගෙන නොදෙන හා අන් අයට හිතකර නොවූ දේවල්වල මා නිරත වන්නෙක්ද?

(4) අන්‍යන්ට උදව් වීම ඉවත ලා හෝ අන්‍යයන් ගැන නොසිතා, මා මගේ හුදු විනෝදය හෝ මුදල් ඉපයීම හෝ උසස්වීම් හෝ ගැනම වැඩි බලාපොරොත්තු තබන්නේද?

(5) මගේ ජීවිතයේදී මා විසින් අන් අයගේ සුවසෙත පිණිස උපකාර කිරීමට මැළි වූනාද? උපකාර කලේ නම් එසේ කිරීමේදී නැවත ප්‍රතිඋපකාර හෝ වාසි බලාපොරොත්තු වූනාද?

(6) මගේ ජීවිතයේදී අනතුරක් හෝ හිංසාවක් කරන ලද්දේ කා හටද? මම එසේ කළේ ඇයි? මා ඒ ගැන අවංකවම කණගාටු වෙනවාද? මට ඊට පිළියම් යෙදිය හැකිද?

(7) මා මානවක කටයුතු සඳහා ඉදිරිපත් වූයේ කුමක් අරමුණු කර ගෙනද? මගේම සතුට පතා හෝ පදක්කම් හෝ ප්‍රදාන පමණක් සලකා ඒ සඳහා යොමු වූයේද?

(8) මානවකයෙකුගේ ආදර්ශ පාඨය වන "සේවය" යන්න මා හෙඳින් අවබෝධ කරගෙන තිබේද? එම ආදර්ශ පාඨය අනුව පරිත්‍යාගයෙන් හා කැපවීමකින් අන්‍යයන්ට මෙන්ම මටත් සේවය කිරීමට මම සූදානම්ද?

(9) මගේ ජීවිතයේදී මා උදව් කර ඇත්තේ කා හටද? මා එදිනෙදා වැඩ කටයුතුවලදී මා සත්‍ය වශයෙන්ම මට වඩා අන් අයගේ අවශ්‍යතා හා පහසුව ගැන සිතන්නේද? මම 'මට පෙර ඔබේ පහසුව' සංකල්පය අනුගමනය කරන්නෙක්ද?

(10) මා මගේ දෙමාපියන්, සහෝදර සහෝදරියන් හා වැඩිහිටියන් සමග සුහදව, සතුටින් කටයුතු කරන්නේද?

(11) මම මගේ දෙමාපියන්ගේ අවවාද පිළිපදිමින්, ඔවුන්ගේ ගෞරවය හා අභිමානය ආරක්ෂා කරමින් ජීවත් වන්නේද? මම කෙදිනක හෝ ඔවුනට අගෞරවය ගෙන දී තිබේද?

(12) මා මගේ අසල්වාසීන්, නෑදැයින් හා මිතුරන් සමග සමග සුහදව, ඔවුන්ට කරදරයක් නොවන පරිදි ජීවත්වන්නේද? ඔවුන්ගේ සිත් රිදෙන සේ කටයුතු කර තිබේද?

(13) මගේ පවුලේ උදවිය, පාසලේදී/වැඩපොලේදී, ගමන් බිමන් වලදී හා වෙනත් අවස්ථාවන්හිදී මුණගැසෙන, ඇසුරු කරන සැමදෙනා මා ගැන සිතන්නේ කුමක්ද? ඔවුන් විසින් මා යහපත්, ආදර්ශමත් පුද්ගලයෙකු ලෙස පිළිගනු ලබනවාද?

*(14)* යම් හේතුන් නිසා කවරෙකු හෝ මට එරෙහිව නැගී සිටිනු දැක තිබේද? එසේ නම් එය සමතයකට පත්කොට ඔවුන් නැවතත් සමගි කරවා ගැනීමට මා ක්‍රියා කර තිබේද?

***මානවක අනුගාමිකයා සිසුවෙක් නම්:***

(15) මගේ අනාගත සුරක්ෂිත භාවය හා යම් දිනක අභිමානයෙන් යුතුව දිවි පෙවෙතක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණින්, මම මගේ උසස් අධ්‍යාපන කටයුතු හෝ වෘත්තීමය පුහුණු කටයුතු සඳහා උපරිම ශක්තිය යොදන්නේද?

(16) මම මගේ ගුරු-දෙගුරුන්ට විශ්වාස කටයුතු පුද්ගලයෙක්ද?

---

**මානවක අනුගාමිකයා රැකියාවක නිරත වන්නෙක් නම්:**

(17) මට මගේ රැකියාවේ ප්‍රගතියක් දකින්නට තිබේද?

(18) මම මගේ වැඩ මූලිකයන්ගේ උපදෙස් පිළිපදින්නේද? මම මගේ රැකියා ආයතනයට සාධාරණ සේවයක් කරන්නේද?

(19) මගේ වැඩ මූලිකයන් මා සලසන සේවය පිළිබඳ සතුටු වන්නේද? මගේ ආකල්ප හා කැපවීම ඔවුන් අගය කරන්නේද?

(20) මම වැඩ පොලෙන් කිසියම් හෝ වංචාවක් හෝ සොරකමක් කර ඇත්ද? එසේ නම් මට එය සමතයකට පත් කර ගත හැකිද?

(21) මම මගේ රැකියා ස්ථානයේ සේවකයන් සමග යහපත් සම්බන්ධතාවයක් හා මිත්‍රත්වයක් පවත්වාගෙන යන්නේද?

---

(22) සතුට උදා කර ගැනීමේ හොඳම ක්‍රමය අන් අය සතුටු කිරීම බව මම අවබෝධ කරගෙන තිබේද?

(23) මා නිතරම කෝපයට පත් වන්නෙක්ද? යම් දෙයක් මට රිසි සේ නොවන විට එය දරා ගැනීමට ඉවසීම තිබේද?

(24) මම මගේ චරිතයේ දුර්වලථා හඳුනාගෙන තිබේද? අන් අය නොදන්නා එහෙත් මා තුල ඇති නරක හැසිරීම් මොනවාද?

(25) මා තුල පවතින වැරදි ආකල්ප ජීවිතයෙන් අතුගා දැමීමටත් යහපත් සාර ධර්ම ප්‍රගුණ කර ගැනීමටත් කැපවීමට අධිෂ්ඨාන කර ගත හැකිද?

(26) මා නොදන්නා එහෙත් වරින් වර අන් අය විසින් මට පෙන්වා දී ඇති මා සතු දුර්ගුණ මොනවාද? මම ඒවායින් මිදෙන්නේ කෙසේද?

(27) මම සුදුවට ඇබ්බහි වූවෙක්ද? දුම් පානය කරන්නෙක්ද? බේබද්දෙක්ද? නැතිමන් මත් ද්‍රව්‍ය පාවිච්චි කරන්නෙක්ද? එමම එවැනි දුර්ගුණවලින් මිදෙන්නේ කෙසේද?

(28) මා කිසියම් දිනක අන් අය චරිත ඝාතනයකට ලක් කර තිබේද? එසේනම් මා එසේ කළේ ඇයි? ඒවා වහාම නිවැරදි කිරීමට මට ක්‍රියා කළ හැකිද? චරිත ඝාතනය, ජීවිත හානි කිරීමකට වඩා දරුණු එල විපාක දෙන්නක් බව දන්නෙහිද?

(29) මා මගේ ආගම දහම හා වත් පිළිවෙත් අනුව ජීවත්වන්නේද? අධ්‍යාත්මිකව මා ශක්තිමත්ද? එසේ නොවේ නම් අද සිට හෝ දහම් මග යාමට මට අධිෂ්ඨාන කර ගත හැකිද?

(30) මා මගේ මාතෘ භූමියට ආදර කරන්නෙක්ද? මගේ රට වෙනුවෙන් නිසි වගකීම් දරන්නෙක්ද?

(31) නීත්‍යානුකූලව පත්වූ ප්‍රජාතන්ත්‍රවාදී රජයකට එරෙහිව, රට ආගාධයට ගෙන යන කාර්යයන් සඳහා මා අනුබල දෙන්නෙක්ද?

(32) මම සාමකාමී ජීවන රටාවක් සහිත පුරවැසියෙකු ලෙස මගේ රටෙහි සංවර්ධනයට දායකකත්වය ලබා දීමට සූදානම්ද?

(33) මා සතුව මගේම මනසක් තිබේද? නො එසේ නම් අනුන්ගේ වැරදි පෙළඹීම්වල පහසුවෙන් හසුවන, අනුන් විසින් පාලනය කරනු ලබන මනසක්ද මට ඇත්තේ?

(34) මගේ මනස, යහපත් සිතුවිලි හා ක්‍රියාවන් වලින් පරිපූර්ණ කර ගැනීමට මා උත්සාහ දරන්නෙමද? සිතට එකග නොවන සෑම කරුණකදීම ඊට එරෙහි වීමට මට ශක්තිය තිබේද?

(35) ලිංගිකතවය යනු මිනිස් සංහතියේ පැවැත්ම හා අදාල උතුම්වූ ක්‍රියාදාමයක් බව මා අවබෝධ කරගෙන තිබේද?

(36) මා කෙදිනක හෝ හුදෙක් ලිංගික ආස්වාදය පිණිස පමණක් අසම්මත හෝ පිළිගත නොහැකි ප්‍රේම සම්බන්ධතා පවත්වා ගෙන ගොස් තිබේද? එසේ නම් මම එවැනි සම්බන්ධතාවලින් ගැළවෙන්නේ කෙසේද?

(37) මම උතුම් ලිංගිකත්වය අවභාවිත කර හෝ අපයෝජනය කර තිබේද? එවැනි සම්බන්ධතාවලින් මා මිදෙන්නේ කෙසේද?

**අවිවාහකයින් සඳහා:**

(38) මා උතුම් වූ විවාහ ජීවිතය ප්‍රාර්ථනා කරන්නෙක්ද?

(39) මා විවාහය සම්බන්ධයෙන් සුබවාදී අදහස් දරන්නෙක්ද? එසේ නොවන්නේ නම්, මගේ ආකල්ප සුබවාදී කරගන්නේ කෙසේද?

**විවාහකයින් සඳහා:**

(40) මම යහපත් පවුල් සංස්ථාවක් පවත්වාගෙන යන අයෙක්ද? යම් අඩුපාඩුවලදී මම මගේ භාර්යාව / ස්වාමි පුරුෂයා සමග සංහිඳියාවෙන් කටයුතු කරන්නෙක්ද?

(41) මම මගේ භාර්යාවට / ස්වාමි පුරුෂයාට අවංකද? යහපත් පවුල් ජීවිතකට විත කරන, එකිනෙකා අතර විශ්වාසය කඩවන අයුරින් කටයුතු කර තිබේද? එසේ නම් නැවත යථා තත්වයට පැමිණිය හැක්කේ කෙසේද?

(42) කාන්තාවන්ට, වැඩිහිටියන්ට, ළමුන්ට හා අසරණයින්ට මා විසින් ලබා දියයුතු සැලකිල්ල සහ දායකත්වය ලබා දී තිබෙනවාද? නොඑසේ නම් ඔවුන් අපහසුතාවන්ට පත්වන අයුරින්ද මා කටයුතු කර ඇත්තේ?

(43) මට විවිධ අවශ්‍යතා සහිත වූවන් සඳහා පිහිට විය හැකි අවංක පුද්ගලයෙකු විය හැකිද?

(44) අවසාන වශයෙන්, මට මානවක කටයුතු තුළින් යහපත් ජීවන රටාවක් සහිත පුරවැසියෙකු ලෙස සමාජ ගතවී අභිමානයෙන් යුතුව සාර්ථක ලෙස ජීවත් වීමට අධිෂ්ඨාන කර ගත හැකිද?

3) **ස්වයං-විවරණය**

තම සිත් සතන් තුල ආවර්ජනය වී ඇති තමාට අදාළ කරුණු කාරණා පිළිබඳව ස්වයං විවරණයක් කර ගැනීමට මානවක අනුගාමිකයින්ට අවස්ථාව සලසා දෙන්න. *(මිනිත්තු 10-15 පමණ)*

***(සටහන:** .ඒ අතරතුර දිවුරුම් දීමේ උත්සවයේ සූදානම පිළිබඳව සොයා බැලීමට මානවක බාලදක්ෂ නායකට අවකාශ ලබා ගත හැක.)*

**C. දිවුරුම් දීම (ගාම්භීර)** – *මධ්‍යම රාත්‍රියේදී ආරම්භ කෙරේ.*
**Investiture (Solemn)** – *Commences at mid-night*

1) **හැඳින්වීම:**
   (1) භාවනාව හා ස්වයං-විවරණය නිමා වීමෙන් පසුව, මධ්‍යම රාත්‍රිය පසුවී නව දිනයක් උදාවන මොහොතේ, දිනයේ ප්‍රථම කර්තව්‍යය ලෙස දිවුරුම් දීම ආරම්භ කළ හැක.
   (2) සූදානම් වීමේ සාකච්ඡා වට හා භාවනාව සඳහා යොමු කළ මනවක අනුගාමිකයින් ඕනෑම සංඛ්‍යාවක් එක් දිනක් තුළදී දිවුරුම් දීම සඳහා සහභාගි කරවා ගත හැකි නමුත් එක් වරකදී දිවුරුම් දිය හැක්කේ ඉන් **8 දෙනෙකුට** පමණි.
   (3) මානවක අනුගාමිකයින් 8 දෙනෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් එක් දිනකදී දිවුරුම් දීම සඳහා සූදානම් ඇත්නම්, මධ්‍යම රාත්‍රියෙන් පසු වීමත් සමග, ඔවින් 8 දෙනා බැගින් වෙන වෙනම දිවුරුම් දීම සිදු කළ යුතුය. (මධ්‍යම රාත්‍රියේදී)
   (4) දිවුරුම් දුන් මානවකයින් හා නායකයින් විසින් දිවුරුම් දෙනු ලබන ස්ථානය හා එහි අවශ්‍යතා සූදානම් කළ යුතුය. දිවුරුම් දී නැති කිසිවෙකු, එමෙන්ම ආරාධිත අමුත්තන් එම ස්ථානයේ කිසිදු කටයුත්තකට සම්බන්ධ නොවිය යුතුය.
   (5) අවශ්‍යතාව පරිදි බාලදක්ෂ නිලධාරීන්ට හා අමුත්තන්ට (දිවුරුම් දී නැති) සූදානම් වීමේ සාකච්ඡා වට සඳහා ආරාධනය කළ හැකි නමුත් භාවනාව ආරම්භ වීමට පෙර ඔවුන් ඉවත්ව යා යුතුය. (රාත්‍රී 11.00ට පෙර). නැවත, දිවුරුම් දීමේ උත්සවයෙන් අනතුරුව නවක දිවුරුම් දුන් මානවකයින්ට සුභ පැතීම සඳහාත්, සුළු සංග්‍රහය සඳහාත් ඔවුන්ට සහභාගි විය හැක.
   (6) දිවුරුම් දීමට සිටින මානවක අනුගාමිකයින්, දිවුරුම් දීම ආරම්භ වීමට මොහොතකට කලින් එම ස්ථානයට කැඳවාගෙන ආ යුතුය. (අඳුර තුළින්)
   (7) මෙම උත්සවය ඉතාමත් ගහම්භීර හා ගෞරවාන්විත ලෙස පැවැත්විය යුතු අතර මානවක අනුගාමිකයින්ට, තමන් නව ජීවිතයකට ඇතුළු වන බව හැ-ිය යුතුය.

2) **අවශ්‍යතා:**
   (1) ජාතික කොඩිය, බාලදක්ෂ හා මානවක කොඩි
   (2) බාලදක්ෂ යෂ්ටියකට සවි කළ මානවක කොඩිය (බාලදක්ෂ පොරොන්දුව අළුත් කිරීම සඳහා)

(3) නිර්මාතෘවරයාණන්ගේ පින්තූරයක් (ක්‍රමවත්ව පිළියෙල කළ මේසයක් මත)
(4) මැටි පහන් හෝ ඉටි පහන් 13ක්, ගිනි පෙට්ටියක්
(5) අසිපතක (කඩුවක) අකෘතියක් (සත්‍ය අසි පතක් අවශ්‍ය නොවේ)
(6) සංකේතාත්මක අත් දෝවනය සඳහා වතුර භාජනයක් හා අත් පිසනයක්
(7) 'මානවක කටයුතු තුලින් සාර්ථකත්වය' හා 'බාලදක්ෂ විද්‍යාව' පොත් *(ඇත්නම්)*
(8) ප්‍රදර්ශනය සඳහා බී පී ප්‍රදානයක් *(ඇත්නම්)*
(9) මානවක උර පළඳනා

3) **උත්සවයේ ආරම්භය:**

*මානවක බාලදක්ෂ නායක ඉදිරියේ, මානවක බාලදක්ෂයින් අශ්වලාඩමක හෝ අර්ධ-කවාකාර හැඩයට රැස්ව සිටී.*

*ශාලාව අඳුරේ පවතී.*

*මේ අවස්ථාවේදී අනුග්‍රාහකයින් හා දිවුරුම් දීමට සිටින මානවක අනුගාමිකයින් උත්සව භූමියට පැමිණ, අන් මානවකයින් ඉදිරියේ, මානවක බාලදක්ෂ නායකට මූණ ලා පෙළ ගස්වයි.*

(1) <u>මානවක බාලදක්ෂ නායක විසින් සභාව කෙටියෙන් අමතයි.</u>
*දිවුරුම් දීමේ උත්සවයේ ඇති වටිනාකම පැහැදිලි කර දෙයි. දිවුරුම් දීමට පැමිණ සිටින මානවක අනුගාමිකයින් මෙසේ ආමන්ත්‍රණය කරයි.*

***මා.බා.නා:*** මානවක කටයුතු තුළින් සාර්ථකත්වය උදා කර ගත් දස දහසක් දෙනා අතරට එකතුවී, සාර්ථකත්වය උදා කර ගැනීමට ඔබටත් වාසනාව ලැබේවා යයි මා ප්‍රාර්ථනය කරනවා

(2) <u>පහන් වැටි / ඉටි පහන් දැල්වීම</u>
***මා.බා.නා:***
බාලදක්ෂ ව්‍යාපාරය නැමැති ගොඩනැගිල්ලේ අත්තිවාරම බඳු වූ බාලදක්ෂ පොරොන්දුව හා නීතිය තුලින් ලොවට ආලෝකයක් ලබා දීම සංකේතවත් කරමින් අපි දැන් මෙම පහන් වැටි / ඉටි පහන් දල්වමු.

පහනක් තමන් දැල්වෙමිනන් අවට සැමට ආලෝකය ලබා දෙන්නා සේ, අන් අයට සෙත සලසමින් ඔවුන්ගේ ජීතිත දීප්තිමත් කිරීමට කාලය හා ශ්‍රමය වැය කිරීමට මෙම මානවක අනුගාමිකයින්ටද හැකි වේවා

- *මෙහිදී රැස්ව සිටින මානවක බාලදක්ෂයින් හා අනුග්‍රාහකයින් ද, අවශ්‍යතාව මත නායකයින්ද, අනු පිළිවෙලට බාලදක්ෂ පොරොන්දුවෙහි කරුණු 3 හා බාලදක්ෂ නීතියෙහි කරුණු 10 ඇතුලත් එක් එක් කරුණ උච්චාරණය කරමින්, මේසයක් මත ක්‍රමවත්ව තබා ඇති පහන් වැටි 13 දල්වයි.*

- *බාලදක්ෂ පොරොන්දුව උච්චාරණය කරන විට රැස්ව සිටින සියළු දෙනා බාලදක්ෂ සලකුණ දක්වමින් සිරුවෙන් සිටී.*

- *පහන් වැටි/ඉටි පහන් දැල්වීම සඳහා දිවුරුම් දීමට නියමිත මානවක අනුගාමිකයින් සහභාගි කර නොගැනේ.*

*(එක් එක් පහන් වැටි/ඉටිපහන් දල්වන විට...)*

<u>බාලදක්ෂ පොරොන්දුව</u>

1) මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමට සම්පූර්ණ උත්සාහය යෙදීමට ගෞරව බහුමානයෙන් පොරොන්දු වෙමි.
2) සෑම කල්හිම අනුන්ට උපකාර කිරීමට සම්පූර්ණ උත්සාහය යෙදීමට ගෞරව බහුමානයෙන් පොරොන්දු වෙමි
3) බාලදක්ෂ නීතියට කීකරු වීමට සම්පූර්ණ උත්සාහය යෙදීමට ගෞරව බහුමානයෙන් පොරොන්දු වෙමි

<u>බාලදක්ෂ නීතිය</u>

1) බාලදක්ෂයා විශ්වාස කටයුතු අයෙකි.
2) බාලදක්ෂයා පක්ෂපාතී අයෙකි.
3) බාලදක්ෂයා හිතෛෂිය කාරුණික අයෙකි.
4) බාලදක්ෂයා සෑම බාලදක්ෂයෙකුගේම සහෝදරයෙකි.
5) බාලදක්ෂයා ධෛර්ය සම්පන්න අයෙකි.
6) බාලදක්ෂයා සත්ත්ව කරුණාව ඇති අයෙකි.
7) බාලදක්ෂයා සහයෝගයෙන් ක්‍රියා කරන්නෙකි.
8) බාලදක්ෂයා සොම්නස් සහගත අයෙකි.
9) බාලදක්ෂයා සැකසුරුවම් අයෙකි.
10) බාලදක්ෂයා සිත, කය හා වචනයෙන් පිරිසිදු අයෙකී..

(3) <u>**ආගම මෙනෙහි කිරීම**</u>

***මා.බා.නා:*** දැන් අපි මොහොතක් අප අදහන ආගම මෙනෙහි කරමු.

*(මෙහිදී සියළු දෙනා නිශ්ශබ්දව ආගම මෙනෙහි කරයි)*

(4) <u>**මානවක අනුගාමිකයින් ඉදිරිපත් කිරීම**</u>

***මා.බා.නා:*** *ගාම්භීර වූ දිවුරුම් දීම බලාපොරොත්තුවෙන් සිටින මානවක අනුගාමිකයින් මා වෙත ඉදිරිපත් කරන්න.*

***අනුග්‍රාහක:*** ලෝක *මානවක* සහෝදරත්වයට ඇතුලත් වීමේ අපේක්ෂාවෙන්, දිවුරුම් දීම සඳහා පැමිණ සිටින........................ (නම) මානවක අනුගාමිකයා ඔබ වෙත ඉදිරිපත් කර සිටිමි.

***මා.බා.නා: (අනුග්‍රාහකයා අමතමින්):*** ඔහු ඒ සඳහා සුදුස්සෙක්ද?

***අනුග්‍රාහක:*** එසේය. ඔහුගේ දුර්වලකම් ඔහුම දන්නා බැවින් හා එම දුර්වලකම් මැඩ පවත්වා ගැනීමට, ඔහු සම්පූර්ණ උත්සාහය යෙදීමට අධිෂ්ඨාන කර ඇති නිසා ත්, ගෞරවාන්විතව, සත්‍යවාදීව හා සෑම ක්‍රියාවලියකදීම සිත, කය හා වදනින් පවිත්‍රව සිටීමට අධිෂ්ඨාන කර ඇති නිසාත්, ඔහු එයට සුදුස්සෙකි.

***මා.බා.නා:*** *(මානවක අනුගාමිකා දෙසට හැරී)*
ඔබ ස්වකැමැත්තෙන්ම මානවක බාලදක්ෂයින්ගේ සහෝදරත්වය සඳහා ඉදිරිපත් වූයේද?

***අනුගාමික:*** එසේය.

***මා.බා.නා:*** ඔබගේ මානවක අනුග්‍රාහක ප්‍රකාශ කළ පරිදි, මානවකයෙකු ලෙස ගෞරවාන්විතවූ ජීවිතයක් ගත කිරීමට ඔබ අධිෂ්ඨාන කර තිබේද?

***අනුගාමික:*** එසේය.

(5) <u>***සේවයට කැප වීම***</u>

***මා.බා.නා:*** ඔබ මානවක බාලදක්ෂ ආදර්ශ පාඨය දන්නෙහිද?

***අනුගාමික:*** එසේය. "අපි සේවය කරමු" යන්නයි.

***මා.බා.නා:*** සේවය යනුවෙන් ඔබ අදහස් කරනුයේ කුමක්ද?

***අනුගාමික:***
මගේ ආගම හා රට වෙනුවෙන් මගෙන් ඉටුවිය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමත්,

මගේ අසල්වැසියන්ටත්, අවශ්‍යතා සහිත වූවන්ටත් කරුණා ගුණයෙන් යුතුව උදව් උපකාර කිරීමත්,

මගේ දෙපයින් නැගී සිටිමින්, මගේ අනාගත අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීමත්, මෙම ආදර්ශ පාඨයෙන් මම අදහස් කර සිටිමි.

- *මෙහිදී අනුගාමිකයාගේ සුරතට අසිපතක අකෘතියක් ලබා දෙයි. (සත්‍ය අසිපතක් අවශ්‍ය නොවේ.)*
- *අසිපත සුරතට ගත් අනුගාමිකයා, එක් දණක් නමා (හෝ සිරුවෙන් සිටිමින්), අසිපත ඔසවා, සේවයට කැපවීම සංකේතවත් කරමින් මෙසේ පවසයි...*

**අනුගාමික:** මම සේවය සඳහා ඇප කැප වෙමි.

(6) <u>**දුරවලතා සෝදැරීම සංකේතවත් කිරීම**</u>

***මා.බා.නා:*** මොහොතක් නිශ්ශබ්දව, ඔබගේ ජීවිතයේ අතීතය කරා සිත යොමු කර, ඔබ සතු සියළු අඩුපාඩුකම් හා දුර්ගුණ සිහි ගන්වන්න.

***මා.බා.නා:*** ඔබ සතු සියළු දුර්ගුණ මැකී ගොස් ඔබේ ජීවිතය සුපිරිසිදු වන බව සංකේතවත් කරමින්, මෙම පිරිසිදු ජලයෙන් ඔබේ දෑත් සෝද පවිත්‍ර කර ගන්න...

*(මේ අවස්ථාවේදී මානවකයෙකු විසින් ජල බඳුනක් යොමු කර, ඔහුගේ/ඇයගේ දෑත් සෝදා පවිත්‍ර කර ගැනීමට ඉඩ සලස්වයි.)*

(7) <u>**බාලදක්ෂ පොරොන්දුව අළුත් කිරීම**</u>

***මා.බා.නා:*** සියළු බාලදක්ෂ ප්‍රතිපත්ති වලට අනුගත වෙමින්, ළමයෙකුගේ නොව පරිණත යොවුන් වැඩිහිටියෙකුගේ මනසින් යුතුව අවබෝධ කර ගනිමින් බාලදක්ෂ පොරොන්දුව අළුත් කරන මෙන් ඔබෙන් ඉල්ලා සිටිනවා.

*මෙම අවස්ථාවේදී, මානවක බාලදක්ෂයෙකු විසින් මානවක ධජය (බාලදක්ෂ යෂ්ටියක ඇමුණූ) අනුගාමිකයාට එය ස්පර්ෂ කළ හැකි වනසේ පොළොවට සමාන්තරව තබන අතර අනුගාමිකයා විසින් එය තම වමතින් ස්පර්ෂ කරමින්ද, සුරතින්*

*බාලදක්ෂ සලකුණ දක්වමින්ද, බාලදක්ෂ පොරොන්දුව අළුත් කරයි.*

***අනුගාමික:*** *(බාලදක්ෂ පොරොන්දුව උච්චාරණය කරමින් ...)*

| |
|---|
| මාගේ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කිරීමටද,<br>සැම කල්හිම අනුන්ට උපකාර කිරීමටද,<br>බාලදක්ෂ නීතියට කීකරු වීමටද,<br>මාගේ අවංක විශ්වාසය උඩ සම්පූර්ණ උත්සාහය යෙදීමට<br>ගෞරව බහුමානයෙන් පොරොන්දු වෙමි. |

*රැස්ව සිටින සියළු දෙනා බාලදක්ෂ අර්ධාචාරයෙන් සිටී.*

***මා.බා.නා:*** පුද්ගලයෙකු වශයෙන් ඔබගේ ගෞරවය ඔබට ශුද්ධවූ දෙයක්. ඔබ ඔබගේ ගෞරවය මත ගත් පොරොන්දුව ගැන මම විශ්වාස කරනවා.

***මා.බා.නා:*** *(අතුල් පහරක් දෙමින්)*

මෙම අතුල් පහර ඔබට දැනෙන්නා සේ ඔබ ඔබගේ ගෞරවයට හෝ බාලදක්ෂ පොරොන්දුවට හානියක් සිදුවන විටකදී එය ඔබට සැණෙකින් දැනේවායි මා ප්‍රාර්ථනා කරනවා.

(8) ***<u>උර පලඳනා ප්‍රදානය කිරීම</u>***

***මා.බා.නා:*** මෙම කොළ පැහැති *උර පලඳනා* වලින් බාලදක්ෂ ව්‍යාපාරයේ සෙසු සාමාජිකයින්ගෙන් ඔබව වෙන් කොට හඳුනා ගැනීමට මෙන්ම, මානවක බාලදක්ෂයෙකු ලෙස සේවය සඳහා වන සුවිශේෂී වගකීම් නිරතුරුවම පසක් කර දෙයි

*මෙහිදී මානවක අනුග්‍රාහකයා විසින් මානවක උර පලඳනා ප්‍රදානය කරමින් මෙසේ පවසයි...*

***අනුග්‍රාහකයා:*** මගේ උණුසුම් සුභ පැතුම් පිළිගන්න! මෙම උරපටි වලින් සේවය සංකේතවත් වන්නා සේ, සේවය සඳහා ඇප කැප වන්න.
නුදුරු අනාගතයේදී මානවක බාලදක්ෂයෙකු වශයෙන් දිනා ගත හැකි විශිෂ්ඨතම ප්‍රදානය වන 'බී පී ප්‍රදානය' දිනා ගැනීමට ඔබට හැකිවේවා යයි මා ප්‍රාර්ථනා කරනවා.

*මෙම අවස්ථාවේදී මානවක අනුග්‍රාහක හා නායකයින් විසින් නව මානවක බාලදක්ෂයින්ට අතට අත දෙයි.*

**(9) <u>නව මානවක බාලදක්ෂයින් ලෙස සමාජයට පිළි ගැනීම.</u>**

***මා.බා.නා:*** අද දිවුරුම් දුන් සියළුම මානවක බාලදක්ෂයින්ට සුභ පැතුම්!

ශක්තිමත් වන්න. දිරිමත් වන්න. එකම මනසකින් හා අධිෂ්ඨාන පූර්වකව සමාජය වෙත යන්න. ඔවුන්ට සැමට සෙත සලසන්න.

*සියළුම නායකයින් මෙහිදී ඔවුන්ට ආචාර කරයි (පොදුවේ)*

*අනතුරුව, ඔවුන් මානවකයින් දෙසට ආපසු හැරී ඔවුන්ට මූණ ලා සිටියි.*

***මා.බා.නා:*** *(ඔවුන් මානවක සමාජය අමතමින්)*
මෙන්න ඔබට මානවක සහෝදරත්වයට ඇතුලත් වූ තවත් මානවක බාලදක්ෂයෙක්! සාර්ථකත්වය කරා යන ඔහුගේ/ ඇයගේ දිවි ගමනට අත හිත දෙන්න.

*නව මානවක බාලදක්ෂයින්, සෙසු මානවකයින්ට ආචාර කර (පොදුවේ) තම පර්ෂදය වෙත ගමන් කරයි.*

*පසුව මා.බා.නා ගේ විධානය පරිදි විසිර යයි.*

**(10) <u>සංග්‍රහය, විනෝද වීම උත්සවයේ නිමාව</u>**

*සූදානම් කර ඇත්නම්, සුළු සංග්‍රහයක් (අනිවාර්යය නොවේ). අමුත්තන් ඇත්නම් ඔවුන්ටද සහභාගි විය හැක.*

*සැවොම එකතු වී සුදුසු ගීත ගායනයක් කළ හැක.*
*උදා:*
*මගෙ ආගම හා රට කෙරෙහි, Bold Rovers are we', 'The Scouts Creed', 'I would be True', වැනි ගීත.*

## බාලදක්ෂ ගීතයක්  (A Scout Song)

### මගෙ ආගම හා රට කෙරෙහි

මගෙ ආගම හා රට කෙරෙහි යුතුකම් ඉටු කරමි
සැමවිට සැම හට මට හැකි සේ පිහිට වන්නෙමි
බාලදක්ෂ නීතියට කීකරු වී සිටිමි
සැමදා ///

විශ්වාසිව හා පක්ෂපාතී, කරුණා හිතෛෂි වෙමි
සැම බාලදක්ෂයෙකුට මම සොහොයුරෙකු වෙමි
දිරි බව වඩවමි සතුනට කිසිදින හිංසාවක් නොදෙමි
සැමදා ///

යහපත සලසන වැඩ සඳහා සහයෝගය පුදමි
සොම්නස් බව හා සැකසුරුවම්කම මා සිරිතට රකිමි
සිත කය වදනින් හා පැවසීමෙන් පිරිසිඳු වී සිටිමි
සැමදා ///

---

## මානවකයින් සඳහා ගීතයක්  (A Song for Rovers)

### Bold Rovers Are We…

Bold Rovers are we and happy to be together.
A shake of a hand, pledge that we stand together.
Wand’ring out in open air, finding sunshine everywhere.
We’re hitting the trail over mountain and dale together,
Happy healthy pals are we.

Though wind may blow across the see
Whate’er be our destiny
Comrades we’ll always be until our life is done.
We’ll share our laughters and our tears
We’ll share each other hopes and fears
And like three famous musketeers,
‘One for all for one.’

# මානවක අංශයේ අයැදුම්පත්
# Applications in Rover Section

## 77. මානවක සමාජයකට ඇතුළුවීමේ අයැදුම් පත *(පිටු 1)*
## Application for Admission to a Rover Crew

**R/01/ARC**

**SRI LANKA SOUT ASSOCIATION**
ROVER SCOUT SECTION
APPLICATION FOR ADMISSION TO THE ROVER CREW

DISTRICT: ............................................. ROVER CREW:................................................... Regd. No: ..............

Full Name: ................................................................................................................. *(Mr/Mrs/Miss/.......)*

Name with Initials: ................................................................... Date of Birth: ........................................

Address: .........................................................................................................................................

Mobile/WhatsApp No: ............................................... Residence Tele No: ..................................................

School/Institution: ..................................................................... Telephone No: ..........................................

Email Address: ................................................................................. National ID No: ..................................

***Family Background:***

| | Father | Mother | *Spouse (if married)* |
|---|---|---|---|
| Name | | | |
| Work Place | | | |

***Status:***

| Student | School Leaver | Vocational Trainee | Job Seeker | Self-Employed | Employed |
|---|---|---|---|---|---|
| | | | | | |

***Education:***

| GCE (O/L) | GCE (A/L) | Certification | Diploma Holder | Graduate | Other |
|---|---|---|---|---|---|
| | | | | | |

***Scouting:***

| Section | Singithi | Cub | Scout | Rover | Leader | Other |
|---|---|---|---|---|---|---|
| Group/Troop/Pack | | | | | | |
| No of Years | | | | | | |
| Highest Achievement | | | | | | |

***Talents & Skills:***

**I certify above information is true and correct.**

Applicants Signature    Parents/Guardian's Signature    Principal/Institution Head's Signature

Date: ......................... Name: ............................................... ..................................................

**FOR OFFICIAL USE**

Sign

Chairman, Crew in Council    Secretary    RSL

Name: ......................................... ......................................... ......................................... Date ....................

## 78. මානවක සාමාජිකත්ව පදක්කම සඳහා අයැදුම් පත *(පිටු 1)*
## Application for Rover Membership Badge

**Form No: R/02/RMB**

**SRI LANKA SOUT ASSOCIATION**
**ROVER SCOUT SECTION**
**APPLICATION FOR ROVER MEMBERSHIP BADGE**

1. DISTRICT: ............................................ ROVER CREW: ................................................ Regd. No: ..........
2. Full Name: ................................................................................................................ (Mr/Mrs/Miss/Ven/Rev)
3. Name with Initials: ................................................................................ Date of Birth: ...................................
4. Address: ..............................................................................................................................................
5. Mobile/WhatsApp No: ............................................ Residence Tele No: ..................................................
6. School/Institution: ............................................................................ Telephone No: ...................................
7. Email Address: .............................................................................. National ID No: ....................................
8. Joining the Crew/Recruit Date [ Y M D ] Age: [ Y M D ]

***Rover Membership Test Requirements***

1. Scout Promise and Law
2. Scout Sign and Salute
3. The Founder of Scouting
4. World Scouting
5. History of Scouting in Sri Lanka
6. National Flag & National Anthem
7. Commands, Formations and Signals
8. Safe from Harm – Level 12 (1 – 3)
9. 1-Month Service (2 Crew Meetings)

| Date | Sign by CL/RM/RSL |
|---|---|
| 1. | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5. | |
| 6 | |
| 7 | |
| 8 | |
| 9 | |

***Applicant's Declaration***

*I hereby declare that the above information is true and correct.*

*Applicant's Signature* ............................ *Date:* ............................

***Recommendation by the Crew in Council & RSL***

Approved by Crew-in-Council - Date [ Y M D ] Age: [ Y M D ]

We hereby certify that the Rover Scout ............................................................ *(Name)* has completed all requirements for the **Rover Membership Badge**.

| ............................ | ............................ | ............................ | ............................ |
|---|---|---|---|
| *Secretary, Crew-in-Council* | *Chairman, Crew in Council* | *RSL* | *Date* |
| *Name:* ............................ | ............................ | ............................ | ............................ |
| *Warrant No:* | | | |

**FOR OFFICIAL USE**

Date: ............................

Registration No: [ ] Registered Date: ............................ Cluster: ............................

RSL's Signature: ............................ Name: ............................................ Warrant No: ............................

## 79. මානවක පරමාදර්ශී පදක්කම සඳහා අයැදුම් පත *(පිටු 1)*
## Application for Rover Ideals Badge

**Form No: R/03/RIB**

**SRI LANKA SOUT ASSOCIATION**
**ROVER SCOUT SECTION**
**APPLICATION FOR ROVER IDEALS BADGE**

1. DISTRICT: .................................... ROVER CREW: ........................................ Regd. No: ..........
2. Full Name: ................................................................................................ (Mr/Mrs/Miss/Ven/Rev)
3. Name with Initials: ............................................................ Date of Birth: ..............................
4. Address: ................................................................................................................................
5. Mobile/WhatsApp No: ....................................... Residence Tele No: ......................................
6. School/Institution: ........................................................ Telephone No: ..................................
7. Email Address: ............................................................... National ID No: .............................

| | | | | |
|---|---|---|---|---|
| 8. Joining the Crew/Recruit | Date | Y M D | Age: | Y M D |
| 9. Rover Membership Badge | Date | Y M D | Age | Y M D |
| 10. Rover Advancement/Squire | Date | Y M D | Age | Y M D |

**Requirements for Rover Ideals Badge**

| | | | | |
|---|---|---|---|---|
| 1. In-depth knowledge on Scout Promise & Law | Date | Y M D | Age: | Y M D |
| 2. Fundamentals of 'Scouting for Boys' | Date | Y M D | Age | Y M D |
| 3. 'Safe from Harm' - Level 12 (4-7) | Date | Y M D | Age | Y M D |
| 4. 1-month Service (2 Crew Meetings) | Date | Y M D | Age | Y M D |

**Appointment of a Rover Sponsor**

a) Sponsor's Name [ ] Crew [ ]
b) Date Appointed [Y M D] Sponsor's Signature [ ]

**Applicant's Declaration**

*I hereby declare that the above information is true and correct.*

*Applicant's Signature* ............................ *Date:* ............................

**Recommendation of the Crew in Council & RSL**

Approved by Crew-in-Council - Date [Y M D] [Y M D]

